# පෙරදිග සංගීතය

## 7 ශ්‍රේණිය

ගුරු මාර්ගෝපදේශය

(2016 සිට ක්‍රියාත්මක වේ)



සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
ශ්‍රී ලංකාව
www.nie.lk

# පෙරදිග සංගීතය

## ගුරු මාර්ගෝපදේශය

# 7වන ශ්‍රේණිය

**(2016 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ.)**


සෞන්දර්ය දෙපාර්තමේන්තුව
භාෂා මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව

වෙබ් අඩවිය : www.nie.lk විද්‍යුත් තැපෑල : info@nie.lk



මුද්‍රණය සහ බෙදාහැරීම - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

**පෙරදිග සංගීතය**

**7වන ශ්‍රේණිය**

**ගුරු මාර්ගෝපදේශය**

**ප්‍රථම මුද්‍රණය 2015**

© ජාතික අධ්‍යාපන ආයතනය

සෞන්දර්ය දෙපාර්තමේන්තුව
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජවිද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව

**වෙබ් අඩවිය** : www.nie.lk
**විද්‍යුත් තැපැල** : info@nie.lk

*මුද්‍රණය* : **තරංජි ප්‍රින්ට්ස්**
**අංක 506, නාවින්න**
**හයිලෙවල් පාර,**
**මහරගම.**

## අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිර්දේශ කරන ලද ජාතික මට්ටමේ නිපුණතා සංවර්ධනය කිරීමේ මූලික අරමුණ සහිත ව එවකට පැවති අන්තර්ගතය පදනම් වූ අධ්‍යාපනය වෙනුවට වර්ෂ අටකින් යුතු චක්‍රයකින් සමන්විත නව නිපුණතා පාදක විෂයමාලාවෙහි පළමු අදියර, වර්ෂ 2007 දී ශ්‍රී ලංකාවේ ද්විතීයික අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දෙන ලදි.

නව විෂයමාලා චක්‍රයේ දෙවන අදියර 2016 වර්ෂයේ දී හත් වන සහ එකොළොස් වන ශ්‍රේණි සඳහා හඳුන්වා දීම කළ යුතු ව තිබේ. මේ සඳහා පර්යේෂණවලින් අනාවරණය වූ කරුණු ද අධ්‍යාපනය පිළිබඳ ව අවධානය යොමු කරන විවිධ පාර්ශවයන්ගේ යෝජනා ද පදනම් කොට ගෙන විෂය නිර්දේශ තාර්කීකරණය කිරීමේ ක්‍රියාවලියක් ජාතික අධ්‍යාපන ආයතනය විසින් හඳුන්වා දෙනු ලැබීය.

මෙම තාර්කීකරණ ක්‍රියාවලියේ දී සියලු ම විෂයයන්ගේ නිපුණතා මට්ටම්, පදනම් මට්ටමේ සිට උසස් මට්ටම දක්වා ක්‍රමානුකූල ව ගොඩ නැගීම සඳහා පහළ සිට ඉහළට ගමන් කරන සිරස් සංකලනය භාවිත කරන ලදි. විවිධ විෂයයන්හි දී එක ම විෂය කරුණු නැවත නැවත ඉදිරිපත්වීම හැකිතාක් අවම කිරීම, වැඩි බර පැටවීම්වලින් යුක්ත විෂය අන්තර්ගතයන් අඩු කිරීම, සහ ක්‍රියාත්මක කළ හැකි ශිෂ්‍ය මිතුරු විෂයමාලාවක් සැකසීම සඳහා තිරස් සංකලනය භාවිත කර ඇත.

ගුරු භවතුන් සඳහා පාඩම් සැලසුම් කිරීම, ඉගැන්වීම, ක්‍රියාකාරකම් කරගෙන යෑම, මැනීම් හා ඇගයීම් යනාදී අංශයන් සඳහා අවශ්‍ය වන්නා වූ මාර්ගෝපදේශයන් ලබාදීමේ අරමුණින් මෙම නව ගුරු මාර්ගෝපදේශය හඳුන්වා දී ඇත. පංති කාමරය තුළ දී වඩාත් ඵලදායී ගුරුවරයෙකු ලෙස කටයුතු කිරීමට මෙම මාර්ගෝපදේශයන් උපකාර වනු ඇත. සිසුන්ගේ නිපුණතාවන් වර්ධනය කිරීම සඳහා ගුණාත්මක යෙදවුම් හා ක්‍රියාකාරකම් තෝරා ගැනීමට ගුරුවරුන්ට අවශ්‍ය නිදහස මෙමගින් ලබා දී තිබේ. එමෙන් ම නිර්දේශිත පාඨ ග්‍රන්ථවල ඇතුළත් වන විෂය කරුණු පිළිබඳ ව වැඩි බර තැබීමක් මෙම ගුරු මාර්ගෝපදේශවල අන්තර්ගත නොවේ. එම නිසා මෙම ගුරු මාර්ගෝපදේශය වඩාත් ඵලදායී වීමට නම් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් සකසා ඇති අදාළ පාඨ ග්‍රන්ථ සමග සමගාමී ව භාවිත කිරීම අත්‍යවශ්‍ය වේ.

තාර්කීකරණය කරන ලද විෂය නිර්දේශ, නව ගුරු මාර්ගෝපදේශ හා අලුතින් සංවර්ධනය කර ඇති පාඨ ග්‍රන්ථවල මූලික අරමුණු වන්නේ ගුරු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවෙන් ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපන රටාවක් හා වඩාත් ක්‍රියාකාරකම් මත පදනම් වූ අධ්‍යාපන රටාවකට වෙනස්වීම මගින් වැඩ ලෝකයට අවශ්‍ය වන්නා වූ නිපුණතා හා කුසලතාවන්ගෙන් යුක්ත මානව සම්පතක් බවට ශිෂ්‍ය ප්‍රජාව සංවර්ධනය කිරීම ය.

මෙම ගුරු මාර්ගෝපදේශය සම්පාදනය කිරීමේ දී ජාතික අධ්‍යාපන ආයතනයේ ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය ද ආයතනයේ සභාව ද නන් අයුරින් දායකත්වය ලබා දුන් සියලු ම සම්පත්දායකයන් හා අනිකුත් පාර්ශවයන්ගේ ඉමහත් කැපවීම ඇගැයීමට ද මෙය අවස්ථාවක් කර ගනු කැමැත්තෙමි.

**අධ්‍යක්ෂ ජනරාල්**
**ජාතික අධ්‍යාපන ආයතනය**

## නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්තුමියගේ පණිවිඩය

ඉගෙනුම, පුළුල් ක්ෂේත්‍රයක විහිද යන්නකි. එය ජීවිත අතිමහත් බවට ද, ඉතා ම සරල බවට ද පත්කරයි. මනුෂ්‍යයා ඉගෙනුම් කුසලතාවෙන් උත්කෘෂ්ට ය. මානව සමාජ සංවර්ධනය කේන්ද්‍ර කොට ගත් රටක්, සමාජයක් බුද්ධිය විසින් හඳුනාගත් අසම්මතයන් බැහැර කිරීමට ද සුභාවිතයන් තුළින් නව ලොවක් නිර්මාණය කර ගැනීමට ද මෙවලම කරගනු ලබන්නේ ඉගෙනුමයි.

ඉගෙනුම සඳහා වටිනා යමක් ද, ඉගෙනුම් ක්‍රමවේදයන් හා පහසුකම් ද අධ්‍යාපනය වටා නිර්මාණය විය යුතු ය. විෂය මාලාව, විෂය නිර්දේශ, මාර්ගෝපදේශ, සුසාධ්‍යකරුවන් ඉගෙනුම් ක්ෂේත්‍රයට එක්වනුයේ මේ ආකාරයෙනි.

නූතන ශ්‍රී ලංකාව ගෝලීය ප්‍රවණතාවන් මෙන් ම පුරාතන උරුමයන් ද සම්මිශ්‍රණය කර ගනිමින් ස්වීය අධ්‍යාපන රටාවක් හිමි කරගෙන ඇත. කාලීන අවශ්‍යතා මත ප්‍රතිසංස්කරණයන් තුළින් වසර අටකට වරක් යාවත්කාලීන වන විෂය මාලාවේ ඉගෙනුම් සම්පතක් ලෙස මෙම ගුරු මාර්ගෝපදේශ නිර්මාණය වේ.

විෂයයෙහි අරමුණුවල සංගතතාව ජාතික මට්ටමින් පවත්වාගත යුතු ය. එහෙත් ගුරු මාර්ගෝපදේශයන්හි ඉගෙනුම් ක්‍රමවේදයන්, අකුරක්වත් වෙනස් නොකොට පිළිපැදිය යුත්තක් නම් නොවේ. විෂය නිර්දේශයෙහි නිපුණතා, නිපුණතා මට්ටම්, සාධනය වීම සඳහා විෂය අන්තර්ගතය තුළින් ඉගෙනුම් පල සම්ප්‍රාප්තිය පිණිස ඉගෙනුම් ක්‍රමවේද නිර්මාණශීලී ව වෙනස්කර ගැනීමට සුසාධ්‍යකරුවන්ට පැහැදිලිව ම ඉඩක් ඇති බව සඳහන් කරමි. ශිෂ්‍ය සාධන ප්‍රතිශතය ඉහළ මට්ටමකට ගැනීම සඳහා උදව් වන, පහසුකම් සලසන ගුරු භූමිකාවට කිසියම් ප්‍රවේශයක් සඳහා නිර්මාණය වන ගුරු මාර්ගෝපදේශ ශික්ෂකයාහට ද දෙගුරුනට ද භාවිත කළ හැක. අදාළ පෙළ පොතට සහකරුවකු වන ගුරු මාර්ගෝපදේශය තවත් පෙළ පොතක් නොවන බව දැන ගුරුභවතුන් ගුරු මාර්ගෝපදේශ හා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ සම්පාදිත අදාළ පෙළ පොත යන සම්පත් දෙක ම භාවිත කළ යුතු ය.

ඒ ඒ විෂයයන්හි සාධනය පිළිබඳ ඇගැයීම් සිදුකරන ජාතික මට්ටමේ පරීක්ෂකවරයෙකු වුව ද අපේක්ෂා කරන සාධනයන්, විෂය ඉගැන්වීමට මග පෙන්වන සුසාධ්‍යකරුවන් විසින් පාඩම අවසානයෙහි පන්ති කාමරයේ දී දරුවන් සමග ප්‍රත්‍යක්ෂකරණයට පත් විය යුතු ය. එම ඒකාත්මික වීම සඳහා වූ ප්‍රබෝධාත්මක සංස්කෘතියක් ගොඩනගා ගැනීමට ගුරු මාර්ගෝපදේශය පහුරක්, යාත්‍රාවක් කරගනු ඇතැයි ආයාචනා පූර්වක ව අපේක්ෂා කරමි.

**පීඨාධිපති, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් තුමි**
**භාෂා මානව ශාස්ත්‍ර හා සමාජවිද්‍යා පීඨය**
**ජාතික අධ්‍යාපන ආයතනය.**

# පෙරවදන

සමාජ ප්‍රගමනයෙහි ලා මහඟු මෙහෙවරක නියැලෙන්නන් අතර ගුරුවරු ප්‍රමුඛ වෙති. ස්වකීය ජීවිතය සකස් කර ගැනීම සඳහා දරුවන්ට මග පෙන්වන්නෝ ගුරුවරු ය.

2015 වර්ෂයේ සිට ක්‍රියාත්මක කෙරෙන නව විෂය නිර්දේශයට අදාළ ඉගැන්වීම් කටයුතු සාර්ථක කර ගැනීම සඳහා ගුරුවරුන්ට පහසුකම් සැපයීමේ අරමුණින් මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහ මුද්‍රණය කර බෙදා හැරීමට අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව කටයුතු කරයි. ජාතික අධ්‍යාපන ආයතනය මගින් සම්පාදිත මේ ගුරු මාර්ගෝපදේශ සංග්‍රහ, දරුවන්ට මනා ඉගෙනුම් පරිසරයක් නිර්මාණය කර දීමට අවශ්‍ය මග පෙන්වීම ගුරුවරුන් වන ඔබ වෙත ලබා දෙනු ඇතැයි යන්න මාගේ විශ්වාසය යි.

මේ ප්‍රයත්නය යථාර්ථයක් වන්නේ මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය පරිශීලනයෙන් ලබන පරිචය ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා යොදා ගැනීමට දරන උත්සාහය මත ය. ඒ සද් කාර්යය සඳහා කැප වී සිටින ඔබට මාගේ ගෞරවය පිරිනමමි.

**තිස්ස හේවාවිතාන**
අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
ඉසුරුපාය,
බත්තරමුල්ල,
2015.09.22

# හැඳින්වීම

අපේ මාතෘභූමියටත්, සංස්කෘතියටත්, සොබාදහම හා සමස්ත ජීව, අජීව විශ්ව ධාතුවටත් හිතකාමී පුරවැසියකු නිර්මාණය කිරීමේ පුළුල් ජාතික පරමාර්ථයෙන් පාසල් පද්ධතිය තුළ දරුවන්ට ඉගෙනීමට ලැබෙන සුවිශේෂතම විෂයය සෞන්දර්ය විෂයයයි. එය ජාතික අධ්‍යාපන ආයතනයේ සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව ලෙස අප විසින් හඳුනා ගන්නා ලද පහත දැක්වෙන සෞන්දර්ය විෂයයේ ජාතික දැක්ම කියැවීමෙන් ඔබට මැනවින් අවබෝධ වනු ඇත.

සෞන්දර්යයෙන් සංස්කෘතිකමය ළැදියා පුබුදුවා, එමගින් නිර්මාණශීලී බව, සංවේදීතාව, දරා ගැනීම, ශ්‍රී ලාංකේය අනන්‍යතාව හා දේශානුරාගය වඩවා මාතෘ භූමිය කෙරෙහි සංවේදී වූ දරු කැලක් හා සමාජයක් බිහි කිරීම.

(“To sensitize students and the community through Aesthetics to the Mother Land, endowed with cultural pride, creativity, Sensitivity, tolerance, partriotism and a sense of national identity”)

දේශය ගොඩනැංවීමේ දී විශ්වය සමඟ යහ සබඳතා පවත්වා ගනිමින් පෙරට යන අනාගත පුරවැසියා කෙසේ විය යුතු ද යන්න ගැඹුරින් විමසා බැලීමත් සමග මෙතෙක් පැවති සෞන්දර්ය විෂයයේ ජාතික දැක්ම අතික්‍රමණය කොට මෙම 2015 නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණය දෙස නවමු දෘෂ්ටියක් හෙළා ඇති බව එනයින්ම ඔබට පැහැදිලි වනු ඇත.

උසස් රසඥතා ඥානයකින් යුතු මානව හිතවාදී චින්තනයෙහි හෙබි ක්‍රියාශීලී සමාජානුයෝගී පුරවැසියකු ලෙස වැඩලෝකයට පිවිසීමට සෞන්දර්ය අධ්‍යාපනයෙන් ලබන ආධ්‍යාත්මික හා ශාරීරික ප්‍රබෝධය ඉවහල් කර ගැනීම අද්‍යතන සමාජ අවශ්‍යතාවකි.

සෞන්දර්ය අධ්‍යාපනයෙන් දරුවකු තුළ සොඳුරු මෙන් ම නිර්මාණශීලී හැකියාවන් හා චින්තනය ප්‍රවර්ධනය කිරීම ද විනය ගරුක, සදාචාරවත් අභිමානවත් පුරවැසියකු තැනීමේ වගකීම ඉටු කිරීම ද දෙවැනි වන්නේ ආගමෙන් මිනිසාට සැලසෙන සේවාවට පමණි.

එබැවින් විද්‍යා, ගණිත, වාණිජ, තාක්ෂණ හා භාෂා විෂයයන්ගෙන් ඥානනය වන මිනිස් සත්ත්වයාට මිනිස් ගුණ උරුම කර දෙන සෞන්දර්ය අධ්‍යාපනික විෂයයන් ඉගෙනීම එදාටත් වඩා අදට සහ හෙටට අත්‍යවශ්‍ය ම බැව් තරයේ ම කිව යුතු ව ඇත.

මෙම විෂයමාලා ප්‍රතිසංස්කරණයත් සමග අභිනවයෙන් 6 ශ්‍රේණියට පැමිණෙන දරුවන් නවමු චින්තනයක් ඇති අලුත් පරපුරක් ලෙස තැනුම උදෙසා පළමු ක්‍රියාකාරකමින්ම ස්වයං පෙලඹවීමක් ඇති වන පරිදි කැමැත්ත හා විශ්වාසය ගුරුවරයා විසින් දිනා ගත යුතු ය. ඒ සඳහා ටිබෙට් ජාතික එස්. මහින්ද හිමියන් අතින් විරචිත "ප්‍රාර්ථනාව" නම් වූ කුඩා ළමා ගීයක් දරුවාගේ ජීවන ප්‍රතිඥාවක් ලෙස දිනපතා පාඩම ඇරඹුමට පෙර ගැයුමට අපි යෝජනා කරමු.

| | | | |
|---|---|---|---|
| ස ස ස - | ස ස ස - | රි රි රි - | රි රි රි - |
| හො ඳ දේ s | හි ත මී s | හි තු දේ s | කි ය මී s |
| ස රි ස රි | ස ස රි - | රි ස රි ස | ස ස ස - |
| කි යු දේ s | ක ර මී s | ක ර මි න් | හැ දෙ මී s |

මෙම ප්‍රවේශයත් සමඟ ඇරඹෙන සෞන්දර්යයේ වින්දනාත්මක ඉගෙනුම ජාතික, සංස්කෘතික අනන්‍යතා හා විවිධ සම්ප්‍රදායයන් ස්පර්ශ කරමින් විශ්ව චින්තනයක් කරා දරුවාගේ දැනුම, හැකියා හා ආකල්ප පුළුල් කර ගැනීමට හැකි වන පරිදි විෂය කරුණු අප අධ්‍යාපනික හා මනෝ විද්‍යාත්මක පදනමින් යුතු ව ක්‍රමිකව පෙළ ගස්වා ඇත.

එහි දී නායකත්වය, සහභාගිත්වය, ඉදිරිපත් වීම, සුහදත්වය, සාමූහිකත්වය, ඇගැයීම, සවන්දීම, පිළිගැනීම, බෙදාහදා ගැනීම, අන්‍යයන්ට ගරු කිරීම ආදී ආකල්ප සෑම සිසුවකු තුළ ම වර්ධනයට අවස්ථාව සැලසෙන පරිදි අප විසින් යෝජිත ක්‍රියාකාරකම් තවදුරටත් සංවර්ධනය කරමින් ඉගෙනුම් ඉගැන්වීම් පරිසරය සකසා ගැනීමට ගුරුවරයා වශයෙන් ඔබට ද ඉඩකඩ ඇත.

තවද දෛනික ජීවිතයේ දී මුහුණ දෙන විවිධ ගැටලුවලට සාර්ථකව මුහුණ දී තර්කානුකූල ව හා නිර්මාණාත්මකව චින්තනය මෙහෙයවා ඒවා විසඳා ගැනීමට අවශ්‍ය පුද්ගල ශක්‍යතා වර්ධනය කිරීමට ද අප විසින් වත්මන් පරපුරට දායකත්වය සැපයිය යුතු ව ඇත.

එබැවින් ගුරු භවතුන් ලෙස ඔබ මෙම ගුරු මාර්ගෝපදේශය පෙරට වඩා හොඳින් පරිශීලනය කරන්නේ නම් ඔබගේ ද චින්තනයට අලුත් ආලෝකයක් හා ප්‍රබෝධයක් ලැබෙනු ඇත. ඒ ආලෝක කිරණ ජාතියේ දරු කැල මත පතිතව ඔවුන් ද ඉමහත් ප්‍රබෝධයෙන් මෙම විෂයය ඉගෙනීමට යොමු වනු නො අනුමානය.

එසේ ම කායික හා මානසික සමබරතාවෙන් හෙබි සෞඛ්‍ය සම්පන්න මෙන් ම නීරෝගී දිවිපෙවතක් ගත කිරීමට අවශ්‍ය පුද්ගල ශක්‍යතා සංවර්ධනය කිරීම හා යහපත් අන්තර් පුද්ගල සම්බන්ධතා ගොඩනංවා ගනිමින් ජාතික හා ජාත්‍යන්තර තලයේ නොසැලී කටයුතු කිරීමට විචාරශීලී මනසකින් හෙබි පුද්ගලයකු බිහි කිරීමට වගවීම සෞන්දර්ය අධ්‍යාපන විෂය භාර ව කටයුතු කරන ඔබ අප සැමගේ වගකීම වේ.

ඒ සඳහා 2015 වසරේ සිට 6 ශ්‍රේණියෙන් ඇරඹී ක්‍රියාත්මක වන මෙම නව ප්‍රතිසංස්කරණය දරුවන් හරහා අපි සැම නවමු ලොවකට පිවිසීමේ වැදගත් අවස්ථාවක් ලෙස දකිමින් උද්යෝගයෙන් හා කැපවීමෙන් වඩාත් ඵලදායි සේවාවක් සැලසීමට කැප වෙමු.

**අධ්‍යක්ෂ (සෞන්දර්ය)**
**ජාතික අධ්‍යාපන ආයතනය**

## විෂයමාලා කමිටුව

| | |
|---|---|
| **උපදේශකත්වය හා අනුමැතිය** | ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය,<br>ජාතික අධ්‍යාපන ආයතනය |
| **විෂය සම්බන්ධීකරණය** | ජානකී පතිරණගේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,<br>සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව |

**ලේඛක මණ්ඩලය**

**බාහිර සම්පත් දායකත්වය**

| | |
|---|---|
| ඩබ්. වී. ජී. විතානගේ | අතිරේක කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ,<br>කලාප අධ්‍යාපන කාර්යාලය, රතනපුර. |
| කපිල මැද්දෙගොඩ | කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂ,<br>කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය, පානදුර. |
| කේ. කේ. එස්. ජයවික්‍රම | සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (විශ්‍රාමික),<br>කලාප අධ්‍යාපන කාර්යාලය, පිළියන්දල. |
| ශාන්තා රමණි ඩයස් | ගුරු උපදේශක, කලාප අධ්‍යාපන කාර්යාලය, ගම්පහ |
| ආර්. ඩී. පෙරේරා | ගුරු උපදේශක, කලාප අධ්‍යාපන කාර්යාලය, මහනුවර. |
| ඊ. ඒ. ප්‍රේමසිරි | ගුරු උපදේශක, කලාප අධ්‍යාපන කාර්යාලය, කළුතර. |
| කපිල වීරසිංහ | ගුරු උපදේශක, කලාප අධ්‍යාපන කාර්යාලය, කෑගල්ල. |
| රංජිත් ප්‍රියන්ත සිල්වා | ගුරු සේවය, ජනාධිපති විද්‍යාලය, මීනුවන්ගොඩ. |

**අභ්‍යන්තර සම්පත් දායකත්වය**

| | |
|---|---|
| සුදත් සමරසිංහ | අධ්‍යක්ෂ, සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව. |
| ජානකී පතිරණගේ | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,<br>සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව. |

**භාෂා සංස්කරණය**

| | |
|---|---|
| අමරසිරි වික්‍රමරත්න | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,<br>භාෂා අධ්‍යයනාංශය<br>අග්නිදිග විශ්ව විද්‍යාලය, ඔළුවිල්, අඩ්ඩාලච්චේන. |

| | |
|---|---|
| **පරිගණක යතුරු ලියනය** | ඩබ්ලිව්. එම්. ධම්මිකා |
| **පිටකවර නිර්මාණය** | රවීන්ද්‍ර තේනුවර |
| **විවිධ සහය** | ඊ. එම්. වික්‍රමනායක<br>ප්‍රේමරත්න පෙරේරා |

## ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස්

සෞන්දර්ය අධ්‍යාපනය යටතේ පෙරදිග සංගීතය විෂයයක් වශයෙන් හැදෑරීමෙන් දරුවාට පාසල් ජීවිතය තුළ පමණක් නොව පසු කාලීනව ද තම ජීවිත පැවැත්ම සඳහා අවශ්‍ය වන සංවේදී අධ්‍යාත්මයක් හා නිපුණතා වර්ධනය කර ගැනීමට හැකි වනු ඇත. උක්ත කරුණු සාක්ෂාත් කර ගැනීම සඳහා මෙවර ප්‍රධාන නිපුණතා 9ක් හඳුන්වා දී ඇති අතර එම නිපුණතා කරා ළඟා වීමට අත්‍යවශ්‍ය නිපුණතා මට්ටම් පෙළක් ද හඳුන්වා දී ඇත. එම නිපුණතා මට්ටම්වල ඉහළ නිපුණතා මට්ටම් කරා සිසුවා ළඟා කරවීම 11වන ශ්‍රේණියේ දී අපේක්ෂිත ය.

මෙම නව විෂය නිර්දේශය සැකසීමේ දී, පෙරදිග සංගීත ප්‍රායෝගික පරීක්ෂණ මණ්ඩලවලින් ලබා ගත් දත්ත, ජාතික මට්ටමේ විභාග පරීක්ෂකවරුන්ගේ වාර්තා ඇසුරෙන් සිසුන් තුළ විශේෂයෙන් සංවර්ධනය විය යුතු විෂය කොටස් පිළිබඳ තොරතුරු පාදක කර ගන්නා ලදි. එසේ ම පළාත් බද ස්වාස්ථ අධ්‍යයන සැසි, විෂය නිර්දේශ ක්‍රියාත්මක කිරීම පිළිබඳ පාසල් නියාමන පර්යේෂණ වාර්තා, කලාප මට්ටමෙන් පවත්වන ලද කාර්ය බද්ධ පරීක්ෂණ දත්ත, විශ්වවිද්‍යාල කථිකාචාර්යවරුන්ගේ හා විද්‍යාර්ථීන්ගේ අදහස්, රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයන්හි තූර්ය වාදක කණ්ඩායම්වල අදහස්, සංගීත විෂය හදාරන ලද විද්වතුන්ගේ අදහස්, විද්‍යුත් මාධ්‍යයන්හි විකාශය වූ සාකච්ඡා හා වැඩසටහන් ඇසුරෙන් ලබා ගත් තොරතුරු මෙන් ම පාසල් පද්ධතියේ පෙරදිග සංගීත විෂය ඉගැන්වීම් කරන ගුරුභවතුන්ගේ හා දෙමව්පියන්ගේ අදහස් ද විෂය නිර්දේශ සම්පාදනයේ දී විශේෂයෙන් අවධානයට ලක් කරන ලදි.

විෂය නිර්දේශය ප්‍රායෝගික නැඹුරුතාවයකින් යුතු ව ගොඩ නගා ඇති අතර ක්‍රියාකාරකම් සඳහා හඳුන්වා දී ඇති ගුණාත්මක යෙදවුම් හැකිතාක් යොදා ගනිමින් පාඩම සංවර්ධනය කිරීම ගුරුභවතාගේ වගකීමයි. පාසල පදනම් කරගත් ඇගයීම් වැඩපිළිවෙළ යටතේ හඳුන්වා දී ඇති නිදර්ශක ඇගයීම් උපකරණ ග්‍රන්ථය ඇසුරු කර ගනිමින් දරුවන්ගේ ඇගයීම ක්‍රියාවලිය සාර්ථක කර ගැනීමට ඔබට සක්‍රියව දායක වීමට සිදු වේ. එසේ ම ප්‍රායෝගික පරීක්ෂණයට පෙනීසිටීමට සුදුසු වන ආකාරයට ඉතා දක්ෂ ලෙස ප්‍රායෝගික කොටස්වල නිපුණත්වයට දරුවා ළඟා කරවීම ද, පෙළඹවීම ද ගුරුභවතාගේ වගකීම වේ.

ක්‍රියාකාරකම් සැලසුම් කිරීමේ දී හඳුන්වා දී ඇති ප්‍රවේශවලට අමතර ව වෙනත් සුදුසු ක්‍රමවේද නිර්මාණශීලීව යොදා ගැනීමේ හැකියාව හා නිදහස ඔබට ඇත. ක්‍රියාකාරකමෙහි දක්වා ඇති ඉගෙනුම් පල ළඟා කර ගත හැකි වන අයුරින් වඩාත් ඵලදායි ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියක් සැලසුම් කර ගැනීම තුළින් සාර්ථක ඉගැන්වීම් ක්‍රියාවලියක නිරත වීමට ඔබට හැකි වනු ඇත.

# පටුන

| | පිටුව |
|---|---|
| අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය | iii |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්හිමිගේ පණිවිඩය | iv |
| පෙරවදන | v |
| හැඳින්වීම | vi-vii |
| විෂයමාලා කමිටුව | viii |
| ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස් | ix |
| විෂය නිර්දේශයේ අන්තර්ගතය | xii-xv |
| වාර සටහන | xvi-xvii |
| ක්‍රියාකාරකම් සන්තතිය | 01-64 |

# 7 ශ්‍රේණිය - විෂය නිර්දේශය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 1.0 සංගීතයේ මුලිකාංග, ශිල්පාංග සහ සිද්ධාන්ත හඳුනා ගනිමින් ගායන /වාදන ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි. | 1.1 ස්වර ප්‍රභේද හඳුනා ගනිමින් අභ්‍යාස ගායනය/වාදනය කරයි.<br><br>1.2 තාලය සහ ලය පිළිබඳ දක්ෂතා ප්‍රදර්ශනය කරයි. | • ත්‍රිවිධ සප්තක<br>• ස්වර ප්‍රභේද<br>• ස්වර සප්තකය ගායනය<br>• ශුද්ධ ස්වර අභ්‍යාස<br>• කෝමළ ග නි සහිත ස්වර අභ්‍යාස<br>• ශුද්ධ සහ කෝමළ ස්වර ස්ථාපන ගීත ඇසුරින් ස්වර අභ්‍යාස<br>• තාලය සංකල්පය<br>• ලය සංකල්පය<br>• මාත්‍රා 2, 3, 4 තාලයන්ට බෙදෙන ගී පද<br>• තනි තිතේ තාල පද අධ්‍යයනය කරයි. | 1. සංගීතයේ විවිධ ස්වර වෙන් කොට දක්වයි.<br>2. විවිධ ස්වර භාවිත කරමින් ස්වර අභ්‍යාසයේ යෙදෙයි.<br><br>1. තාලය සහ ලය සංකල්පය පැහැදිලි කරයි.<br>2. මූලික තාල රූප මත ගොඩ නැගුණු තාල පද අධ්‍යයනය කරයි. | 20 |
| 2.0 වාද්‍ය භාණ්ඩයන්හි ස්වරූපය වටහා ගනිමින් වාදන හැකියා ප්‍රදර්ශනය කරයි. | 2.1 ස්වර පුවරු සංගීත භාණ්ඩ මගින් ක්‍රීඩාමය අත්දැකීම් ලබයි. වාදන කුසලතා වර්ධනය කර ගනියි.<br><br>2.2 සම්භාව්‍ය සංගීත භාණ්ඩ වාදනයේ මූලික හැකියා වර්ධනය කර ගනියි. | • (මෙලෝඩිකා, ග්ලොකන් ස්පීල්, විද්‍යුත් ස්වර පුවරුව,මවුත් ඕගන් (හාර්මෝනිකා) රෙකෝඩර් ෆ්ලූට් හාර්මෝර්නියම් වැනි නිශ්චිත ව ස්වර පිහිටුවා ඇති භාණ්ඩ මගින් රිද්මයානුකූල ස්වර රටා වාදනය)<br>• තෝරාගත් භාණ්ඩයේ ස්වභාවය, ස්වර පිහිටීම හා වාදනය<br>• කැමති භාණ්ඩයකින් නිර්දේශිත ගීත/ගීතයක් වාදනය<br>• තාලානුකූල ස්වර අභ්‍යාස වාදනය | 1. සරල සංගීත භාණ්ඩයක් මගින් වාදන හුරුව ලබයි.<br><br>2. සම්ප්‍රදායික සම්භාව්‍ය සංගීත භාණ්ඩයක මූලික හුරුව ලබයි. | 23 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 3.0 සංගීත රසාස්වාදයේ යෙදෙමින් ජීවිතයේ සතුට හා බැඳි මානසික තත්ත්වයන් ළඟා කර ගැනීමට හුරුවෙයි. | 3.1 ගී අනුවාදන ශ්‍රවණය කරයි. | • තෝරාගත් භාණ්ඩයක ගී අනුවාදන සහ ඒවායේ ස්වභාවය | 1. සරල ගී අනුවාදනයක යෙදෙයි. | |
| | 3.2 ගීතයේ ප්‍රබලතාවය සාකච්ඡා කරමින් රසවිඳියි. | • උපදේශාත්මක ගීත රසාස්වාදය සහ ගායනය (නොමඟ නොයන් පුතේ, අහන්න මගෙ හොඳ පුංචි පුතේ, දූ පුතුනේ රට අපේ ය, කරුණාව සමග, දැඩිකළ මාතා, මව්පියො ආදී, හිතන්නකෝ අයියේ යන ගීවලින් දෙකක්) | 2. උපදේශාත්මක ගීත ගයමින් රස විඳියි. | |
| | 3.3 ලබාගත් සංගීතමය අත්දැකීම් ප්‍රාසාංගිකව ඉදිරිපත් කරමින් සතුට ලබයි. | • වාර්ෂික විවිධ ප්‍රසංගය | 3. මෙතෙක් උගත් සංගීතමය අත්දැකීම් ප්‍රාසංගික ව ඉදිරිපත් කරයි. | 11 |
| 4.0 දේශීය ජන සංගීතාංග පිළිබඳ ප්‍රායෝගික හැකියා වර්ධනය කර ගනිමින් සංස්කෘතික උරුමයන් රැක ගනියි. | 4.1 ගැමි ගී පිළිබඳ සංස්කෘතික තොරතුරු විමසා ගායනය කරයි. | • දරු නැළවිලි ගී<br>• රබන් ගී<br>• දැල් ගී<br>• ඉහත දැක්වෙන ගීත පිළිබඳ තොරතුරු හා ගායනය | 1. දරු නැළවිලි ගී, රබන් ගී සහ දැල් ගී පිළිබඳ සංස්කෘතිකමය තොරතුරු ඉදිරිපත් කරයි.<br>2. එම ගීත ගායනය කරමින් අගය කරයි. | 06 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 5.0 සරල සංගීතය හා බැඳි සංගීතාංග පිළිබඳ අත්දැකීම් ලබයි. | 5.1 දේශාභිමානී ගීත ගායන/වාදන අභ්‍යාසයේ යෙදෙයි.<br>5.2 විද්‍යුත් මාධ්‍යයන්හි ප්‍රචලිත ළමා ගීත ගායන/වාදන අභ්‍යාසයේ යෙදෙයි. | • රත්නදීප ජන්මභූමි, ලෝකෙන් උතුම් රට, දකුණ නැගෙනහිර, ලංකා ලංකා යන ගීත අතරින් එකක්<br>• (කටු අකුලේ මල් ඇහැරේ, අම්ම මාව දොයි කරන්න හදපු හැටි) | 1. ප්‍රචලිත දේශාභිමානී ගීත ගායන හැකියාව ප්‍රදර්ශනය කරයි.<br>2. ප්‍රචලිත ළමා ගීත ගායන හැකියාව ප්‍රදර්ශනය කරයි. | 02<br>02 |
| 6.0 රංග සම්ප්‍රදායන්හි විශේෂතා අධ්‍යයනය කරමින් සංගීතමය ලක්ෂණ පිළිබඳ ප්‍රායෝගික අත්දැකීම් ලබයි. | 6.1 ගැමි නාටක ගී ගයමින් අගය කරයි.<br>6.2 නූර්ති ගී ගායනය කරයි. | • කෝළම් ගායනා හා සරලව රංගනය<br>• අඹ දඹ නාරං<br>• දන්න වංහුං අප<br>• දම්වැසි වස්සන | 1. කෝලම් ගීත ගයමින් රංගනයේ යෙදෙයි.<br>2. ප්‍රචලිත නූර්ති ගීත ගයමින් රස විඳියි. | 05 |
| 7.0 සංගීත නිර්මාණ කාර්යයයේ අත්හදා බැලීම් කරයි. | 7.1 ගීයක සංගීත නිර්මාණයේ දී පද මාලාවේ වැදගත්කම වටහා ගනී. | • පද නිර්මාණය<br>• ගීත නිර්මාණය | 1. ගී පද නිර්මාණය කරයි. | 04 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 8.0 සංකේතානුසාරයෙන් සංගීතය ලියා දක්වන විධි හඳුනා ගනිමින් විශ්ව සංගීත කෘති ඇසුරු කිරීමටත් දේශීය සංගීතාංග ලෝකය වෙත යොමු කිරීමටත් අත්‍යවශ්‍ය මූලික නිපුණතා වර්ධනය කර ගනියි. | 8.1 පෙරදිග ප්‍රස්තාරකරණයේ සුවිශේෂතා දක්වයි. | • අධ්‍යයනය කළ ස්වර ස්ථාපන ගීත ප්‍රස්තාරකරණය<br>• ප්‍රස්තාරකරණයේ විශේෂිත අවස්ථා (සමග්‍රහ, අවග්‍රහ, විෂමග්‍රහ) | 1. ප්‍රස්තාර කිරීමේදී විශේෂ ක්‍රම අනුගමනය කරමින් ස්වර ස්ථාපන ගීත ප්‍රස්තාර කරයි. | 05 |
| 9.0 සංගීතයේ තාක්ෂණික මෙවළම් සහ භෞතික විද්‍යාත්මක පදනම අධ්‍යයනය කර ප්‍රසංගාත්මක හැකියා වඩාත් සාර්ථක ලෙස ඉදිරිපත් කරයි. | -------------------------- | | ---------------------------------------- | --<br>- |

## 7 ශ්‍රේණිය - පෙරදිග සංගීතය

## වාර සටහන.

| | | | |
|---|---|---|---|
| | *පළමු වාරය* | | |
| නිපුණතා මට්ටම | අනුක්‍රමික පාඩම් අංකය | විෂය මාතෘකාව / ක්‍රියාකාරකම | කාල ඡේද |
| 1.1 ස්වර ප්‍රභේද හඳුනාගනිමින් අභ්‍යාස ගායනය/වාදනය කරයි. | 01<br>02<br>03<br>04<br>05 | • ත්‍රිවිධ ස්වර සප්තක<br>• ස්වර ස්වර ප්‍රභේද<br>• ශුද්ධ ස්වර සප්තකය ගායනය<br>• ශුද්ධ ස්වර අභ්‍යාස.<br>• ශුද්ධ ස්වරස්ථාපන ගීත ඇසුරින් ස්වර අභ්‍යාස | 03<br>02<br>02<br>02<br>02 |
| 8'1 පෙරදිග ප්‍රස්තාර කරණයේ විශේෂතා දක්වයි. | 06 | • wOHhkh l< ijar iadmk .S mP/ad l r ණය' | 02 |
| 1.2. තාලය සහ ලය පිළිබඳ දක්ෂතා ප්‍රදර්ශනය කරයි.<br><br><br><br>5.1 දේශාභිමානී ගීත ගායන/වාදන අභ්‍යාසයේ යෙදෙයි. | 07<br>08<br>09<br><br>10<br>11 | • තාලය සංකල්පය.<br>• ලය සංකල්පය.<br>• මාත්‍රා 2,3,4, බැගින් වූ තාලයන්ට බෙදෙන ගී පද.<br>• තනිතිතේ තාල පද.<br>• රත්නදීප, ලෝකෙන් උතුම් රට, දකුණ නැගෙනහිර, ලංකා ලංකා, මේ උදාර ලංක භූමියයි යන ගීත අතරින් ගීත 2ක් | 02<br>02<br><br>01<br>01<br><br><br>02 |
| 6.2 නූර්ති ගී ගායනය කරයි. | 12 | • අඹ, දඹ, නාරං ගීතය ගායනය. | 01 |
| | *දෙවන වාරය* | | |
| 3.2. ගීතයේ ප්‍රබලතාවය සාකච්ඡා කරමින් රසවිඳියි. | 13 | • උපදේශාත්මක ගීත රසාස්වාදය සහ ගායනය. | 02 |
| 1.1 ස්වර ප්‍රභේද හඳුනාගනිමින් අභ්‍යාස ගායනය/වාදනය කරයි.<br><br>2.1 ස්වර පුවරු සංගීත භාණ්ඩ මගින් ක්‍රීඩාමය අත්දැකීම් ලබයි. වාදන කුසලතා වර්ධනය කර ගනියි. | 14<br><br>15<br>16 | • කෝමළ ස්වරස්ථාපන ගීත ඇසුරින් ස්වර අභ්‍යාස<br>• කෝමළ ගනි සහිත ස්වර අභ්‍යාස<br>• මෙලෝඩිකා, ග්ලෝකන් ස්පීල්, විද්‍යුත්ඕගන්, මවුත්ඕගන්, (හාර්මෝනිකා) රෙකෝඩර් ෆ්ලූට්, හාර්මෝනියම් වැනි නිශ්චිතව ස්වර පිහිටුවා ඇති භාණ්ඩ මගින් ස්වර රටා වාදනය. | <br>02<br>01<br><br><br><br><br>03 |
| 3.1 ගී අනුවාදන ශ්‍රවණය කරයි. | 17 | • තෝරාගත් භාණ්ඩයක ගී අනුවාදන සහ ඒවායේ ස්වභාවය. | 01 |
| 2.2සම්භාව්‍ය සංගීත භාණ්ඩ වාදනයේ මූලික හැකියා වර්ධනය කර ගනියි.<br><br><br>8'1 පෙරදිග ප්‍රස්තාර කරණයේ විශේෂතා දක්වයි.<br>6.2 නූර්ති ගී ගායනය කරයි.<br><br>6.1 ගැමිනාටක ගී ගයමින් අගය කරයි.<br>5.2 විද්‍යුත් මාධ්‍යයන්හි ප්‍රචලිත ළමාගීත ගායන/වාදන අභ්‍යාසයේ යෙදෙයි.<br>4.1 ගැමි ගී පිළිබඳ සංස්කෘතික තොරතුරු විමසා ගායනය කරයි. | 18<br><br>19<br>20<br>21<br><br>22<br><br>23<br>24<br><br><br>25<br>26<br>27 | • තෝරාගත් භාණ්ඩයේ ස්වභාවය, ස්වර පිහිටීම<br>• තාලානුකූල ස්වර අභ්‍යාස<br>• තෝරාගත් භාණ්ඩයේ වාදනය .<br>• ප්‍රස්තාරකරණයේ විශේෂිත් අවස්ථා (සමග්‍රහ, විෂමග්‍රහ, අවග්‍රහ)<br>• දන්න වංහුං අප ගීතය ගායනය.<br>• කෝළම් ගී ගායනය සරලව රංගනය සමග<br>• කටු අකුලේ මල් ඇහැරේ.<br>• දරු නැලවිලි ගී.<br>• රබන් ගී.<br>• දරුනැලවිලි ගී, සහ රබන්ගී, පිළිබඳ තොරතුරු | 01<br><br>02<br>03<br><br>03<br>01<br><br>02<br>01<br><br><br>02<br>02<br><br>01 |
| 7.1 ගීයක සංගීත නිර්මාණයේ දී පද මාලාවේ වැදගත්කම වටහා ගනියි. | 28 | • පද නිර්මාණය. | 02 |

## තෙවන වාරය

| | | | |
|---|---|---|---|
| 5.2 විද්‍යුත් මාධ්‍යයන්හි ප්‍රචලිත ළමාගීත ගායන/වාදන අභ්‍යාසයේ යෙදෙයි. | 29 | • ළමා ගීතයේ අගය සහ ගීතයේ ප්‍රබලතාවය | 01 |
| 3.2. ගීතයේ ප්‍රබලතාවය සාකච්ඡා කරමින් රසවිඳියි. | 30 | • උපදේශාත්මක ගීත රසාස්වාදය සහ ගායනය. | 02 |
| 6.2 නූර්ති ගී ගායනය කරයි. | 31 | • දම්වැසි වස්සන ගීතය ගායනය. | 02 |
| 2.1 ස්වර පුවරු සංගීත භාණ්ඩ මගින් ක්‍රීඩාමය අත්දැකීම් ලබයි. වාදන කුසලතා වර්ධනය කර ගනියි. | 32 | • මෙලෝඩිකා, ග්ලොකන් ස්පීල්, විද්‍යුත්ඕගන්, මවුත්ඕගන්, (හාර්මෝනිකා) රෙකෝඩර් ෆ්ලූට්, හාර්මෝනියම් වැනි නිශ්චිතව ස්වර පිහිටුවා ඇති භාණ්ඩ මගින් ස්වර රටා වාදනය. | 03 |
| 2.2සම්භාව්‍ය සංගීත භාණ්ඩ වාදනයේ මූලික හැකියා වර්ධනය කර ගනියි. | 33 | • තාලානුකූල ස්වර අභ්‍යාස | 03 |
| | 34 | • කැමති භාණ්ඩයකින් නිර්දේශිත ගීතයක් වාදනය. | 06 |
| 4.1 ගැමි ගී පිළිබඳ සංස්කෘතික තොරතුරු විමසා ගායනය කරයි. | 35 | • දූල් ගී ගායනය සහ දූල් ගී පිළිබඳ තොරතුරු | 02 |
| 7.1 ගීයක සංගීත නිර්මාණයේ දී පද මාලාවේ වැදගත්කම වටහා ගනියි. | 36 | • ගීත නිර්මාණය. | 02 |
| 3.3 ලබා ගත් සංගීතමය අත්දැකීම් ප්‍රාසාංගිකව ඉදිරිපත් කරමින් සතුට ලබයි. | 37 | • වාර්ෂික විවිධ ප්‍රසංගය. | 06 |

මුළු කාලඡේද සංඛ්‍යාව 78

# ත්‍රිවිධ සප්තක

**නිපුණතාව 1.0** : සංගීතයේ මූලිකාංග, ශිල්පාංග හා සිද්ධාන්ත හඳුනා ගනිමින් ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 1.1** : ස්වර ප්‍රභේද හඳුනා ගනිමින් අභ්‍යාස ගායනය/වාදනය කරයි.

**ක්‍රියාකාරකම** : ත්‍රිවිධ සප්තක

**කාලච්ඡේද** : 03

**ඉගෙනුම් පල** :

- සප්තක තුන පිළිබඳ දැනුම ලබා ගනියි.
- ශුද්ධ ස්වර ගායන කුසලතාවය ලබයි.
- මධ්‍ය ස්වර සප්තකය ආරෝහණ අවරෝහණ වශයෙන් ගයයි.
- ශුද්ධ ස්වර අන්තර වටහා ගනියි.
- උච්ච මන්ද්‍ර ස්වර සප්තක තුළ තමාට ගායනය කළ හැකි ස්වර ප්‍රමාණය අවබෝධ කර ගනියි.

**ගුණාත්මක යෙදවුම්:**

- ස්වර පුවරුවේ රූප සටහනක සප්තක තුන ලකුණු කරන ලද දෘශ්‍ය උපකරණයක්
- ස්වර පුවරු භාණ්ඩයක්

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

මධ්‍ය සප්තකය පිළිබඳ සිසුන්ට අවබෝධ කිරීමෙන් පසුව උච්ච හා මන්ද්‍ර ස්වර සප්තක පිළිබඳ ව අවබෝධය ලබා දීම වඩා වැදගත් ය. පළමු කාලච්ඡේදය මධ්‍ය සප්තකයේ ස්වර පිළිබඳවත්, එම ස්වර ශ්‍රවණය කිරීමෙන් ප්‍රායෝගිකව භාවිත කිරීමේ හැකියාව ඇති කිරීම සඳහාත් යොදා ගත හැකි ය. ඒ අනුව දෙවන තුන්වන කාලච්ඡේද ඉතිරි සප්තක දෙක සඳහා යොදා ගන්න.

ශුද්ධ ස්වර සප්තකය අධ්‍යයනයෙන් පසු මන්ද්‍ර ස්වර සප්තකය හා එය ලකුණු කිරීම පිළිබඳවත්, ඉන්පසු උච්ච ස්වර සප්තකය හා එය ලකුණු කිරීම පිළිබඳවත් මෙහි දැක්වෙන ආකාරයට තවත් කාලච්ඡේද දෙකක් සඳහා ඔබ විසින් ක්‍රියාකාරකම් සැලසුම් කර ගන්න. එම සප්තක දෙක අධ්‍යයනය කරන කාලච්ඡේද දෙක තුළ දී සිසුන්ට ගායනය කළ හැකි පහළම ස්වරයත්, ඉහළම ස්වරයත් හඳුනා ගැනීමට උපකාරී වන ක්‍රියාකාරකම් සහ අභ්‍යාස ද එක් කර ගන්න.

- පළමු කාලච්ඡේදය මධ්‍ය සප්තකය අවබෝධ කරවීම සඳහා පහත දැක්වෙන පියවර අනුගමනය කරන්න. 2 වන හා 3 වන කාලච්ඡේද සඳහා මෙහි දැක්වෙන පියවර නිදසුනට ගනිමින් ඔබ විසින් පාඩම් සැලසුම් සකසා ගන්න.
- 2 වන කාලච්ඡේදයේ දී මන්ද්‍ර පංචමය දක්වා ස්වර ද, 3 වන කාලච්ඡේදයේ දී උච්ච ගාන්ධාරය දක්වා ද, ස්වර පුහුණුව සඳහා යොදා ගත හැකි ය.

**පාඩම සංවර්ධනය :**

**පියවර 01**
- ගුරුවරයා විසින් වාදනය ද සමග ශුද්ධ ස්වර සහිත මධ්‍ය ස්වර සප්තකය ගායනය කර පෙන්වන්න. ස්වර අතර ඇති අන්තරයන් වටහා දෙන්න. එකිනෙක ස්වර අතර උස් පහත් භාවය පිළිබඳ අදහස් දක්වන්න.
(මිනිත්තු 05)

**පියවර 02**
- දෘශ්‍ය උපකරණය මගින් මධ්‍ය ස්වර සප්තකය පැහැදිලි කරන්න. ස්වර පුවරුවේ රූප සටහනක් මත මධ්‍ය ස්වර සප්තකය ලකුණු කරවන්න. සර්පිනාවක් හෝ ස්වර පුවරු භාණ්ඩයක් මගින් මධ්‍ය සප්තකය වාදනය කර පෙන්වන්න. මධ්‍ය සප්තකයේ ස්වර නැවත නැවත ගායනයේ යොදවන්න. ස්වර සප්තක ලිවීමේ දී තිතක් භාවිත කිරීම පිළිබඳ ව පැහැදිලි කරන්න.
(මිනිත්තු 20)

**පියවර 03**
- කණ්ඩායම් වශයෙන් හෝ කේවලව මධ්‍ය සප්තකය ගායනයට සලස්වන්න.
- ස්වර සප්තකය නියමිත නාද ස්ථාන අනුව ගායනයට යොමු කරන්න.
(මිනිත්තු 10)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- වඩාත් නිවැරදි ව ගායනය කරන සිසුන් පන්තිය ඉදිරියට කැඳවා ස්වර සප්තකය ගායනයට සලස්වා අගය කරන්න.
- ස්වර ඉහළ පහළ භාවය මතුවන පරිදි ශිෂ්‍යයාගේ අභිමතය පරිදි වෙනත් රූප සටහනක් නිර්මාණය කරමින් ස්වර සප්තකය ලකුණු කරවන්න.
(මිනිත්තු 05)

**පසු අභ්‍යාස :** ස්වර පුවරු භාණ්ඩයකින් මධ්‍ය ස්වර සප්තකය වාදනය පුහුණු වීමට මග පෙන්වන්න.

**අතිරේක උදව් :** 2008 - 7 ශ්‍රේණිය ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ පිටු අංක 20 සිට 24 දක්වා කියවන්න.

# ස්වර ප්‍රභේද

**නිපුණතාව 1.0** : සංගීතයේ මූලිකාංග ශිල්පාංග හඳුනා ගනිමින් ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 1.1** : ස්වර ප්‍රභේද හඳුනා ගනිමින් අභ්‍යාස ගායනය/වාදනය කරයි.

**ක්‍රියාකාරකම** : ස්වර ප්‍රභේද

**කාලච්ඡේද** : 02

**ඉගෙනුම් පල** :
- ස්වර ප්‍රභේද පිළිබඳ දැනුම ලබා ගනියි.
- කෝමල, තීව්‍ර වශයෙන් ස්වර ඇතුළත් වන අයුරු වටහා ගනියි.
- ශුද්ධ, කෝමල හා තීව්‍ර ස්වර, ප්‍රකෘති සහ විකෘති වශයෙන් වර්ග කරයි.
- කෝමල තීව්‍ර ස්වර ශුද්ධ ස්වර අතර පිහිටන අයුරු වටහා ගනියි.
- ශුද්ධ ස්වර සමග කෝමල තීව්‍ර ස්වර ගායනයට උත්සාහ ගනියි.

**ගුණාත්මක යෙදවුම්** :
- ස්වර පුවරුවේ රූප සටහනක් මගින් කෝමල තීව්‍ර ස්වර ලකුණු කරන ලද දෘශ්‍ය උපකරණයක්
- ස්වර පුවරු භාණ්ඩයක්

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස්** :

සප්තක පිළිබඳ සිසුන්ට අවබෝධ කිරීමෙන් පසු එක් එක් සප්තකය තුළ ඇතුළත් වන ප්‍රකෘති විකෘති ස්වර හඳුනා ගැනීමට උපකාර කිරීම මෙම ක්‍රියාකාරකමින් අපේක්ෂිතය. පළමු කාලච්ඡේදයේ දී ස්වර 7 ක් වන සප්තකය තුළ ස්වර 12 ක් පිහිටන අයුරු දැක්වීමට හා ඒවා නම් කිරීමටත්, දෙවන කාලච්ඡේදය අපරදිග සංගීතය අනුව එම කෝමල හා තීව්‍ර ස්වර නම් කිරීමටත් යොදා ගත හැකිය.

පාඩම සංවර්ධනය :

පියවර 01
- වාදනය ද සමග ශුද්ධ ස්වර පමණක් ඇතුළත් ගීතයක් සහ කෝමල ස්වර ඇතුළත් ගීතයක් වශයෙන් ගීත දෙකක් ගායනය කර පෙන්වන්න. එම ගීත දෙක අතර වෙනස සාකච්ඡා කරන්න.
- 'කෝමල ස්වර ශුද්ධ ස්වරයට වඩා හඬ අඩුව පිහිටන බවත්, තීව්‍ර ස්වරය හඬ වැඩිව පිහිටින බවත් පහදා දෙන්න.

(මිනිත්තු 05)

පියවර 02
- ස්වර පුවරුවේ රූප සටහනක ශුද්ධ ස්වර සප්තකය තුළ කෝමල තීව්‍ර ස්වර ලකුණු කරවන්න. සරිගම යන ස්වර, ශුද්ධ සහ කෝමල රිග ඇතුළත් කරමින් ස්වර ගායනය/වාදනය කර ස්වරවල වෙනස පහදා දෙන්න.
- ස්වර 12 ආරෝහණ වශයෙන් පිළිවෙලට සිසුන් සමග කළුලැල්ලේ ගොඩ නගන්න.
- ස්වර පුවරුවක සුදු කළු වර්ණවලින් ප්‍රකෘති සහ විකෘති ස්වර හැඳින්වෙන බව පැහැදිලි කරන්න. චල, අචල, ප්‍රකෘති, විකෘති, කෝමල, තීව්‍ර ආදී වශයෙන් ස්වර ප්‍රභේද සාකච්ඡා කරන්න.

(මිනිත්තු 35)

පියවර 03


- සුදුසු වගුවක් යොදා ගනිමින් සිසුන් සමග සාකච්ඡා කරමින් කෝමළ ස්වර බටහිර ක්‍රමයට ලකුණු කරන්න. ස්වර පුවරුවේ රූප සටහනක C, C#, D, $E^{b}$ ආදී වශයෙන් කෝමළ තීව්‍ර ස්වර සිසුන් සමග ලකුණු කරන්න. Sharp, Flat ස්වරවල වෙනස ඉතා කෙටියෙන් පහදන්න. (මෙහි දී අවශ්‍ය වනුයේ විද්‍යුත් ස්වර පුවරුවක ඇති ස්වර ලකුණු කිරීම හඳුනා ගැනීමට උපකාරී කිරීම පමණකි)

(මිනිත්තු 30)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

පහත රූප සටහන යොදා ගනිමින් ස්වර 12 සප්තකය තුළ ලකුණු කර වර්ග කරවන්න.

(මිනිත්තු 05)




පෙරදිග ස්වර සහ අපරදිග ස්වර සංකේත ඇතුළත් වන සේ වගුවක් පිළියෙල කරවන්න.

(මිනිත්තු 05)

**පැවරුම :** ස්වර පුවරු භාණ්ඩයකින් කෝමළ තීව්‍ර ස්වර වාදනය පුහුණු වීමට මග පෙන්වන්න.

තම අභ්‍යාස පොතෙහි ස්වර 12, ආරෝහණ පිළිවෙළට ගොඩ නැගීමට සිසුන් යොමු කරන්න.

**අතිරේක උදව් :** 2008 - 7 ශ්‍රේණිය ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ පිටු අංක 24 සිට 28 දක්වා කියවන්න.

# ස්වර සප්තකය ගායනය

**නිපුණතාව 1.0** : සංගීතයේ මූලිකාංග, ශිල්පාංග හා සිද්ධාන්ත හඳුනා ගනිමින් ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 1.1** : ස්වර ප්‍රභේද හඳුනා ගනිමින් අභ්‍යාස ගායනය / වාදනය කරයි.

**ක්‍රියාකාරකම** : ස්වර සප්තකය ගායනය

**කාලච්ඡේද** : 02

**ඉගෙනුම් පල** :
- ස්වර සප්තකයේ ස්වර අන්තර අවබෝධ කර ගනියි.
- සංගීත ප්‍රායෝගික දක්ෂතාවන්හි මූලාරම්භය සප්තකයේ නිවැරදි ගායනය බව වටහා ගනියි.
- ශුද්ධ ස්වර සප්තකය තනි තනිව ගයමින් ගායන හැකියා ප්‍රදර්ශනය කරයි.

**ගුණාත්මක යෙදවුම්:**
- ස්වර සප්තකයේ ස්වර අතර අන්තර වටහා ගත හැකි අයුරින් ගොඩ නැගූ දෘශ්‍ය උපකරණයක්
- ස්වර පුවරු භාණ්ඩයක් හෝ සුදුසු ස්වර වාද්‍ය භාණ්ඩයක්

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

සප්තකය පිළිබඳ සම්පූර්ණ අවබෝධයක් මේ වන විට මේ දරුවන්ට ලැබී තිබුණ ද, ස්වර සප්තකය ආරෝහණ සහ අවරෝහණ වශයෙන් සෑම දෙනාටම ප්‍රායෝගික ගායන හැකියාව නැතිවිය හැකිය. එබැවින් ඒ පිළිබඳ ප්‍රායෝගික හැකියාව වර්ධනය කිරීම මේ ක්‍රියාකාරකමින් අපේක්ෂිතය. ස්වර සප්තකය ශ්‍රැතිය මත ගායනය කළ යුතු ය. එසේ වුවත් 6, 7 ශ්‍රේණිවල දී සාම්ප්‍රදායික පිළිවෙළට ''ස'' ස්වරය ශ්‍රැතිය මත පිහිටුවීමේ අභ්‍යාස සාර්ථකව ඉටුකළ නොහැකි වන්නේ එය මෙම ශ්‍රේණිවල දරුවන්ට ආගන්තුක වන බැවිනි. මුලදීම දරුවන්ට නොදැනෙන පරිදි ශ්‍රැතිය මත පිහිටා සප්තකය ගායනය කිරීමට හුරු කර ගැනීමෙන් සහ ස්වර අන්තර නිවැරදිව ප්‍රායෝගිකව භාවිත කිරීමේ හැකියාව ඇති කිරීමෙන් පසු ශ්‍රැතිය මත පිහිටුවීම පහසුවෙන් කළ හැකි වේ. සප්තකයේ ස්වර සියල්ල සරිගමගරිස - ආදි වශයෙන් එකින් එක ස්වර ක්‍රම ක්‍රමයෙන් ඉහළට ගෙන යෑම පහසු වනු ඇත.

**පාඩම සංවර්ධනය :**

**පියවර 01**
- ගුරුවරයා විසින් වාදනය ද සමග ශුද්ධ ස්වර සප්තකය මධ්‍යලයෙන් ගයා පෙන්වන්න. ස්වර එකිනෙක ඉහළ පහළ වන බව සාකච්ඡා කරන්න.

(මිනිත්තු 05)

**පියවර 02**
- සුදුසු දෘශ්‍ය උපකරණයක් යොදා ගනිමින් සරිස-, සරිගරිස-, සරිගමගරිස- ආදී වශයෙන් එකින් එක ස්වර ක්‍රම ක්‍රමයෙන් ගායනය හුරු කරවන්න.
- සරිගමපධනිස් වශයෙන් මධ්‍ය සප්තකය නැවත නැවත ගායනයේ යොදවන්න.

(මිනිත්තු 35)

**පියවර 03**
- කණ්ඩායම් වශයෙන් සප්තකය ගායනයට යොමු කරන්න. ''ආ''කාරය ස්වරාකාරය ආදී විශේෂ ක්‍රම යොදා ගනිමින් ඒකාකාරී බවින් තොරව රසවත් කරගන්න. නැවත නැවත අභ්‍යාසයේ යොදවන්න.

(මිනිත්තු 30)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

ඒකලව සප්තකය ගායනයට යොමු කර සදොස් තැන් නිදොස් කරන්න. අගයන්න.

(මිනිත්තු 10)

**පැවරුම** : ස්වර පුවරු භාණ්ඩයක් වාදනය සමග සප්තකය ගායනයට හුරු වීමට මග පෙන්වන්න.

**අතිරේක උදව්** : 2008 - 7 ශ්‍රේණිය ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ පිටු අංක 22 සිට 24 දක්වා කියවන්න.

# ශුද්ධ ස්වර අභ්‍යාස

**නිපුණතාව 1.0** : සංගීතයේ මූලිකාංග, ශිල්පාංග හා සිද්ධාන්ත හඳුනා ගනිමින් ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 1.1 :** ස්වර ප්‍රභේද හඳුනා ගනිමින් අභ්‍යාස ගායනය / වාදනය කරයි.

**ක්‍රියාකාරකම** : ශුද්ධ ස්වර අභ්‍යාස

**කාලච්ඡේද** : 02


**ඉගෙනුම් පල** :
- ස්වර ඥානය වර්ධනය කර ගනියි.
- ස්වරවල ස්ථානීය අගය වටහා ගනියි.
- ස්වර අභ්‍යාස ගායනයට පෙළඹෙයි.
- ශුද්ධ ස්වර නිවැරදිව ගායනය කරයි.

**ගුණාත්මක යෙදවුම්:**
- ස්වර අභ්‍යාස ගොඩ නැගූ දෘශ්‍ය උපකරණයක්
- ස්වර පුවරු භාණ්ඩයක් හෝ සුදුසු ස්වර වාද්‍ය භාණ්ඩයක්

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

ස්වර අභ්‍යාසවල ස්වභාවය මේ වන විට මෙම ශ්‍රේණියේ දරුවෝ නිවැරදිව හඳුනා ගෙන ඇති අතර තාලානුකූල සහ සරල ස්වර අභ්‍යාසවල යෙදීමෙන් කුසලතාවයක් ලබා ගත හැකි බව දනිති. තරමක සංකීර්ණ අභ්‍යාසවලට ක්‍රම ක්‍රමයෙන් යා යුතුව ඇති නිසා මෙම පාඩමින් එම අවශ්‍යතාවය ඉටු කිරීම අපේක්ෂිතය. පහත දැක්වෙන නිදසුන බලන්න. ඒ අනුව සුදුසු අභ්‍යාස ගොඩ නගන්න. 6 ශ්‍රේණියේ නව ගුරු අත්පොතේ දක්වා ඇති තාලානුකූල ස්වර අභ්‍යාස යන පාඩමේ රූපසටහන්වලට අවධානය යොමු කරමින් ස්වරවල ඇති ඉහළ පහළ භාවය දෘශ්‍යමය බවකින් දැක්වෙන දෘශ්‍ය උපකරණ ගොඩ නගා ගන්න.

ස-,<br>
සරිස-,<br>
සරිගරිස-, යනාදී වශයෙන් ගොඩ නැගෙන ස්වර අභ්‍යාසයක ඉහළ පහළ බවේ දෘශ්‍යමය බව පහත දැක්වේ.



පළමුව සරලව අභ්‍යාස කළ පසු ස-ග, ස-ම, ස-ප, ස-ධ, ස-නි, ස-ස් වශයෙන් අභ්‍යාසයේ යෙදවිය හැකිය.

පාඩම සංවර්ධනය :

**පියවර 01**
- රසවත් ව වාදනය ද සමග ශුද්ධ ස්වර අභ්‍යාසය ගයා පෙන්වන්න. කොටස් වශයෙන් වෙන් වෙන්ව ගයා පෙන්වන්න. මේ අවස්ථාවේ දී පළමු ස්වර ඛණ්ඩයට වඩා ඊළඟ ස්වර ඛණ්ඩ ක්‍රම ක්‍රමයෙන් ඉහළ වන බව දරුවන් වටහා ගනු ඇත. ස්වර එකිනෙක ඉහළ පහළ වන ආකාරය ද සාකච්ඡා කරන්න.

(මිනිත්තු 05)

පියවර 02
- අභ්‍යාසයේ කොටසින් කොටස ක්‍රමක්‍රමයෙන් ගායනයට හුරු කරවන්න.
- විවිධ ලය භාවිත කරමින් නැවත නැවත ගායනයේ යොදවන්න.

(මිනිත්තු 25)

පියවර 03
- ස-රි, ස-ග, ස-ම, ස-ප ආදී වශයෙන් ගායනයේ යොදවන්න.
- ස්වරවල වැඩි වේලාවක් ගායනය රඳවා තබා ගැනීමට හැකි වන සේ අභ්‍යාසයේ යොදවන්න.
- කණ්ඩායම් වශයෙන් ආකාරය, ස්වරාකාරය ආදී විශේෂ ක්‍රම යොදා ගනිමින් ඒකාකාරයෙන් මිදී රසවත් කර ගන්න. නැවත නැවත අභ්‍යාසයේ යොදවන්න.

(මිනිත්තු 25)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**
- තේවලව හෝ කාණ්ඩ වශයෙන් ස්වර අභ්‍යාස ගායනයට යොමු කර සදොස් තැන් නිදොස් කරන්න. අගයන්න.
- ගුරුවරයා විසින් ආකාරයෙන් ඉදිරිපත් කරනු ලබන ස්වර කුමන ස්වරදැයි හඳුනා ගැනීමට හැකි වන සේ අභ්‍යාසයක යොදවන්න.

(මිනිත්තු 25)

**පසු අභ්‍යාස** : ස්වර පුවරු භාණ්ඩයක් වාදනය සමග ස්වර අභ්‍යාස ගායනයට හුරු වීමට මග පෙන්වන්න.

**අතිරේක උදව්** :
- නිදහස් කාලවල දී ස්වර සප්තකය ගායනයට යොමු කරන්න.
- 2008 - 7 ශ්‍රේණිය ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ 30, 31, 32 පිටු පරිශීලනය කරන්න.
- Sound of Music - චිත්‍රපටයේ Doe a deer නම් ගීතය ශ්‍රවණයට සලසා ස්වර අභ්‍යාස යෙදී ඇති අයුරු හඳුනා ගැනීමට මග පෙන්වන්න.

Let's start at the very beginning
A very good place to start
When you read you begin with A B C
When you sing you begin with Do Re Me
Do Re Me, Do Re Me
The first three notes just happen to be
Do Re Me, Do Re Me
Do Re Me Fa So La Ti
Let's see if I can make it easier

Doe, a deer, a female deer
Ray, a drop of golden sun
Me, a name I call myself
Far, a long long way to run
Sew, a needle pulling thread
La, a note to follow so
Tea, a drink with jam and bread
That will bring us back to Do, oh oh oh

සා සතුටින් මේ සැන්දෑවේ
රී රියමත නැගලා
ගා ගමටයි අපි මේ යන්නේ
මා මහනුවර බලා
පා සිනහ පාලා
දා පුදා දළදා
නී නිවාඩු කාලේ
සැමදාමත් සතුටින් ගී ගයමු අපි

සරි ගම පධ නිසං ප-සං

**ක්‍රියාකාරකම 5**

# ශුද්ධ ස්වරස්ථාපන ගීත ඇසුරින් ස්වර අභ්‍යාස

**නිපුණතාව 1.0** : සංගීතයේ මූලිකාංග, ශිල්පාංග හා සිද්ධාන්ත හඳුනා ගනිමින් ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 1.1** : ස්වර ප්‍රභේද හඳුනා ගනිමින් අභ්‍යාස ගායනය / වාදනය කරයි.

**ක්‍රියාකාරකම** : ශුද්ධ ස්වරස්ථාපන ගීත ඇසුරින් ස්වර අභ්‍යාස

**කාලච්ඡේද** : 02

**ඉගෙනුම් පල** :
- ස්වර ඥානය වර්ධනය කර ගනියි.
- සංගීත ප්‍රායෝගික දක්ෂතාවන්හි මූලාරම්භය නිවැරදි ස්වර ස්ථාන භාවිතය බව වටහා ගනියි.
- ස්වර අභ්‍යාස ගායනයට පෙළඹෙයි.
- ශුද්ධ ස්වර ගායන හැකියා ප්‍රදර්ශනය කරයි.

**ගුණාත්මක යෙදවුම්:**
- තෝරාගත් ස්වරස්ථාපන ගීත ප්‍රස්තාර කර ගොඩ නැගූ දෘශ්‍ය උපකරණයක්.
- ස්වර පුවරු භාණ්ඩයක් හෝ සුදුසු ස්වර වාද්‍ය භාණ්ඩයක්

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

ස්වර සහ ස්වර සප්තකය පිළිබඳ පූර්ණ අවබෝධයක් මේ වන විට සිසුන්ට ලැබී ඇත. නිවැරදිව ස්වර ස්ථාන මත පිහිටා ස්වර ගායනය/වාදනය කිරීමේ කුසලතාවය ලබා දීම මුල සිටම ආරම්භ කළ යුතු වේ. 6 ශ්‍රේණියේ දී තාලානුකූල ස්වර අභ්‍යාස ගායනය මගින් තරමක් දුරට ස්වර ස්ථාන පිළිබඳ වැටහීමක් ඇති වී ඇති බව පිළිගත හැකිය. ස්වර ගායනය අපහසුතා ඇති දරුවන්ට සෘජුවම ස්වර අභ්‍යාසවලට ඇතුළත් වනවා වෙනුවට ස්වරස්ථාපන ගීත මගින් ස්වර අභ්‍යාසවල ස්වභාවය හඳුන්වා දීම මෙම පාඩමින් අපේක්ෂිතය. 6 ශ්‍රේණියේ දී සිසුන් අධ්‍යයනය කර ඇති ස්වරස්ථාපන ගීත අතරින් කිහිපයක් මේ සඳහා යොදා ගත හැකිය. පහත දැක්වෙන ගීත මේ සඳහා වඩාත් සුදුසු ය.

සසග- / රිරිම- / ගගප- / මධප- /
බැතිනාS/ සිරිපාS/ කරුණාS/ කරනාS/

ස-රිස / රි-ගරි / ග-මග / ප-ප- /
ඇSතඇ / දීSයළි / මැSතට / පාSවේS/

ස-රි / ගම- / සරිග / මප- / සරිග / මපධ / නි--/---/
ඇSත / හිමේS / ගිරිමු / දුනේS / සිසිල / මැවෙන / වාSS/SSS

සුදුසු ගීතයක් හෝ කිහිපයක් තෝරා ගෙන පදමාලාව ගායනයෙන් පසු එකිනෙක පද කොටස් හා බැඳි ස්වර ගායනයට යොමු කිරීම සිසුන්ට පහසුවක් වනු ඇත. ස්වර ස්ථාන පිළිබඳ මේ වන විටත් අපහසුතා ඇති සිසුන්ගේ දුර්වලතා මෙමගින් මග හැරෙනු ඇත අතර දක්ෂතා ඇති දරුවන් තවදුරටත් ස්වර ගායනය වර්ධනය කරගනු ඇත.

**පාඩම සංවර්ධනය :**

**පියවර 01**
- වාදනය ද සමග ශුද්ධ ස්වර ස්ථාපන ගීතයේ පදමාලාව මධ්‍ය ලයෙන් ගායනා කර පෙන්වයි. ඒ හා බැඳි ස්වර ප්‍රස්තාරය ද වෙන් වෙන් ව ගයා පෙන්වන්න. මේ අවස්ථාවේ දී පදමාලාව ගැයෙන හඬ ස්වර මාලාවට ද අයත් බව දරුවන් වටහා ගනු ඇත. ස්වර එකිනෙක ඉහළ පහළ වන බව සාකච්ඡා කරන්න. (මිනිත්තු 05)

**පියවර 02**

- ගීතයේ පළමු පාදයේ වචන සහ ඊට අයත් ස්වර ක්‍රමක්‍රමයෙන් ගායනය හුරු කරවන්න.
- ගීතයේ පද ඉවත් කර ස්වර පමණක් නැවත නැවත ගායනයේ යොදවන්න.

(මිනිත්තු 25)

**පියවර 03**

- ස්වර අභ්‍යාසයක ස්වරූපය ඇති කොටස තෝරා ගෙන විවිධ ලය භාවිත කරමින් ගායනයේ යොදවන්න.
- කණ්ඩායම් වශයෙන් ස්වර සහ පද ගායනයට යොමු කරන්න. ආකාරය, ස්වරාකාරය ආදී විශේෂ ක්‍රම යොදා ගනිමින් ඒකාකාරයෙන් මිදී රසවත් කරගන්න. නැවත නැවත අභ්‍යාසයේ යොදවන්න.

(මිනිත්තු 25)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- කේවලව හෝ කාණ්ඩ වශයෙන් ස්වර පාද ගායනයට යොමු කර සදොස් තැන් නිදොස් කරන්න. අගයන්න.

(මිනිත්තු 25)

**පසු අභ්‍යාස** : ස්වර පුවරු භාණ්ඩයක් වාදනය සමග ස්වර අභ්‍යාස ගායනයට හුරු වීමට මග පෙන්වන්න.

**අතිරේක උදව්** : නිදහස් කාලවල දී ස්වර ස්ථාපන ගීතවල පදමාලාව සහ ස්වර මාලාව මාරුවෙන් මාරුවට ගායනයට යොමු කරන්න.

# ස්වරස්ථාපන ගීත ප්‍රස්තාර

**නිපුණතාව 1.0** : සංකේතානුසාරයෙන් සංගීතය ලියා දක්වන විධි හඳුනා ගනිමින් විශ්ව සංගීත කෘති ඇසුරු කිරීමටත්, දේශීය සංගීතාංග ලෝකය වෙත යොමු කිරීමටත් අත්‍යාවශ්‍ය මූලික නිපුණතා වර්ධනය කර ගනියි.

**නිපුණතා මට්ටම 1.1** : පෙරදිග ප්‍රස්තාරකරණයේ විශේෂතා දක්වයි.

**ක්‍රියාකාරකම** : ස්වරස්ථාපන ගීත ප්‍රස්තාර

**කාලච්ඡේද** : 02

**ඉගෙනුම් පල** :
- ප්‍රස්තාරකරණයේ සුවිශේෂතා හඳුනා ගනියි.
- ප්‍රස්තාර කිරීමේ දී අනුගමනය කරනු ලබන පිළිවෙල පිළිබඳව විස්තර කරයි.
- සංගීත අධ්‍යාපනයේ දී ගීත වාදිත ප්‍රස්තාර මූලික වන බව පිළිගනියි.
- ප්‍රස්තාර සරලව කියවීමේ හුරුව ලබයි.
- ප්‍රස්තාර කිරීමේ දක්ෂතා ප්‍රදර්ශනය කරයි.

**ගුණාත්මක යෙදවුම්**:
- ස්වර ප්‍රස්තාර ඇතුළත් දෘශ්‍ය උපකරණ
- ස්වර පුවරු භාණ්ඩයක් හෝ සුදුසු ස්වර වාද්‍ය භාණ්ඩයක්

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස්** :

මේ වන විට මෙම දරුවන් 6 ශ්‍රේණියේ දී සහ 7 ශ්‍රේණියේ දී ස්වර ස්ථාපන ගීත රාශියක් අධ්‍යයනය කර ඇත. එම ගීත වරින් වර ගායනයේ යෙදවීමත්, වාදන අභ්‍යාස සඳහා යොදා ගැනීමත් පලදායී වනු ඇත. ඒ සඳහා ස්වර ප්‍රස්තාර කිරීම අත්‍යාවශ්‍ය වේ. විශේෂයෙන් ස්වර ගායනයේ දක්ෂතා ඇති කිරීමට ස්වර ප්‍රස්තාරය ඉවහල් වේ.

ස්වර ප්‍රස්තාර කිරීමේ දී ගීතයේ වචන එක් වර්ණයකින් ද, ස්වර තවත් වර්ණයකින් ද ප්‍රස්තාර කිරීම 6, 7 ශ්‍රේණිවල දී වඩාත් සුදුසුය. ගීතයක පාදයෙන් පාදය ප්‍රස්තාර කිරීමේ දී පළමුව ස්වර ප්‍රස්තාරය ද ඊට යටින් පද ප්‍රස්තාරය ද යෙදීම සම්ප්‍රදායික පිළිවෙතයි. එකිනෙක ස්වර අතරත්, වචනවල අක්ෂර අතරත් තරමක දුරක් පිහිටන සේ ප්‍රස්තාර කිරීමට දරුවන්ට මග පෙන්විය යුතුය. ගීත ප්‍රස්තාර කළ දෘශ්‍ය උපකරණ මේ සඳහා භාවිත කළ යුතුමය. ප්‍රස්තාරයක දී තාලය අනුව විභාග වන අයුරු, ඇදෙන තැන් නැතහොත් යති යෙදෙන ස්ථාන ලකුණු කරන අයුරු, ස්වර ඇදෙන තැනක දී කඩ ඉරක් ද, වචනවල දී කුඩා S අකුර ද, පෙරදිග ප්‍රස්තාරයේ දී යෙදෙන බව ආදිය සිසුන් සමග සාකච්ඡා කරන්න.

**පාඩම සංවර්ධනය** :

**පියවර 01**
- ස්වර ස්ථාපන ගීතයක ගීත ප්‍රස්තාරය ප්‍රදර්ශනය කරන්න. එම ගීතය ගුරුවරයා විසින් වාදනය ද සමග ගයා පෙන්වන්න. පද කොටස් ගායනය කළ යුතු පිළිවෙල දක්වෙන්නේ ස්වර ප්‍රස්තාරය තුළින් බව ද සාකච්ඡා කරන්න. (මිනිත්තු 10)

**පියවර 02**
- තෝරාගත් ස්වර ස්ථාපන ගීත ප්‍රස්තාර ප්‍රදර්ශනය කරන්න. ප්‍රස්තාර කිරීමේ දී සැලකිල්ලට ගත යුතු කරුණු සිසුන් සමග සාකච්ඡා කරන්න. ප්‍රස්තාරයක තාලය, ස්වර සංඥා, විභාග, ඇදෙන තැන් ආදිය සාකච්ඡා කරන්න.
- සිසුන්ට එම ගීත ප්‍රස්තාර කිරීමට යොමු කරන්න. (මිනිත්තු 25)

පියවර 03
- ඉතිරි ගීත ද ප්‍රස්තාර කිරීමට යොමු කරන්න.
- එක් එක් ගීතයේ ස්වර සහ පද ගායනයේ යොදවන්න.
- කණ්ඩායම් වශයෙන් බෙදා එක් කණ්ඩායමක් ස්වර ප්‍රස්තාරය ද, අනෙක් කණ්ඩායම පද ප්‍රස්තාරය ද ලෙස අභ්‍යාසයේ යොදවන්න.

(මිනිත්තු 30)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- සිසුන්ගේ ප්‍රස්තාරවල ඇති සදොස් තැන් නිදොස් කරන්න. අගයන්න.

(මිනිත්තු 15)

**පසු අභ්‍යාස :** 6, 7 ශ්‍රේණිවල දී අධ්‍යයනය කළ ස්වර ප්‍රස්තාර ඇතුළත් කර පොත් පිංචක් සෑදීමට යොමු කරන්න.

**අතිරේක උදව් :**

- නිදහස් කාලවල දී සරල ගීත ප්‍රස්තාර ඇතුළත් පොත්වලින් සපයා ගත් ප්‍රස්තාර කියවීමට යොමු කරන්න.
- ඈත හිමේ ගිරි මුදුනේ - 2008 7 ශ්‍රේණිය ගුරුමාර්ගෝපදේශ සංග්‍රහය - පිටු අංක 36
- සවන පිනන ගීත මිහිර - 2008 7 ශ්‍රේණිය ගුරුමාර්ගෝපදේශ සංග්‍රහය - පිටු අංක 42
- කඳුපෙළ අතරේ, මුණිසිරිපාදේ, බැතිනා සිරිපා - 2008 7 ශ්‍රේණිය ගුරුමාර්ගෝපදේශ සංග්‍රහය - පිටු අංක 91
- කඳු කඳු නැගෙනා, වඳිම් වඳිම් වඳිම්, ඈත ඈදී යළි මෑතට පාවේ

# තාලය සංකල්පය

**නිපුණතාව 1.0** : සංගීතයේ මූලිකාංග, ශිල්පාංග හා සිද්ධාන්ත හඳුනා ගනිමින් ගායන / වාදන ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 1.1** : තාලය සහ ලය පිළිබඳ දක්ෂතා ප්‍රදර්ශනය කරයි.

**ක්‍රියාකාරකම** : තාලය සංකල්පය

**කාලච්ඡේද** : 02

**ඉගෙනුම් පල** :
- තාලය නිර්වචනය කරයි.
- තාල සංකල්පය පැහැදිලි කරයි.
- තාලය පිළිබඳ ප්‍රායෝගික අත්දැකීම් ලබයි.
- තාල තබයි.

**ගුණාත්මක යෙදවුම්** :
- තාල වාද්‍ය භාණ්ඩයක්
- රිද්ම රටා හෝ තාලය පිළිබඳ ප්‍රදර්ශනය කළ හැකි රූප සටහනක්

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

තාලය යනු නැවත නැවත සිදුවන නිශ්චිත ක්‍රියාවලියකි. තාලය සහිත සහ තාලය රහිත ගීත හා වෙනත් පරිසර ක්‍රියාකාරකම් ඇසුරින් සිසුවාට වටහා දෙන්න. පසුගිය ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ තාල පාඩම පිළිබඳ අවධානය යොමු කරන්න. තාලය යනු සංගීතයේ දී කාලය මනින මිම්මක් බව වටහා ගැනීමට මග පෙන්වන්න.

පාඩම සංවර්ධනය :

පියවර 01
- පරිසර ක්‍රියාකාරකම් ඇසුරින් තාල සහිත හා තාල රහිත උදාහරණ පිළිබඳ සාකච්ඡා කරන්න.
- ආඝාතාත්මක හා අනාඝාතාත්මක ගීත වෙන් වෙන් වශයෙන් ගයා පෙන්වන්න. සිසුවාට අත් තැලීමට අවස්ථාව දෙන්න.
- තාලයක් ඇත සහ නැත යනුවෙන් සිසුවාට අදහස් ප්‍රකාශ කිරීමට ඉඩ දෙන්න.
- තාල වාද්‍ය භාණ්ඩයක් ඇසුරින් උදාහරණ දෙන්න.
- එදිනෙදා මිනිස් ජීවිතය තුළ සිදුවන තාල සහිත හා තාල රහිත ක්‍රියා පිළිබඳ සාකච්ඡා කරන්න.

(මිනිත්තු 10)

පියවර 02
- තබ්ලා පද, බෙර පද හා රබන් පද ද යොදා ගනිමින් තාලය පිළිබඳ සාකච්ඡාවක යෙදෙන්න.
- තාලානුකූල ගීත ප්‍රස්තාර ගැන උදාහරණ දෙමින් සාකච්ඡා කරන්න.
- විවිධ ලය අනුව තාල තැබීමට සිසුවා යොමු කරන්න.
- තම්මැට්ටමක්, දඬුබෙරයක්, දවුලක් වැනි වාද්‍ය භාණ්ඩයක් යොදා ගනිමින් විවිධ තාල රූප වාදනයට යොමු කරන්න.

(මිනිත්තු 25)

පියවර 03
- තාල සහිත ගී පාද 05 ක් හා තාල රහිත ගී පාද 05 ක් එකින් එක ඇතුළත් ලැයිස්තුවක් ප්‍රදර්ශනය කරන්න.
- එම ගී පාද එකින් එක ගයා/වයා ශ්‍රවණයට සලසා තාලයක් සහිත හා තාලයක් රහිත ගී පාද වෙන් කිරීමට සිසුන්ට උපදෙස් දෙන්න.
- තාලය පිළිබඳ සටහනක් ගොඩ නගන්න.

(මිනිත්තු 35)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

තාල සහිත ගීතයක් ගායනය කර අත් තැලීමට අවස්ථාව දී අගයන්න.
(මිනිත්තු 05)

**පසු අභ්‍යාසඃ** පරිසරය තුළ ඇති තාල සහිත සහ තාල රහිත ක්‍රියා නිරීක්ෂණය කරන්න.

**අතිරේක උදව් :**

# ලය සංකල්පය

**නිපුණතාව 1.0** : සංගීතයේ මූලිකාංග හා සිද්ධාන්ත හඳුනා ගනිමින් ගායන / වාදන ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 1.1** : තාලය සහ ලය පිළිබඳ දක්ෂතා ප්‍රදර්ශනය කරයි.

**ක්‍රියාකාරකම** : ලය සංකල්පය

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල** :
- විවිධ ලයවලට අයත් ගීවලට තාල තබයි.
- ලයෙහි ප්‍රභේද නම් කරයි.
- නිර්මාණකරණයේ දී ලයෙහි වැදගත්කම ප්‍රකාශ කරයි.

**ගුණාත්මක යෙදවුම්:**
- තාල වාද්‍ය භාණ්ඩයක්
- විවිධ මාත්‍රා ගණන් දැක්වෙන ප්‍රස්තාර හෝ රිද්ම රටා සහිත පින්තූර සටහනක්
- රිද්මය දැක්විය හැකි විදුලි ඕගනයක්

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

මේ වන විට සිසුවා ලය පිළිබඳව ප්‍රායෝගික අත්දැකීම් ලබා ඇත. එය තවදුරටත් ප්‍රායෝගිකවත්, සෛද්ධාන්තික වශයෙනුත් අධ්‍යයනය කිරීම මෙම පාඩම තුළින් අපේක්ෂිතය. සංගීතයේ දී විවිධ ලය භාවිතය තුළින් උපදින රසය හා භාවයන් විවිධය. ශාන්ත රසය ජනිත වීමේ දී මධ්‍ය ලය හා විලම්භ ලයත්, වීර රසයේ දී ධ්‍රැත ලයත් භාවිත වීම ප්‍රකටය.

**පාඩම සංවර්ධනය :**

**පියවර 01**
- විවිධ ලය කීපයකින් එකම ගීතයක් ගායනය කරන්න. ඒ පිළිබඳ ව සිසුන් සමග සාකච්ඡා කරන්න.
- එක් එක් ලයට අනුව තාල තබමින් අත් තැලීම කරන්න.
- විදුලි ඕගන් එකක රිද්මය දැක්වීමට හැකිනම් එහි Tempo එක අඩු වැඩි කරමින් වාදනය කර පෙන්වන්න.

(මිනිත්තු 10)

**පියවර 02**
- ත්‍රිවිධ ලය පිළිබඳ සාකච්ඡාවක යෙදෙන්න.
- අත්තල යොදමින් සිසුන් සමග විවිධ ලයවලට අත්පුඩි ගසන්න. තාල වාද්‍ය භාණ්ඩයක් ඇත්නම් වයා පෙන්වන්න.
- නිර්මාණවල දී ලය වැදගත් වන ආකාරය පිළිබඳ ව සාකච්ඡා කරන්න.
- ලය 3 ට ගැළපෙන ගීත 3 ක් ගයා වයා පෙන්වන්න.

(මිනිත්තු 30)

**පියවර 03**
- මධ්‍ය ලය, ධ්‍රැත ලය හා විලම්භ ලය පිළිබඳ ව සිසුන්ගේ අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව දෙන්න.
- ලය පිළිබඳ ව සිසුන් සමග සටහනක් ගොඩ නගන්න.

(මිනිත්තු 30

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

ත්‍රිවිධ ලය අනුව දාදරා තාලය දැක්වීමට සිසුන් යොමු කර අගයන්න.

**පැවරුම:** විවිධ ලයවලට අයත් ගීත ලැයිස්තුවක් පිළියෙල කරන්න.

**අතිරේක උදවි:** ඉලෙක්ට්‍රොනික් ඕගනයකින් විවිධ රිද්ම රටා ඇතුළත් beats වාදනය කරන්න.

# මාත්‍රා 2/3/4 බැගින් වූ තාලයන්ට බෙදෙන ගී පද

**නිපුණතාව 1.0** : සංගීතයේ මූලිකාංග, ශිල්පාංග හා සිද්ධාන්ත හඳුනා ගනිමින් ගායන / වාදන ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 1.1** : තාලය සහ ලය පිළිබඳ දක්ෂතා ප්‍රදර්ශනය කරයි.

**ක්‍රියාකාරකම** : **මාත්‍රා 2/3/4 බැගින් වූ තාලයන්ට බෙදෙන ගී පද**

**කාලච්ඡේද** : 01

**ඉගෙනුම් පල** :
- විවිධ මාත්‍රා ගණනින් යුක්ත ගී පද ඇති බව ප්‍රකාශ කරයි.
- ගී පද විවිධ මාත්‍රා ගණන් අනුව බෙදා දක්වයි.
- මාත්‍රා ගණන අනුව ගී පද ප්‍රස්තාර කරයි.
- ගී පද තාලානුකූලව ප්‍රස්තාර කරයි.

**ගුණාත්මක යෙදවුම්** : ඇමුණුම අංක 1 හි මාත්‍රා 2/3/4 වශයෙන් බෙදෙන ගී පද ඇතුළත් දෘශ්‍ය උපකරණය.

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස්** :

මාත්‍රා පිළිබඳ තරමක අවබෝධයක් මේ වන විට සිසුන්ට ලැබී ඇත. එය තවදුරටත් තහවුරු කිරීම මෙම පාඩමෙන් අපේක්ෂිතය. ගී පද උදාහරණ කොට ගනිමින් මාත්‍රා දෙක, තුන සහ හතර බැගින් තාලයන්ට බෙදෙන ගී පද පිළිබඳ අවබෝධයක් ලබා දීම මෙහි අරමුණයි. ඇමුණුමේ සඳහන් ගී පද භාවිත කරන්න.

**පියවර 01**
- ඇමුණුම අංක 01 හි මාත්‍රා 02, 03, 04 ආදි වශයෙන් ප්‍රස්තාර කර ඇති ගී පද ප්‍රදර්ශනය කරන්න.

(මිනිත්තු 10)

**පියවර 02**
- මාත්‍රා 02, 03, 04 ආදි වශයෙන් ගණන් කරමින් අත් තැලීමට යොමු කරන්න. එම ගී පද ගායනයට යොමු කරන්න.

(මිනිත්තු 15)

**පියවර 03**
- විවිධ මාත්‍රා ගණනින් නිර්මාණය වූ ගී පද කිහිපයක් ප්‍රස්තාර කිරීමට සිසුන් යොමු කරන්න.

(මිනිත්තු 10)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්** :

මෙතෙක් උදාහරණයට නොගත් වෙනත් ගී පද මාත්‍රා දෙක, තුන, හතර ආදී වශයෙන් වෙන් කොට ලැයිස්තුවක් ගොඩ නගන්න.

(මිනිත්තු 05)

**පැවරුම** : මාත්‍රා 2, 3, 4 වශයෙන් බෙදෙන තිත් රූපවලට අයත් බෙර පද සෙවීමට යොමු කරවන්න.

(මිනිත්තු 05)

**අතිරේක උදවි**:

**ඇමුණුම 01**

**මාත්‍රා 2 බැගින් බෙදෙන ගී පද**

1. | කිරි | සුදු | හාs- | වාs-|
2. | දිය | ගොඩ | සැම | තැන|
3. | උඩ | රට | මැණි | කෙට|
4. | පොත | පත | කිය | වාs|

**මාත්‍රා 3 බැගින් බෙදෙන ගී පද**

1. | එකට | සතුටු | සාsග | රේss|
2. | සුවඳ | පද්ම | ඕsලු | ආsදි|
3. | සසර | වසන | තුරුs | s s s|
4. | වඳිමු | සුගත | ශාsක්‍ය | සි-ංහ|
5. | නිල්අ | හස්ත | ලේ-අ | ගේss|

**මාත්‍රා 4 බැගින් බෙදෙන ගී පද**

1. | මිහිකත | නලවාs | ලාsss | ssss|
2. | දකුණනැ | ගෙනහිර| බටහිර | උතුරද|
3. | කඳුපෙල | අතරේs | තුරුවදු | ලේsss|
4. | හොඳ හොඳ | ළමයින් | අපිවාs | ගේsss|
5. | මොනවද | මුත්තේs | මොකදක | රන්නේs|

# තනි තිත හා තාල පද

**නිපුණතාව 1.0** : සංගීතයේ මූලිකාංග ශිල්පාංග සහ සිද්ධාන්ත හඳුනා ගනිමින් ගායන / වාදන ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 1.1** : තාලය සහ ලය පිළිබඳ දක්ෂතා ප්‍රදර්ශනය කරයි.

**ක්‍රියාකාරකම** : තනි තිත හා තාල පද

**කාලච්ඡේද** : 01

**ඉගෙනුම් පල** :
- තිත යන්න නිර්වචනය කරයි.
- තිතෙහි ප්‍රභේද නම් කරයි.
- තනි තිතට අයත් ප්‍රභේද නම් කරයි.
- තනි තිතට අයත් පද ප්‍රස්තාර කරයි.
- තනි තිතට සමාන හින්දුස්ථානි තාල පද ප්‍රස්තාර කරයි.

**ගුණාත්මක යෙදවුම්:**
- තාලම්පට, සපයා ගත හැකි නම් බෙරයක්, තනි තිතට අයත් බෙර පද ප්‍රස්තාර කරන ලද පත්‍රිකාව
- දාදරා, ලාවණි, ත්‍රීතාල් තාල පද ප්‍රස්තාර කරන ලද දෘශ්‍ය උපකරණය

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස්:**

හින්දුස්ථානි තාල පද පිළිබඳවත්, දේශීය බෙර පද පිළිබඳවත්, අධ්‍යයනය කිරීමට අවස්ථාව සලසා දීම මෙයින් අපේක්ෂා කෙරේ. තනි තිතේ තාල පද හඳුන්වා දීමත්, ඒවා අතින් තාල දමා පෙන්වීමත් මෙම පාඩමින් අපේක්ෂා කෙරේ. තනිතිත, දෙතිත, තුන්තිත ආදී වශයෙන් තිත් ප්‍රභේද කිහිපයක් ඇති බවත්, මෙයින් තනි තිත යනු එක් මාත්‍රා වර්ගයක තාල බවත්, පැහැදිලි කරන්න. තනිතිතේ මෙම ප්‍රභේද තුනට සමාන හින්දුස්ථානි තාල පද වන දාදරා, ලාවණී සහ ත්‍රීතාල් යන තාල පද ද, ඉගැන්වීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය.

**පියවර 01**
- තාලම්පොටින් නිකුත්වන තිත් සහ තෙයි යන ධ්වනි වාදනය කර පෙන්වන්න.
- ආඝාතාත්මක කවියක් ගායනය කර තාලම්පොට වාදනය කර පෙන්වන්න.
- තනි තිතේ තිත් රූප තුනට ගැළපෙන කවි තුනක් ගායනය කර තාලම්පට වාදනය කර පෙන්වන්න.
- මාත්‍රා 2, 3 සහ 4 බැගින් විභාග වන ගී පද ගයා වයා පෙන්වන්න.
- ඊට ගැළපෙන ලෙස තබ්ලාව වාදනයේ දී යොදා ගන්නා තාල පද පිළිබඳ සාකච්ඡා කරන්න.

(මිනිත්තු 10)

**පියවර 02**
- තනි තිතේ මාත්‍රා බෙදෙන අයුරු අංකනය කර පෙන්වන්න.
- උඩරට බෙර පද සඳහන් පත්‍රිකාව ප්‍රදර්ශනය කර ශබ්ද නගා උච්චාරණය කිරීමට සලස්වන්න.
- තාලම්පට වාදනය කරමින් සිසුන් ලවා බෙර පද උච්චාරණය කරවන්න.

(මිනිත්තු 05)

**පියවර 03**

- ගුරුවරයා තාලම්පට වයන විට සිසුන්ට එක් එක් තාල පදය උච්චාරණය කිරීමට අවස්ථාව දෙන්න.
- සිසුන්ට ද තාලම්පට වයමින් බෙර පද උච්චාරණය කිරීමට සලස්වන්න.
- තනි තිතේ තිත් රූප 3 ට අයත් බෙර පද ප්‍රස්තාර කරවන්න.
- හින්දුස්ථානී තාල පද ප්‍රස්තාර සටහන් ප්‍රදර්ශනය කරන්න.
- තනිතිතට සමාන ව මාත්‍රා බෙදෙන හින්දුස්ථානි තාල පද පිළිබඳ ව සිසුන් සමග සාකච්ඡා කරන්න.
- දාදරා ලාවණී ත්‍රිතාල් ප්‍රස්තාර කරවන්න. (මිනිත්තු 20)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- මාත්‍රා ගණන අනුව තිත් රූප වෙනස් වන අයුරුත් ඒ අනුව තාලම්පටෙහි ධ්වනිය වෙනස් ව භාවිත කරන ආකාරයත් තහවුරු කිරීම සඳහා අභ්‍යාස කරවන්න.
- තනිතිතේ ප්‍රභේද සමග හින්දුස්ථානි තාල පද සසඳමින් වාචික ව ප්‍රශ්න ඉදිරිපත් කර අගයන්න.

(මිනිත්තු 05)

**පැවරුම :** තනිතිතේ තිත් රූපවලට අයත් විවිධ බෙර පද ප්‍රස්තාර කිරීමට යොමු කරවන්න.

**අතිරේක උදව් :** තනිතිතට අයත් බෙර පද හා හින්දුස්ථානී තාලපද ඇතුළත් ග්‍රන්ථ පරිශීලනය කිරීමට මග පෙන්වන්න.

# දේශාභිමානී ගීත ගායනය / වාදනය

**නිපුණතාව 5.0** : සරල සංගීතය හා බැඳි සංගීතාංග පිළිබඳ අත්දැකීම් ලබයි.

**නිපුණතා මට්ටම 5.1** : දේශාභිමානී ගීත ගායන/වාදනයේ යෙදෙයි.

**ක්‍රියාකාරකම** : දේශාභිමානී ගීත ගායනය/වාදනය

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල** :
- දේශාභිමානී ගීතවල පද සංකල්පනාවන් පිළිබඳව සොයා බලයි.
- දේශාභිමානී ගීතවල ඇති සංගීතමය හා නිර්මාණශීලී අගය වටහා ගෙන රස විඳියි.
- දේශාභිමානී ගීත රස විඳිමින් ගායනය කරයි.

**ගුණාත්මක යෙදවුම්** :
- ස්වර පුවරු සංගීත භාණ්ඩයක්, පද මාලා ලියා ඇති දෘශ්‍යාධාරයක්, CD යන්ත්‍රයක් හා පටිගත කරන ලද CD තැටි
- සර්පිනාව, උඩැක්කිය, රබාන, තාලම්පට

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

අර්ථ රසයෙන් හා සංගීතයෙන් උසස් තත්ත්වයේ පවතින පහත දේශාභිමානී ගීත කිහිපයක් 7 ශ්‍රේණිය සඳහා තෝරා ගෙන ඇත.

මේ උදාර ලංක භූමිය යි
රත්න දීප ජන්ම භූමියයි
ලෝකෙන් උතුම් රට
දකුණ නැගෙනහිර
ලංකා ලංකා

ඉහත ගීත අතරින් කාලච්ඡේද 02 සඳහා ගීත 02 ක් යොදා ගන්න.

තෝරා ගත් ගීතය දෘශ්‍ය උපකරණයක් මගින් ප්‍රදර්ශනය කරන්න. ගීතයේ අදහස පද රචනය සංගීත නිර්මාණකරුවා හා ගායකයා පිළිබඳ සටහන් කරන්න.

ගීතය ශ්‍රවණය වන අවස්ථාවේ දී ගායනය සඳහා සිසුන් පොළඹවන්න. පන්තියේ ඇතැම් සිසුන්ට තාල වාදනය සඳහා අවස්ථාව ලබා දෙන්න. දේශාභිමානය දක්වෙන අයුරින් අවනද්ධ වාද්‍ය භාණ්ඩ යොදා ගනිමින් ඊට උචිත ලය පවත්වා ගැනීමට උපදෙස් දෙන්න. එක් කාලච්ඡේදයක දී එක් ගීතයක් යොදා ගන්නා නිසා ගුරුවරයාගේ ගායනය / වාදනය සමගම සිසුන්ට ද ගායනයේ යෙදීමට මග පෙන්වන්න.

**පාඩම සංවර්ධනය** :

පියවර 01
- තෝරා ගත් ගීතයේ පද මාලාව සිසුනට ප්‍රදර්ශනය කරන්න.
- CD තැටියක් මගින් හෝ ඔබ විසින් හෝ ගායනය කර අදාළ ගීතය ශ්‍රවණයට සලස්වන්න.
- එම ගීතයේ තනුව සිසුනට ග්‍රහණය කරගත හැකිවන තෙක් ගායනයේ යෙදෙන්න.

(මිනිත්තු 10)

**පියවර 02**

- ගීතය ගයමින් සිසුන් සමගින් අර්ථය පිළිබඳව රස වින්දනය කරන්න.
- වාදනයෙහි කැමති සිසුන්ගේ සහාය ලබා ගෙන ගීතය ප්‍රාසංගිකව ඉදිරිපත් කිරීමට සිසුන් මෙහෙයවන්න.

(මිනිත්තු 30)

**පියවර 03**

- ඔබ විසින් තෝරාගත් අනෙක් ගීතය ඉහත ක්‍රමවේද අනුගමනය කරමින් සිසුන් සමග ගායනයේ යෙදෙන්න.

(මිනිත්තු 30)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

එක් එක් ගීතය වඩාත් නිවැරදිව ගායනය කරන සිසු සිසුවියන් ඉදිරියට ගෙන අගය කරන්න.

(මිනිත්තු 10)

පැවරුම : නිදහස් කාලවල දී තෝරා ගත් ඉතිරි ගීතයන් හි ස්වර ප්‍රස්තාර හා පද මාලාවන් සපයා ගෙන පුහුණු වන්න.

# නූර්ති ගීත ගායනය

**නිපුණතාව 6.0** : රංග සම්ප්‍රදායන්හි විශේෂතා අධ්‍යයනය කරමින්, සංගීතමය ලක්ෂණ පිළිබඳ ප්‍රායෝගික අත්දැකීම් ලබයි.

**නිපුණතා මට්ටම 6.2 :** නූර්ති ගීත ගායනය කරයි.

**ක්‍රියාකාරකම** : නූර්ති ගීත ගායනය

**කාලච්ඡේද** : 01

**ඉගෙනුම් පල** :
- නූර්ති ගීත ගායනය කරයි.
- ප්‍රචලිත නූර්ති ගීත එකතු කරයි.
- නූර්ති ගීත ශ්‍රවණය කිරීමට කැමැත්තක් දක්වයි.

**ගුණාත්මක යෙදවුම්:**
- ගීතය ලියූ දෘශ්‍යාධාරය
- සර්පිනාව, තබ්ලාව, වයලීනය, බටනලාව

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

ශ්‍රී වික්‍රම රාජසිංහ, රාමායනය, දුටුගැමුණු, සිරිසඟබෝ වැනි පැරණි නාට්‍යවල ගැයූ ගීත නූර්ති ගීත වේ. සකුන්තලා, පද්මාවතී, සිවම්මා ධනපාල වැනි පැරණි නාට්‍යවල ගැයූ ගීත අදත් භාවිත වේ. මෙම ගීත නළු නිළියන් විසින්ම ගායනය හා රංගනය සමග විචිත්‍ර ව ඉදිරිපත් කර ඇත. මෙම කර්ණ රසායන ගීත ශ්‍රවණය කිරීම නිසා එම ගීත ඉගෙන ගැනීමට ඔවුන් පෙළඹුන බවත් සිසුන්ට පහදා දෙන්න.

නීතිඥ ජෝන් ද සිල්වා සූරීන්ගේ ''රාමායනය'' නූර්තියේ එන ''අඹ දඹ නාරං කෙසෙල් දෙල්'' ගීතය ඉගැන්වීම මෙම පන්තියේ දී අපේක්ෂා කෙරේ. එම ගීතය පිළිබඳ ව කෙටි හැඳින්වීමක් කරන්න. මෙම ගීතය විවිධ මාධ්‍ය ඔස්සේ මේ වන විට සිසුන් හඳුනා ගෙන ඇති නිසා ගුරුවරයා ඉදිරිපත් කරන ගායනය හා වාදනය සමගම සිසුන් ද ගායනයට යොමු කරන්න.

**පාඩම සංවර්ධනය :**

**පියවර 01**
- සිසුන් දන්නා නූර්ති ගීත කිහිපයක් නම් කිරීමට අවස්ථාවක් ලබා දෙන්න. ඉන් ගීතයක් ගැයීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න. (මිනිත්තු 05)

**පියවර 02**
- ගීතය ලියූ දෘශ්‍යාධාරය ප්‍රදර්ශනය කරන්න.
- ගුරුවරයා විසින් වාදනය ද සමග ඉදිරිපත් කරන ගායනය ශ්‍රවණය කිරීමට යොමු කරන්න.
- ගුරුවරයාගේ ගායනය / වාදනය සමගම සිසුන්ට ද ගායනයේ යෙදීමට මඟ පෙන්වන්න. (මිනිත්තු 25)

**පියවර 03**
- කේවලව හා කණ්ඩායම් කර ගීතය ගායනය කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- සිසුන් ගීත ඉදිරිපත් කරන විට ගුරුවරයා වාදනයෙන් සහාය ලබා දෙන්න. (මිනිත්තු 10)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

නිවැරදි ශ්‍රැතියට හා තාලානුකූලව මිහිරිව ගායනය කළ කණ්ඩායම හා තනි තනිව ගැයූ සිසු/සිසුවියන් තෝරා අගය කරන්න.

**පසුවැඩ :** නූර්ති ගීත එකතු කිරීමට උපදෙස් දෙන්න. විවේක අවස්ථාවන්හි දී පුහුණුවීම් සඳහා ගුරු සහයෝගය ලබා දෙන්න.

**අතිරේක උදව්:** 8, 11 ශ්‍රේණි ගුරුමාර්ගෝපදේශ (2008, 2009)

# උපදේශාත්මක ගීත රසාස්වාදය සහ ගායනය

**නිපුණතාව 1.0** : සංගීතයේ ශිල්පාංග හා සිද්ධාන්ත හඳුනා ගනිමින් ගායන / වාදන ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 1.1** : සංගීත රසාස්වාදයේ යෙදෙමින් ජීවිතයේ සතුට හා බැඳී මානසික තත්ත්වයන් ළඟා කර ගැනීමට හුරු වෙයි.

**ක්‍රියාකාරකම** : උපදේශාත්මක ගීත රසාස්වාදය සහ ගායනය

**කාලච්ඡේද** : 02

**ඉගෙනුම් පල** :
- උපදේශාත්මක ගී පිළිබඳව අදහස් දක්වයි.
- උපදේශාත්මක ගීත ලැයිස්තු ගත කරයි.
- එම ගීත ගයන ගායක ගායිකාවන් නම් කරයි.
- උපදේශාත්මක ගීත ගායනයට කැමැත්තක් දක්වයි.
- එම ගීතවල පද මාලාවන් ප්‍රකාශ වන අදහස විස්තර කරයි.
- උපදේශාත්මක ගීතයක් දෙකක් ගායනය කරයි.

**ගුණාත්මක යෙදවුම්** :
- නිර්දේශිත ගීත ඇතුළත් ශ්‍රව්‍ය පට, දෘශ්‍ය ආධාරක, ස්වර වාද්‍ය භාණ්ඩයක්

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

ව්‍යවහරික සංගීත ක්ෂේත්‍රය තුළ ප්‍රචලිත පැරණි සහ නූතන ගීත අතරින්, සිසුන්ගේ චර්යාවන් සහ ආකල්ප වර්ධනයට ඉවහල් වන ගීත දෙකක් අධ්‍යයනය කිරීමට අවස්ථාව සැලසීම මෙම ශ්‍රේණියේ දී අපේක්ෂා කෙරේ මෙම කාලච්ඡේද 2 සඳහා පහත සඳහන් ගීත අතුරින් සුදුසු ගීත 2ක් තෝරා ගන්න.
- නොමග නොයන් පුතේ
- අහන්න මගේ හොඳ පුංචි පුතේ
- දූ පුතුනේ රට අපේ ය
- කරුණාව සමග හොඳ හිත පතුරන්න සැම කෙරේ.
- දූඩි කළ මාතා පෙම්බර මාතා
- මව්පියො ආදී සොඳුරු තමාගේ
- හිතන්නකෝ අයියේ...
- සමන් වැලේ මල් ජයට පිපීලා......
- පාන්කිරිත්තා තක්කිට තරිකිට

**පාඩම සංවර්ධනය** :

**පියවර 01**
- තෝරා ගත් ගීත, ලියන ලද දෘශ්‍ය ආධාරකය ප්‍රදර්ශනය කරන්න.
- ගීත ඇතුළත් ශ්‍රව්‍ය පටය සිසුන්ට ශ්‍රවණයට යොමු කරන්න.
- ස්වර වාද්‍ය භාණ්ඩය ඇසුරෙන් ගීතය ගයා වයා දක්වන්න.

(මිනිත්තු 10)

**පියවර 02**
- දෘශ්‍ය ආධාරකය උපයෝගි කර ගනිමින් පළමු ගීතය සිසුන්ට ගායන කිරීමට අවස්ථාව සලස්වන්න.
- නැවත නැවත ගායනය කිරීමට අවස්ථාව සලසමින් ගීතයෙහි පදමාලාව පිළිබඳ ව සිසු අදහස් විමසන්න. (මිනිත්තු 30)

පියවර 03
- දෙවන ගීතය ද ඉහත සඳහන් ආකාරයට පුහුණු කරවන්න.
- නාද මාලාව තහවුරු වන තෙක් ගීතය ගායනයට පුහුණු කරවන්න.

(මිනිත්තු 30)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- උපදේශාත්මක ගීත පිළිබඳව අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාව දෙන්න.
- එම ගීතවල පද මාලාවෙන් ප්‍රකාශ වන අදහස් විස්තර කරන්න.
- උපදේශාත්මක ගීත නිවැරදිව ගායනය කරන්න.
- වෙනත් උපදේශාත්මක ගීත සෙවීමට මග පෙන්වන්න.

(මිනිත්තු 10)

**පසුවැඩ** :
- උපදේශාත්මක ගීත ඇතුළත් පොත් පිංචක් නිර්මාණය කරන්න.
- විවිධ ප්‍රසංග, උදෑසන රැස්වීම්, සාහිත්‍ය සමිති ආදී අවස්ථාවන්හි දී උපදේශාත්මක ගීත ප්‍රාසංගිකව ඉදිරිපත් කරන්න.

**අතිරේක උදව්** :

# කෝමළ ග නි ඇතුළත් ස්වරස්ථාපන ගීත ඇසුරින් ස්වර අභ්‍යාස

**නිපුණතාව 1.0** : සංගීතයේ ශිල්පාංග හා සිද්ධාන්ත හඳුනා ගනිමින් ගායන / වාදන ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 1.1 :** ස්වර ප්‍රභේද හඳුනා ගනිමින් අභ්‍යාස ගායනය/වාදනය කරයි.

**ක්‍රියාකාරකම** : කෝමළ ග නි ඇතුළත් ස්වරස්ථාපන ගීත ඇසුරින් ස්වර අභ්‍යාස

**කාලච්ඡේද** : 02

**ඉගෙනුම් පල** :
- කෝමළ ස්වර පිළිබඳ ඥානය වර්ධනය කර ගනියි.
- සංගීතය සඳහා නිවැරදි ස්වරස්ථාන භාවිතය අවශ්‍ය බව පිළිගනියි.
- ස්වර අභ්‍යාස ගායනයට පෙළඹෙයි.
- කෝමළ ස්වර ගායන හැකියා ප්‍රදර්ශනය කරයි.

**ගුණාත්මක යෙදවුම් :**
- තෝරා ගත් ස්වරස්ථාපන ගීත ප්‍රස්තාර කර ගොඩ නැගූ දෘශ්‍ය උපකරණයක්.
- ස්වර පුවරු භාණ්ඩයක් හෝ සුදුසු ස්වර වාද්‍ය භාණ්ඩයක්.

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

ස්වර සහ ස්වර සප්තකය පිළිබඳවත්, ශුද්ධ ස්වර අභ්‍යාසයේ යෙදී ස්වරස්ථාන පිළිබඳවත්, වැටහීමක් ඇති වී ඇති බව පිළිගත හැකිය. ශුද්ධ ස්වරස්ථාපන ගීත මගින් ස්වර අභ්‍යාසවල යෙදී ඇති නිසා මෙම පාඩමින් කෝමළ ග නි ඇතුළත් ස්වරස්ථාපන ගීත මගින් ගායන දක්ෂතා ඇති කිරීම අපේක්ෂිතය.

ස්වරස්ථාපන ගීතයක ඇති ස්වභාවය වන්නේ සෑම පාදයක ම පාහේ ස්වර අභ්‍යාසමය ස්වරූපය දක්නට ලැබීම ය. මෙම කාරණය පදනම් කරගනිමින් ගුරුවරයා වශයෙන් ඔබට ද ස්වරස්ථාපන ගීතයක් නිර්මාණය කර ගැනීමේ හැකියාව තිබිය යුතු ය. මේ අනුව කෝමළ ග,නි, ස්වර ඇතුළත් කර ඔබ විසින් නිර්මාණය කරගත් ස්වරස්ථාපන ගීතයක් මෙම පාඩමේ දී යොදා ගැනීමට කටයුතු කරන්න. පහත දැක්වෙන අසම්පූර්ණ ගීතය මේ සඳහා ඔබට මග පෙන්වනු ඇත.

ස රි ග / රි ස - / රි ග ම / ග රි - /
ස ඳ ප/ හනේ- / කි රි බැ / බ ලී - /
ග ම ප/ ධ ප ම / ප - - / - - - /
සි ත සැ/නහෙන/වා - - / - - - /
ම ප ධ / ප ම - / ප ධ නි/ ධ ප - /
..................................................................
ධ නි සෘ / නි ධ නි / සෘ - -/ - - - /
..................................................................
සෘ සෘ ධ / නි නි ප / ධ ධ ම / ප - - /
..................................................................
ප ප ග / ම ම රි / ග ග රි / ස - - /
..................................................................

පදමාලාව ගායනයෙන් පසු එක් එක් පද කොටස් හා බැඳි ස්වර ගායනයට

යොමු කිරීම අත්‍යවශ්‍ය වේ. ස්වර ගායනය නොකර ස්වර ස්ථාපනය සිදු නොවන බව වටහා ගන්න. ස්වරස්ථාපන ගී මගින් ස්වර ස්ථාන පිළිබඳ සිසුන්ගේ ඇති දුර්වලතා මෙමගින් මග හැරුණු ඇති අතර දක්ෂතා ඇති දරුවන් තවදුරටත් ස්වර ගායනය වර්ධනය කරගනු ඇත.

**පාඩම සංවර්ධනය :**

**පියවර 01**

වාදනය ද සමග තෝරා ගත් කෝමළ ස්වර ස්ථාපන ගීතයේ පදමාලාව මධ්‍ය ලයෙන් ගයා පෙන්වන්න. ඒ හා බැඳි ස්වර ප්‍රස්තාරය ද වෙන් වෙන්ව ගයා පෙන්වන්න. මේ අවස්ථාවේ දී පද මාලාව ගැයෙන හඬ ස්වර මාලාවට ද අයත් බව දරුවන් වටහා ගනු ඇත. ස්වර එකිනෙක ඉහළ පහළ වන බව සාකච්ඡා කරන්න.

(මිනිත්තු 05)

**පියවර 02**

- ගීතයේ පළමු පාදයේ වචන සහ ඊට අයත් ස්වර ක්‍රමක්‍රමයෙන් ගායනය හුරු කරවන්න.
- ගීතයේ පද ඉවත් කර ස්වර පමණක් නැවත ගායනයේ යොදන්න.

(මිනිත්තු 25)

**පියවර 03**

- පිළිවෙලකට ස්වර යෙදී ඇති කොටස් තෝරා ගෙන විවිධ ලය භාවිත කරමින් ගායනයේ යොදවන්න.
- කණ්ඩායම් වශයෙන් ස්වර සහ පද ගායනයට යොමු කරන්න. ආකාරය, ස්වරාකාරය ආදී විශේෂ ක්‍රම යොදා ගනිමින් ඒකාකාරයෙන් මිදී රසවත් කරගන්න. නැවත නැවත අභ්‍යාසයේ යොදවන්න.

(මිනිත්තු 25)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

කේවල ව හෝ කාණ්ඩ වශයෙන් ස්වර පාද ගායනයට යොමු කර සදොස් තැන් නිදොස් කරන්න. අගයන්න.

(මිනිත්තු 25)

**පසුවැඩ** : ස්වරපුවරු භාණ්ඩයක් වාදනය සමග ස්වර අභ්‍යාස ගායනයට හුරු වීමට මග පෙන්වන්න.

**අතිරේක උදව්** : පහත දැක්වෙන ගීත ගායනය සඳහා සුදුසුය. නිදහස් කාලවල දී පද මාලාව සහ ස්වර මාලාව මාරුවෙන් මාරුවට ගායනයට යොමු කරන්න.

- ස ස රි රි / ග රි ස - / රි රි ම ම/ ප - - - /
  පොත ප ත / කි ය වා - / නු ව ණ ව/ ඩා - - - /

/

- ප - ප /ප ම ප / ග - - / - - - /
  පු ං චි / තා s ර / කා s s / s s s /
- ස - රි / ග - ම / ගම ප - / - - -/
  හෝ s s / හෝ s s / ගාs s s / s s s /
  ප ම ග / ම ග රි / ස - - / - - - /
  රැ ල් ල / බි ඳෙ න / වා s s / s s s /
- ස රි / ග - ම / ප ප / ප - ස් /
  සි රි / සා s ර / අ ති / ශා න් ත /

# කෝමල ස්වර අභ්‍යාස

**නිපුණතාව 1.0** : සංගීතයේ ශිල්පාංග හා සිද්ධාන්ත හඳුනා ගනිමින් ගායන / වාදන ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 1.1** : ස්වර ප්‍රභේද හඳුනා ගනිමින් අභ්‍යාස ගායනය/වාදනය කරයි.

**ක්‍රියාකාරකම** : කෝමල ග නි ඇතුළත් ස්වරස්ථාපන ගීත ඇසුරින් ස්වර අභ්‍යාස

**කාලච්ඡේද** : 01

**ඉගෙනුම් පල** :
- ස්වර ඥානය වර්ධනය කර ගනියි.
- ස්වර වල ස්ථානීය අගය වටහා ගනියි.
- ස්වර අභ්‍යාස ගායනයට පෙළඹෙයි.
- කෝමල ග නි ස්වර නිවැරදිව ගායනය කරයි.

**ගුණාත්මක යෙදවුම්** :
- කෝමල ග නි ස්වර ඇතුළත් අභ්‍යාස ගොඩ නැගූ දෘශ්‍ය උපකරණයක්.
- ස්වරපුවරු භාණ්ඩයක් හෝ සුදුසු ස්වර වාද්‍ය භාණ්ඩයක්.

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස්** :

ස්වර අභ්‍යාසවල ස්වභාවය මේ වන විට මෙම ශ්‍රේණියේ දරුවන් නිවැරදිව හඳුනා ගෙන ඇති අතර තාලානුකූල සහ සරල ස්වර අභ්‍යාසවල යෙදීමේ කුසලතාවය වර්ධනය වී ඇත. කෝමල ග නි ස්වර ඇතුළත් ස්වර අභ්‍යාසයේ යෙදවීම මෙම පාඩමින් අපේක්ෂිතය. ගුරුවරයා විසින් පන්තියට සුදුසු ලෙස ගොඩනගා ගත් ස්වර අභ්‍යාස ගායනයේ යෙදවිය හැකි ය. කෝමල ගාන්ධාරය සහ කෝමල නිෂාදය පහසුවෙන් ගැයෙන සේ සුදුසු ස්වර අභ්‍යාස ගොඩ නගා ගන්න. සාම්ප්‍රදායික ස්වර අභ්‍යාසයක්ම විය යුතු යැයි නියමයක් නැත. රසවත් වූ ස්වර අභ්‍යාස මේ සඳහා සුදුසුය. පහත දැක්වෙන ස්වර අභ්‍යාස මේ සඳහා ඔබට මග පෙන්වනු ඇත.

ස ස රි රි / ග ග ම ම / ප - - - / - - - - /
ප ප ම ම / ග ග රි රි / ස - - - / - - - - /
ග රි ස රි / ග - - - / ම ග රි ග / ම - - - /
ප ම ග ම / ප - - - / ධ ධ ම ධ / ප - - - /

**පාඩම සංවර්ධනය** :

**පියවර 01** ගුරුවරයා විසින් වාදනය ද සමග තෝරා ගත් කෝමල ස්වර ස්ථාපන ගීතයේ පදමාලාව මධ්‍ය ලයෙන් ගයා පෙන්වන්න. ඒ හා බැඳි ස්වර ප්‍රස්තාරය ද වෙන් වෙන්ව ගයා පෙන්වන්න. මේ අවස්ථාවේ දී පද මාලාව ගැයෙන හඬ ස්වර මාලාවට ද අයත් බව දරුවන් වටහා ගනු ඇත. ස්වර එකිනෙක ඉහළ පහළ වන බව සාකච්ඡා කරන්න.

(මිනිත්තු 05)

**පියවර 02**
- අභ්‍යාසයේ කොටසින් කොටස ක්‍රමානුකූලව ගායනයට හුරු කරවන්න.
- විවිධ ලය භාවිත කරමින් නැවත නැවත ගායනයේ යොදවන්න.

(මිනිත්තු 20)

**පියවර 03**

- ස-රි, ග-රි, ස-ම, ස-ප, ආදී වශයෙන් ස්වර අන්තර වටහා ගැනීමට උපකාරී වන සේ ගායනයේ යොදවන්න.
- ස්වරවල වැඩි වේලාවක් ගායනය රඳවා තබා ගැනීමට හැකි වන සේ අභ්‍යාසයේ යොදන්න.
- කණ්ඩායම් වශයෙන් ආකාරය, ස්වරාකාරය ආදී විශේෂ ක්‍රම යොදා ගනිමින් ඒකාකාරයෙන් මිදී රසවත් කර ගන්න. නැවත නැවත එම ක්‍රියාකාරකමෙහිම යොදවන්න.

(මිනිත්තු 10)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- කේවලව හෝ කාණ්ඩ වශයෙන් ස්වර අභ්‍යාස ගායනයට යොමු කර සදොස් තැන් නිදොස් කරන්න. අගයන්න.
- ගුරුවරයා **ආකාරයෙන්** ඉදිරිපත් කරනු ලබන ස්වර කුමන ස්වරදැයි, හඳුනා ගැනීමට හැකි වන සේ අභ්‍යාසයක යොදන්න.

(මිනිත්තු 05)

**පසුවැඩ** : ස්වරපුවරු භාණ්ඩයක් වාදනය සමග ස්වර අභ්‍යාස ගායනයට හුරු වීමට මග පෙන්වන්න.

**අතිරේක උදව්** : නිදහස් කාලවල දී කෝමළ ස්වර සහිතව ස්වර සප්තකය ගායනයට යොමු කරන්න.

# මෙලෝඩිකා, ග්ලොකන් ස්පීල්, විද්‍යුත් ස්වර පුවරුව , මවුත් ඕගන් (හාර්මෝනියම්) රෙකෝඩර් ෆ්ලුට් හාර්මෝනියම් වැනි භාණ්ඩ අතරින් එකක් සරල ව වාදන හුරුව සහ සාමූහික ක්‍රියාකාරකම්

**නිපුණතාව 2.0** : වාද්‍ය භාණ්ඩයන්හි ස්වරූපය වටහාගනිමින් වාදන හැකියා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 2.1** : සරල සංගීත භාණ්ඩ මගින් ක්‍රීඩාමය අත්දැකීම් ලබයි. වාදන කුසලතා වර්ධනය කර ගනී.

**ක්‍රියාකාරකම** : මෙලෝඩිකා, ග්ලොකන් ස්පීල්, විද්‍යුත් ස්වර පුවරුව , මවුත් ඕගන් (හාර්මෝනියම්) රෙකෝඩර් ෆ්ලුට් හාර්මෝනියම් වැනි භාණ්ඩ අතරින් එකක් සරල ව වාදන හුරුව සහ සාමූහික ක්‍රියාකාරකම්

**කාලච්ඡේද සංඛ්‍යාව** : 03

**ඉගෙනුම් පල** :

- පහසුවෙන් පරිහරණය කළ හැකි සංගීත භාණ්ඩ හඳුනා ගනියි.
- එම භාණ්ඩයන්හි ස්වර පිහිටන ආකාරය වටහා ගනියි.
- එම භාණ්ඩයන්හි ස්වර සප්තක හා සරල ව වැයීමට හැකියාව ලබා ගනියි.
- මෙම භාණ්ඩ වාදනයේ ඇති පහසුතා වටහා ගනියි.
- මෙම භාණ්ඩ වාදනය තුළින් සම්භාව්‍ය සංගීත භාණ්ඩ වාදනයේ ඇල්මක් ඇති කර ගනියි.
- ක්‍රීඩාමය අත්දැකීමක් ලෙසින් භාණ්ඩ වාදනයේ හුරුව ලබයි.

**ගුණාත්මක යෙදවුම් :**

- මවුත්ඕගන්, රෙකොඩර්, ෆ්ලුට්, ග්ලොකන්ස්පීල්, ළමා විදුලි ඕගන් අතරින් කිහිපයක්.
- එම වාද්‍ය භාණ්ඩයකින් වැයෙන සංගීත ඛණ්ඩයක් අඩංගු සීඩී තැටියක් හෝ කැසට් පටයක් හා යන්ත්‍රයක් මෙම සංගීත භාණ්ඩයන්හි ස්වර පිහිටීම දැක් වූ දෘශ්‍ය උපකරණයක්.
- වාදන ඉරියව් දක්වා සකසා ගත් දෘශ්‍ය උපකරණ.
- සරල තාල වාද්‍ය භාණ්ඩයක්.

**ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස් :**

සංගීත විෂය ධාරාව මුලින් ම හඳුනාගන්නා 6 ශ්‍රේණියේ සිසුන්ට මෙම භාණ්ඩ ඇසුරු කිරීමට හුරු කිරීමට පුරුදු පුහුණු කර ඇත. මෙම ක්‍රියාකාරකම සඳහා කාලඡේද 3 ක් වෙන් කර ඇති බැවින් ක්‍රියාකාරකම් 3 ක් සිදු කිරීම වඩාත් යෝග්‍ය වනු ඇත.

එමෙන් ම සංගීත භාණ්ඩ වෙන වෙන ම කණ්ඩායම් කර ගත යුතු ය.

දැනටමත් මෙම සංගීත භාණ්ඩ වර්ග බොහොමයක් සිසුන් විසින් මිල දී ගෙන තිබිය හැකිය. 6 වැනි ශ්‍රේණියේ දී අනුගමනය කළ පිළිවෙල මෙම ශ්‍රේණියේ දී ද භාවිත කළ හැකිය. මේ සඳහා පහත දැක්වෙන යොදා ගැනීම පලදායි වේ.

දියගොඩ හැම තැන කිරි ඉතිරේ.
ඕලු පිපීලා විල ලෙල දෙනවා.
මල් පිබිදීගෙන එන්නේ
අකුරු මැකී නෑ.
සුවඳ පත්ම ඕලු ආදී.

මෙම ක්‍රියාකාරකම ආරම්භ කිරීමට සතියකට දෙකකට පෙර මෙම භාණ්ඩ සපයා ගැනීමට සිසුන්ට උපදෙස් ලබාදීම සුදුසුය.

**පාඩම සංවර්ධනය :**

**පියවර 01**
- 6 ශ්‍රේණියේ දී අධ්‍යයනය කළ ගීතයක් සාමූහිකව වාදනය කරන්න. මෙම භාණ්ඩ වාදනය කිරීම පහසු බව සිසුන් සමග සාකච්ඡා කරන්න. (මි.10)

**පියවර 02**
- සංගීත භාණ්ඩවලට අදාළ දෘශ්‍ය උපකරණ (ස්වර ප්‍රස්තාර) එම කණ්ඩායම් වෙත ලබා දී ඒ පිළිබඳ අධ්‍යයනය සඳහා ඔවුන් පොළඹවන්න.
- ගුරුවරයා එක් එක් කණ්ඩායම් වෙත ගොස් ඔවුන්ට උදව් ලබා දෙන්න. (මි. 30)

**පියවර 03**
- එක් කාලඡේදයකට එක ඇමුණුම බැගින් ලබා දී සිසුන් කණ්ඩායම් වශයෙන් වාදනය කරවන්න.
- ගුරුවරයා සරල තාල අවනද්ධ භාණ්ඩයක් වයමින් සිසුන් නැවත නැවත අභ්‍යාස කරන්න.
- එක් එක් කණ්ඩායම් සම්පූර්ණ ස්වර ප්‍රස්තාර වාදනය කිරීමට පොළඹවන්න. (මි.70)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

වඩාත් හොඳ වාදක කණ්ඩායම හෝ සිසුන් තෝරා ඉදිරියට කැඳවා වාදනය කිරීමට සලස්වා ඔවුන් අගයන්න. (මි.10)

**පසු අභ්‍යාස :** සරල ස්වර ප්‍රස්තාර වාදනය සඳහා සිසුන් උනන්දු කරවන්න. ස්වර ස්ථාපන ගී, සරල ළමා ගී ආදියෙහි ප්‍රස්තාර සොයා ගැනීමෙහි සිසුන් පොළඹවන්න. විවේකය සංගීත භාණ්ඩය සමග ගත කිරීමට ඔවුන් යොමු කරන්න.

**අතිරේක උදව් :** 2007 ප්‍රතිසංස්කරණ හා සම්බන්ධ ගුරු මාර්ගෝපදේශවල සටහන් කර ඇති ස්වර ස්ථාපන ගීත, ළමා ගීත ආදිය ප්‍රස්තාර භාවිත කරන්න.

A කණ්ඩායම - Harmonica (මවුත් ඕගන්)
B කණ්ඩායම - ග්ලොකන් ස්පිල් - Organ (bell Dulcimer / Xylaphone tone select කරන්න.)
C කණ්ඩායම - Melodica, Harmonium
D කණ්ඩායම - Recorder, flute

# තෝරා ගත් භාණ්ඩයන් හි ගී අනුවාදන හා ඒවායේ ස්වභාවය

**නිපුණතාව 3.0** : සංගීත රසාස්වාදයේ යෙදෙමින් ජීවිතයේ සතුට හා බැඳි මානසික තත්ත්වයන් ලබා ගැනීමට හුරුවෙයි.

**නිපුණතා මට්ටම 3.1** : ගී අනුවාදන ශ්‍රවණය කරයි.

**ක්‍රියාකාරකම 3.1.1** : තෝරා ගත් භාණ්ඩයන් හි ගී අනුවාදන හා ඒවායේ ස්වභාවය

**කාලච්ඡේද** : 01

**ඉගෙනුම් පල** :
- ගී අනුවාදන ශ්‍රවණය කර භාණ්ඩය හඳුනා ගනියි.
- ගීතයේ වචන ශ්‍රවණය වන පරිදි වාදනය කළ හැකි බව වටහා ගනියි.
- ගී අනුවාදනයෙහි යෙදීමට පෙළඹෙයි.

**ගුණාත්මක යෙදවුම්** :
- ගී අනුවාදන ඇතුළත් CD/VCD හෝ DVD තැටි.
- CD//DVD/VCD තැටි ක්‍රියා කිරීමට CD//DVD/VCD ප්ලේයර් එකක්.
- ඇමුණුම 1 ඇතුළත්ව සැකසූ දෘශ්‍යාධාරය
- ඇමුණුම 2 ඇගයීම සඳහා සැකසූ විවිධ භාණ්ඩයන්ගෙන් වයන ගී අනුවාදනවල කොටස් ඇතුළත් CD//DVD/VCD එකක්.

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස්** :

සංගීතය ශ්‍රවණය කිරීමෙන් මිනිස් මනස සුවපත් වන බව ලොව සුපතල කරුණක් බැවින්, සංගීතය ශ්‍රවණය කිරීමෙන් සිසුනගේ මානසික තත්ත්වය දියුණු කොට සිත සැහැල්ලු කර ගැනීමට හා සිය ජීවිතය තුළ අර්ථවත් සතුටක් ලැබීමට සිසුන් පෙළඹවීම මෙම පාඩමින් අපේක්ෂිතය. එමෙන්ම ගී අනුවාදනය කිරීමේ දී ද ගීතයේ වචන ශ්‍රවණය වන අයුරින් වාදනය කළ හැකි බව නිදර්ශන මගින් පෙන්වා දිය යුතුය. මේ සඳහා VCD හෝ DVD යොදා ගැනීම සාර්ථකය. විවිධ භාණ්ඩයන්හි නාදයෙහි වෙනස හඳුනා ගැනීමට සිසුන් පෙළඹවිය යුතු යි. ගීත වාදනයට සිසුනගේ කැමැත්ත දියුණු කළ යුතු යි.

**පාඩම සංවර්ධනය** :

**පියවර 01**
- ගීතයෙහි නම නොදන්වා ජනප්‍රිය ගීතයක් ඔබ විසින් වාදනය කර ශ්‍රවණයට සලස්වන්න.
- එම ගීතය කුමක්දැයි විමසන්න.
- ගී අනුවාදන පිළිබඳව හා ඒවා ශ්‍රවණය කිරීමෙන් ජීවිතයට එක් කර ගත හැකි පලයන් පිළිබඳව සාකච්ඡා කරන්න.

(මිනිත්තු 05)

**පියවර 02**
- සිසුන් සැහැල්ලු අයුරකින් අසුන් ගැනීමට උපදෙස් දෙන්න.
- තෝරා ගත් ගී අනුවාදන කිහිපයක් (කාලය අනුව) ශ්‍රවණයට සලස්වන්න.
- ඇමුණුම 1 හි සඳහන් පත්‍රිකාව ප්‍රදර්ශනය කොට එයට පිළිතුරු ලිවීමට සලස්වන්න.

(මිනිත්තු 20)

**පියවර 03**
- කාලය අනුව සියලුම සිසුන්ගේ හෝ තෝරා ගත් පිළිතුරු කීපයක් හෝ ගෙන කියවන්න.

- එකිනෙකට විවිධ වූ පිළිතුරු පිළිබඳව සිසුනගේ අදහස් විමසමින් සාකච්ඡා කරන්න. (සිසුනගේ රස වින්දනය හා විචාරශීලී බව ඔප්නැංවෙන සේ සාකච්ඡාව මෙහෙයවන්න).
- ඇමුණුම 2 - ඇගයීම සඳහා සැකසූ විවිධ භාණ්ඩයන්ගෙන් වයන ගී අනුවාදනවල කොටස් ඇතුළත් CD//DVD/VCD ශ්‍රවණයට සලස්වා ඇගයීමට ලක් කරන්න.

(මිනිත්තු 10)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

විවිධ භාණ්ඩයන්ගෙන් වැයූ ගීත කොටස් ඇසීමට සලස්වා වයන භාණ්ඩය හඳුනා ගෙන නම් කිරීමට සලස්වා ඇගයීමට සලස්වන්න. (ඇමුණුම 2)

(මිනිත්තු 05 )

**පසුවැඩ** : නිවසේ දී ගී අනුවාදන 2 ක් හා ඊට වැඩි ගණනක් සොයා ශ්‍රවණය කොට ඒ පිළිබඳව ඔවුනගේ අදහස් ලියා ගෙන ඒමට සලස්වන්න.

**අතිරේක උදව්** : ගී අනුවාදන ඇතුළත් CD//DVD/VCD තැටි, අන්තර්ජාලය

**ඇමුණුම 01**

| 01 | ගීතයේ මුල් පාදය | ගී අනු වාදනය වයන භාණ්ඩයේ නම | තෝරා ගත් ගීතයට භාණ්ඩයේ හඬ ගැලපීම | වාදනය පිළිබඳ ඔබට සිතෙන දේ ඔබේ වචනයෙන් ලියන්න |
|---|---|---|---|---|
| 02 | | | | |
| 03 | | | | |
| 04 | | | | |
| | | | | |

weuqKqu 02

විවිධ භාණ්ඩයන්ගෙන් වයන ගී අනුවාදනවල කොටස් ඇතුළත් CD//DVD/VCD එකක්.

# තෝරා ගත් භාණ්ඩයේ ස්වභාවය හා ස්වර පිහිටීම

**නිපුණතාව 2.0** : වාද්‍ය භාණ්ඩයන්හි ස්වරූපය වටහා ගනිමින් වාදන හැකියා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 2.2** : සම්භාව්‍ය සංගීත භාණ්ඩ වාදනයේ මූලික හැකියා වර්ධනය කර ගනියි.

**ක්‍රියාකාරකම** : තෝරා ගත් භාණ්ඩයේ ස්වභාවය හා ස්වර පිහිටීම

**කාලච්ඡේද** : 01

**ඉගෙනුම් පල** :
- භාණ්ඩයේ ස්වරූපය වටහා ගනියි.
- ස්වර පිහිටීම වටහා ගෙන ස්වර අෂ්ටකය වාදනය කරයි.

**ගුණාත්මක යෙදවුම්** :
- භාණ්ඩයන්ගේ ස්වර පිහිටන ස්ථාන ලකුණු කර ඇති දෘශ්‍යාධාර
- සිසුන් විසින් සපයා ගත් සංගීත භාණ්ඩ
- සිසුන් අතැති භාණ්ඩයේ ස්වභාවය පෙන්වන දෘශ්‍යාධාර

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස්** :

තෝරා ගත් භාණ්ඩයේ ස්වභාවය හා ස්වර පිහිටීම පිළිබඳව අවබෝධ කරලීම මෙහි අපේක්ෂාවයි. භාණ්ඩයේ ස්වභාවය පිළිබඳව අවබෝධය ලබා දිය හැකි පරිදි සැකසූ දෘශ්‍යාධාර භාවිත කර ඒ පිළිබඳව ඉතා කෙටියෙන් අවබෝධ කරවන්න. මෙහි දී ස්වර පිහිටීම ඉගැන්වීම ප්‍රධාන වශයෙන් අපේක්ෂිත ය. මේ වන විටත් සිසුන් අධ්‍යයනය කර ඇති ස්වර 12 පිහිටීම නැවත සිහිපත් කොට ක්‍රියාකාරකම සැලසුම් කරගන්න.

**පාඩම සංවර්ධනය** :

**පියවර 01**
- සිසුන් හොඳින් හඳුනන ගීතයක් ඔබට හැකි භාණ්ඩයකින් ස්වර ස්ථාන නිවැරදිව වයන්න.
- ගීතය ශ්‍රවණය වූ ආකාරය පිළිබඳව විමසන්න.
- නිවැරදිව ගීතය ශ්‍රවණය වීමට නිවැරදි ස්වර ස්ථානයන්හි වැදගත්කම පහදන්න.

(මිනිත්තු 10)

**පියවර 02**
- සිසුන් අතැති භාණ්ඩයේ ස්වභාවය පෙන්වන දෘශ්‍යාධාර ප්‍රදර්ශනය කොට ඒ පිළිබඳව සාකච්ඡා කරන්න.
- එක් එක් සිසුවා තෝරා ගත් භාණ්ඩයේ ස්වර පිහිටීම නැවත පැහැදිලි කරන්න.
- අවශ්‍ය උපදෙස් ලබා දෙමින් නිරතුරුවම නිවැරදි කරන්න.
- තෝරා ගත් භාණ්ඩයෙන් ස්වර අෂ්ටකය වාදනය කරවන්න.

(මිනිත්තු 15)

**පියවර 03**
- තෝරා ගත් සංගීත භාණ්ඩයේ දළ රූප සටහනක් ඇඳ ශුද්ධ ස්වර 7 පිහිටන අයුරු පැහැදිලි කිරීමට අවස්ථාව දෙන්න.
- සිසුන් සටහන් කළ පත්‍රිකා නිරීක්ෂණය කොට අගයන්න.
- සදොස් තැන් නිවැරදි කරන්න.

(මිනිත්තු 10)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

තම තමන්ගේ සංගීත භාණ්ඩවල ශුද්ධ ස්වර 7 පිහිටන ස්ථාන පැහැදිලි කිරීමට අවස්ථාව ලබා දී අගයන්න. ( මිනිත්තු 05 යි )

**පැවරුම** : පන්ති කාමරයේ දී ලකුණු කරන ලද්දේ ස්වර අෂ්ටකය පමණක් බැවින් ඉතිරි ස්වර ස්ථාන හඳුනා ගැනීමට අවශ්‍ය උපදෙස් ලබා දෙන්න.

**අතිරේක උදව්** : සංගීත භාණ්ඩයන්ගේ විස්තර සහිත පොත්

# වාද්‍ය භාණ්ඩයෙන් තාලානුකූල ස්වර අභ්‍යාස වාදනය

**නිපුණතාව 2.0** : වාද්‍ය භාණ්ඩයන්හි ස්වරූපය වටහා ගනිමින් වාදන හැකියා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 2.2** : සම්භාව්‍ය සංගීත භාණ්ඩ වාදනයේ මූලික හැකියා වර්ධනය කර ගනියි.

**ක්‍රියාකාරකම** : වාද්‍ය භාණ්ඩයෙන් තාලානුකූල ස්වර අභ්‍යාස වාදනය

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල** :
- ශුද්ධ ස්වරඅභ්‍යාස වාදනය කරයි.
- තාලානුකූල රිද්ම රටා හඳුනා ගනියි.
- ස්වරස්ථාන නිවැරදිව වැයීමට හුරු වෙයි.
- නිවැරදි ඉරියව්වෙන් වාදනය කරයි.

**ගුණාත්මක යෙදවුම්** :
- සිසුන්ගේ වාද්‍ය භාණ්ඩ
- තාලානුකූල ස්වර අභ්‍යාස ලියූ දෘශ්‍ය උපකරණ

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස්** :

ශුද්ධ ස්වර අෂ්ටකය වාදනය කිරීමේ හැකියාව ඇති දරුවන්ගේ ස්වර සාධන මට්ටම තව දුරටත් දියුණු වන අයුරින් මෙම පාඩම සැලසුම් කිරීම අපේක්ෂිතයි. ඔබ පාසලේ දරුවනට ගැළපෙන අයුරින් තාලානුකූල ශුද්ධ ස්වර අභ්‍යාසයන් තෝරා ගන්න. ඔබට තාලානුකූල ශුද්ධ ස්වර අභ්‍යාසයන් නිර්මාණය කර ගැනීමේ හැකියාව ද ඇත. එකම අභ්‍යාසය වුව විවිධ භාණ්ඩයන්ට ගැළපෙන අයුරින් සැකසීම අත්‍යාවශ්‍යය.

වාද්‍ය භාණ්ඩය හැසිරවීමේ නිවැරදි ඉරියව්, නිවැරදි ස්වර සාධනය වැනි කරුණු පිළිබඳව සොයා බලමින් නිරතුරුවම සිසුනට අවශ්‍ය උපදෙස් ලබා දෙන්න.

**පාඩම සංවර්ධනය** :

**පියවර 01** මීට පෙර පාඩමෙහි සිසුන් විසින් වාදනයට පුහුණු කළ ස්වර අෂ්ටකය නැවත වාදනයට සලස්වමින් පාඩමට පිවිසෙන්න. වාදනය ප්‍රගුණ කිරීමේ දී ස්වර අභ්‍යාසයන්ගේ වටිනාකම සිසුන්ට වටහා දෙන්න.

(මිනිත්තු 10)

**පියවර 02**
- සිසුනට ගැළපෙන අයුරින් ඔබ විසින් සැකසූ තාලානුකූල ස්වර අභ්‍යාස සිසුන් අතට පත් කොට පුහුණු වීමට යොදවන්න.
- නිවැරදි ස්වර සාධනය, නිවැරදි ඉරියව්, තාලානුකූලව වාදනය කිරීම වැනි කරුණු පිළිබඳව නිරතුරුවම සොයා බලා අවශ්‍ය උපදෙස් ලබා දෙන්න.

(මිනිත්තු 30)

**පියවර 03** • කණ්ඩායම් වශයෙන් හෝ ඒකලව වාදනයට සලස්වා ඇගයීමට ලක් කර අවශ්‍ය ප්‍රතිපෝෂණයන් ලබා දෙන්න.

(මිනිත්තු 20)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

ඔබ විසින් වාදනයට පුහුණු වීම් සඳහා ලබා දුන් අභ්‍යාසයන්ට අමතරව සරලව ගොඩනැගූ ස්වර අභ්‍යාස කිහිපයක් දී ඇගයීමට ලක් කරන්න. වාද්‍ය භාණ්ඩය හැසිර වීමේ නිවැරදි ඉරියව්, නිවැරදි ස්වර සාධනය යන කරුණු ඇගයීමට ලක් කරන්න. (මිනිත්තු 20)

**පැවරුම** : නිවසේ දී පුහුණු වීමට අභ්‍යාස ලබා දෙන්න.

# තෝරා ගත් භාණ්ඩයේ ගීත වාදනය

**නිපුණතාව 2.0** : වාද්‍ය භාණ්ඩයන්හි ස්වරූපය වටහා ගනිමින් වාදන හැකියා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 2.2** : සම්භාව්‍ය සංගීත භාණ්ඩ වාදනයේ මූලික හැකියා වර්ධනය කර ගනියි.

**ක්‍රියාකාරකම** : තෝරාගත් භාණ්ඩයේ ගීත වාදනය

**කාලච්ඡේද සංඛ්‍යාව** : 03

**ඉගෙනුම් පල** :
- ස්වර ප්‍රස්තාර කියවා වාදනය කරයි.
- තාලය පවත්වා ගනිමින් ගීත වාදනය කරයි.
- වාද්‍ය භාණ්ඩයේ නිවැරදි ඉරියව් පවත්වා ගෙන ගීත වාදනය කරයි.
- පාසලේ සියලු උත්සවයන්හි ඉදිරියෙන් සිටින සිසුවකු බවට පත්වෙයි.

**ගුණාත්මක යෙදවුම්** :
- ශුද්ධ ස්වර සහිත ගීතයක ප්‍රස්තාරයක් සහිත දෘශ්‍යාධාරයක්
- සිසුන් විසින් සපයා ගත් සංගීත භාණ්ඩ

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස්** :

නිවැරදි ස්වර සාධනය, නිවැරදි ඉරියව් හා තාලානුකූල ව වාදනය කිරීම යන කරුණු පිළිබඳව සැලකිලිමත් ව ශුද්ධ ස්වර සහිත ගීතයක් වාදනය කරවීම මෙම පාඩමින් අපේක්ෂිතය. ඔබ පාසලේ සිසුනගේ දක්ෂතාවය අනුව ගීත සංඛ්‍යාව වැඩි කිරීමේ නිදහස ඔබ සතුව ඇත. කාලච්ඡේද 02 සමීපව යෙදී ඇති දිනක පාඩම අරඹන්න. ඇගයීම තෙවන කාලච්ඡේදයට යොදා ගන්න.

පාඩම සංවර්ධනය :

පියවර 01
- ගුරුවරයා වශයෙන් ඔබට වාදනය කළ හැකි භාණ්ඩයකින් ගීතයක් වාදනය කර පාඩමට පිවිසෙන්න.
- වාදනය පුහුණුවීම සඳහා කැපවිය යුතු අයුරු පහදන්න.

(මිනිත්තු 10)

පියවර 02
- තෝරා ගත් ගීතය / ගීත ලබා දී පුහුණු වීමට යොමු කරන්න.
- නිවැරදි ස්වර සාධනය, තාලානුකූල බව පවත්වාගෙන යෑම හා වාද්‍ය භාණ්ඩයේ නිවැරදි ඉරියව් පවත්වා ගෙන යෑම සඳහා අවශ්‍ය උපදෙස් නිරතුරුව ලබා දෙන්න.

(මිනිත්තු 70)

පියවර 03
- තනි තනිව හෝ භාණ්ඩ අනුව කණ්ඩායම් කර හෝ වාදනය කර පෙන්වීමට සලස්වන්න.
- අවශ්‍ය උපදෙස් සපයමින් අගයන්න. (මිනිත්තු 25)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්** :

ස්වර ස්ථාන තාල හා නිවැරදි ඉරියව් පවත්වා ගනිමින් භාණ්ඩ වාදනය කළ සිසුන් ඇගයීමට ලක් කරන්න. (මිනිත්තු 15)

පැවරුම : සරල ගීත කීපයක් ලබා දී දිනපතා පුහුණු වීමට උපදෙස් දෙන්න.

අතිරේක උදව් : ගීත ප්‍රස්තාර සහිත පොත්

# ප්‍රස්තාරකරණයේ විශේෂිත අවස්ථා (සමග්‍රහ, විෂමග්‍රහ, අවග්‍රහ)

**නිපුණතාව 8.0** : සංකේතානුසාරයෙන් සංගීතය ලියා දක්වන විධි හඳුනා ගනිමින් සංගීත කෘති ඇසුරු කිරීමටත් දේශීය සංගීතාංග ලෝකය වෙත යොමු කිරීමටත් අත්‍යාවශ්‍ය මූලික නිපුණතා වර්ධනය කර ගනී.

**නිපුණතා මට්ටම 8.1 :** පෙරදිග ප්‍රස්තාරකරණයේ විශේෂතා දක්වයි.

**ක්‍රියාකාරකම** : ප්‍රස්තාරකරණයේ විශේෂිත අවස්ථා (සමග්‍රහ, විෂමග්‍රහ, අවග්‍රහ)

**කාලච්ඡේද සංඛ්‍යාව :** 03

**ඉගෙනුම් පල** :
- ප්‍රස්තාරකරණයේ ආරම්භක ස්ථානය ග්‍රහය ලෙස පැහැදිලි කරයි.
- විවිධ ග්‍රහ අවස්ථාවන් නම් කරයි.
- ඒ සඳහා උචිත ගී පාද ඉදිරිපත් කරයි.
- ග්‍රහයන් දෙඅත්ලෙන් පෙන්වමින් එම ගීත ගයයි.

**ගුණාත්මක යෙදවුම් :**
- ස්වර පුවරු සංගීත භාණ්ඩයක් සහ ග්‍රහ වර්ග තුනට අයත් පද හා ස්වර ප්‍රස්තාර ලියන ලද දෘශ්‍යාධාරයක්
- සකස් කරන ලද කාර්ය පත්‍රිකා අංක 01 හි පිටපත් කිහිපයක්

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

සයවන ශ්‍රේණියේ දී මූලික රිද්ම රටා මත ගොඩ නැගුණු තාල පද හා මූලික තාල මත ගොඩ නැගුණු පද ප්‍රස්තාර ආදියෙන් සිසු/සිසුවියන් පෙරහුරුවක් ලබා ඇත. එහෙයින් ''...ග්‍රහ...'' යන පාරිභාෂික වදනෙහි අර්ථය 7 ශ්‍රේණියේ සිසු දරුවනට පැහැදිලි කිරීම එතරම් අසීරු නොවනු ඇත. ග්‍රහය යනු ග්‍රහණය කිරීමේ අරුත දක්වෙන්නකි. (අල්ලා ගැනීම) ගීතයක් හෝ වාදිතයක් එසේ ග්‍රහණය කර ගත හැකි ක්‍රමවේද 03 ක් ඇති බව සිසුනට පැහැදිලි කර දිය යුතුය. ඒ සඳහා සාම්ප්‍රදායික ආඝාතාත්මක පැදි හෝ ගීත යොදා ගැනීම පහසු වේ.

**පාඩම සංවර්ධනය :**

**පියවර 01**
- ග්‍රහ වර්ග 3 ට අයත් පද හා ස්වර ප්‍රස්තාර ලියන ලද දෘශ්‍යාධාරය පන්තියට ප්‍රදර්ශනය කරන්න.
- /පිනවන/දුටුදන/සෑ- - -/ම- - - / පැදි පාදය ඔබ ගයා වයා දක්වන්න. එහි තාලයට අත් තැලීමට සිසුන් පොළඹවන්න. සිසුන්ට එම පැදි පාදය ගයමින් අත් තැලීමට උපදෙස් දෙන්න.
- /+රළලාs/ උපුලාs/+ලෙළුමතු/ලාsයාs/ මෙම පැදි පාදය ද ඔබ ගයා වයා දක්වන්න. එහි තාලයට අත් තැලීමට සිසුන් පොළඹවන්න. සිසුන් ට එම පැදි පාදය ගයමින් අත් තැලීමට උපදෙස් දෙන්න.
- හෙ ල/ ජාsති ක/අ හි මාs/නේsss/ මෙම ගී පාදයද ඔබ ගයා වයා දක්වන්න. එහි තාලයට අත් තැලීමට සිසුන් පොළඹවන්න. සිසුන් ට එම පැදි පාදය ගයමින් අත් තැලීමට උපදෙස් දෙන්න.

(මිනිත්තු 10)

පියවර 02 • ගී පාද තුනෙහි ආඝාතය පිහිටන ස්ථාන පිළිබඳව සිසුන්ගෙන් විමසන්න. ග්‍රහයන් පැහැදිලි කරමින් සිසුන් හා සාකච්ඡාවක් ගොඩ නගන්න.

• මේ සඳහා ඇමුණුම 01 හි සඳහන් කාර්ය පත්‍රිකාව යොද ගන්න.

(මිනිත්තු 70)

පියවර 03 • පන්තියේ කණ්ඩායම් කිහිපයක් අතර කාර්ය පත්‍රිකා බෙදා දී එම කාර්යයේ සිසුන් යොදවන්න.

• ඇමුණුමේ සඳහන් ගීත ඔබ විසින් ස්වර පුවරුවක් ආධාරයෙන් රසවත් ව ගායනය කරන්න. (මිනිත්තු 30)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

සමග්‍රහ, අවග්‍රහ, විෂම ග්‍රහ අර්ථවත් වන සේ සටහනක් පිළියෙල කරවන්න.

(මිනිත්තු 00)

**අතිරේක උදව් :** හෙළ ගී මග - ඩබ්.බී. මකුලොළුව ශූරීන්

**ඇමුණුම 02**

පහත සඳහන් ගීත ලැයිස්තුවේ ගීත සමග්‍රහ, අවග්‍රහ හා විෂම ග්‍රහයන්ගෙන් යෙදෙයි. ගුරුවරයා විසින් සරලව ගායනය කරනු ලබන ගීත හොඳින් සවන් දී කාර්ය පත්‍රිකාවේ සඳහන් වගුවෙහි සටහන් කරන්න.

01. දුර පෙනෙන තැනිතලා
02. පෙරදිග මුතු ඇටයයි මේ
03. සසර වසන තුරු
04. හෙළ ජාතික
05. ගලන ගඟකි ජීවිතේ
06. අම්මා සඳකි
07. ලංකා ලංකා
08. මට මැණිී වගේ
09. සාධු දන්තදා

**කාර්ය පත්‍රිකා අංක 01**

| සම ග්‍රහ | අව ග්‍රහ | විෂම ග්‍රහ |
|---|---|---|
| | | |
| | | |
| | | |

පැවරුම : විවිධ ව්‍යවහාරික ගීතයන්හි ආඝාත ස්ථානයන් සොයා බැලීමට උපදෙස් දෙන්න.

# නූර්ති ගීත ගායනය

**නිපුණතාව 6.0** : රංග සම්ප්‍රදායන්හි විශේෂතා අධ්‍යයනය කරමින්, සංගීතමය ලක්ෂණ පිළිබඳ ප්‍රායෝගික අත්දැකීම් ලබයි.

**නිපුණතා මට්ටම 6.2** : නූර්ති ගීත ගායනය කරයි.

**ක්‍රියාකාරකම** : නූර්ති ගීත ගායනය

**කාලච්ඡේද** සංඛ්‍යාව : 01

**ඉගෙනුම් පල** :
- නූර්ති ගීත ගායනය කරයි.
- ප්‍රචලිත නූර්ති ගීත එකතු කරයි.
- නූර්ති ගීත ශ්‍රවණයට කිරීමට කැමැත්තක් දක්වයි.

**ගුණාත්මක යෙදවුම්**:
- ගීතය ලියූ දෘශ්‍යාධාරකය
- සර්පිනාව, තබ්ලාව, වයලීනය, බටනලාව

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

7 ශ්‍රේණියේ දී නූර්ති ගී තුනක් සිසුන්ට අධ්‍යයනය කිරීමට ඉඩ සැලසේ. මේ වන විට ''..අඹ දඹ නාරං,''යන ගීත සිසුන් අධ්‍යයනය කර ඇත. මෙම පාඩමේ දී නීතිඥ ජෝන්ද සිල්වා සූරීන්ගේ ශ්‍රී වික්‍රම නූර්තියේ එන ''දන්න වංහුං අප'' ගීතය ඉගැන්වීම අපේක්ෂා කෙරේ. එම ගීතය පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න. නූර්ති ගී රාගධාරී සංගීතය ආශ්‍රයෙන් නිර්මිත ගීත විශේෂයක් නිසා මෙම ගීතය සඳහා බමාජ් රාගය ආශ්‍රය කරගෙන ඇති බව පෙනේ. ඒ පිළිබඳ සිසුන් දක්වන ඇල්ම රාගධාරී සංගීතය කෙරෙහි නැඹුරු කිරීමට හේතුවක් වේ.

පාඩම සංවර්ධනය :

**පියවර 01**
- I වාරයේ දී ඉගෙන ගත් නූර්ති ගීතය ගායනය කිරීමට අවස්ථාව ලබා දෙන්න. (මිනිත්තු 05)

**පියවර 02**
- ''..දන්න වංහුං අප....'' ගීතය ලියූ දෘශ්‍යාධාරකය ප්‍රදර්ශනය කරන්න.
- ගුරුවරයා ගීතය රසවත්ව ගායනය කරමින්, සිසුන්ට ශ්‍රවණය කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- ස්ථායී හා අන්තරා කොටස් පාදයෙන් පාදය ගයා, නාදමාලාව තහවුරු වන තෙක් ගායනය කරවන්න (මිනිත්තු 20)

**පියවර 03**
- කේවලව හා කණ්ඩායම් කර ගීතය ගායනය කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- I වෙනි වාරයේ උගත් නූර්ති ගීතය අහඹු ලෙස ගායනය කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- සිසුන් ගීත ඉදිරිපත් කරන විට ගුරුවරයා වාදනයෙන් සහාය ලබා දෙන්න.
- නූර්ති ගීවල අගය සාකච්ඡා කරන්න.

(මිනිත්තු 10 )

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

නිවැරදි ශ්‍රැතියට හා තාලානුකූලව මිහිරිව ගායනය කළ කණ්ඩායම හා තනි තනිව ගැයූ සිසු/සිසුවියන් තෝරා අගය කරන්න. ( මිනිත්තු 05 )

පැවරුම: වාර දෙකේදීම උගත් නූර්ති ගී කණ්ඩායම් වශයෙන් ඉදිරිපත් කිරීමට සිසුන් යොමු කරන්න.

අතිරේක උදව්: නූර්ති ගීත ශතකය - සංස්කෘතික අමාත්‍යාංශය

# කෝලම් ගීත ගායනය සමග සරලව රංගනය කිරීම

**නිපුණතාව 6.0** : රංග සම්ප්‍රදායන්හි විශේෂතා අධ්‍යයනය කරමින් සංගීතමය ලක්ෂණ පිළිබඳ ප්‍රායෝගික අත්දැකීම් ලබයි.

**නිපුණතා මට්ටම 6.1** : ගැමි නාටක ගී ගයමින් අගය කරයි.

**ක්‍රියාකාරකම** : කෝලම් ගීත ගායනය සමග සරලව රංගනය කිරීම.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල** :
- කෝලම් ගීත ගායනය කරයි.
- කෝලම් නාට්‍ය චරිත හඳුනා ගෙන, ගීත ගයමින්, රංගනය කරයි.

**ගුණාත්මක යෙදවුම්:**
- ගීත ලියූ දෘශ්‍යාධාරක
- සර්පිනාව, පහතරට බෙරය, තාලම්පට
- කොළපතක්, නූල්, පැස්ටල්

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

පහතරට ජන නාට්‍ය විශේෂයක් ලෙස කෝලම් නාට්‍ය හැඳින්විය හැකි අතර, වෙස් මුහුණු භාවිත කරමින් රංගනයේ යෙදෙන බව පැහැදිලි කරන්න. හාස්‍ය රසය ජනිත කරවන මෙම නාට්‍ය ගීත ගායනයේ දී පහතරට බෙරය උපයෝගී කර ගන්නා බවත් සිසුන්ට පහදා දෙන්න. වෙස් මුහුණුක් සකසා ගත හැකි නම් වඩාත් ඵලදායි වේ.

පහත සඳහන් ගීත අතරින් සුදුසු ගීත ගායනයට යොදා ගන්න.

- ගම්වල සැම තැන ඇවිද ගොසින්නේ (චරිතය - ජසයා)
- ගම්භිර කාලිංග නුවර (චරිතය - ජසයා )
- මං වගෙ පේඩි කතක් මනා (චරිතය - ලෙන්චිනා)
- මව්පියො නිදහස් වෙන්නටා (චරිතය - ලෙන්චිනා)

**පියවර 01**
- සකස් කර ගත් කොළපත් වෙස් මුහුණ, පළඳා ගෙන, පන්ති කාමරයේ සරල රංගනයක්, ඉදිරිපත් කරන්න.
- රංගනය පිළිබඳ සිසුන්ගේ අදහස් විමසන්න.
- ඒ පිළිබඳව සාකච්ඡාවක් මෙහෙයවන්න. (මිනිත්තු 10)

**පියවර 02**
- ගීතය ලියූ දෘශ්‍යාධාරය පන්ති කාමරයේ ප්‍රදර්ශනය කරන්න.
- තෝරාගත් ගීතය පාදයෙන් පාදයට ගායනය කිරීමට පුහුණු කරවන්න.
- ගීත නාදමාලා තහවුරු වූවාට පසුව රංගනයත් සමග පුහුණු කරවන්න.
- පහතරට බෙරය වයමින්, කණ්ඩායම් වශයෙන් රංගනය පුහුණු කරවන්න.

(මිනිත්තු 30)

**පියවර 03**
- කණ්ඩායම් වශයෙන් රංගනයේ යෙදෙමින් ගීත ගායනය කිරීමට උපදෙස් දෙන්න.
- කණ්ඩායමෙන්ම අත්වැල් ගායක කණ්ඩායමක් සකස් කර ගෙන, ගීත ගායනයේ දී සහාය ලබා ගත හැකි බව ද සිසුන්ට උපදෙස් දෙන්න.

(මිනිත්තු 30)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

නිවැරදි ශ්‍රැතියේ පිහිටා නිවැරදි නාදමාලාව ගයමින් රංගනයේ යෙදුණ කණ්ඩායම තෝරා අගය කරන්න. (මිනිත්තු 10)

**පැවරුම :** ජසයා හා ලෙන්චිනාගේ චරිතවලට අදාළ චිත්‍ර ඇඳ, වෙනත් ගීත ද එකතු කර බිත්ති පුවත්පතක් සකස් කිරීමට උපදෙස් දෙන්න.

**අතිරේක උදව් :** ගැමි නාටකය - මහාචාර්ය එදිරිවීර සරත්චන්ද්‍ර 2008 -ගු.මා. - පිටු අංක 125-138

# ළමා ගීත අගය සහ ගීතයේ ප්‍රබලතාවය

**නිපුණතාව 4.0** : සරල සංගීතය හා බැඳි සංගීතාංග පිළිබඳ අත්දැකීම් ලබයි.

**නිපුණතා මට්ටම 4.1** : විද්‍යුත් මාධ්‍යයන්හි ප්‍රචලිත ළමා ගීත ගායන / වාදන

**ක්‍රියාකාරකම** : ළමා ගීත අගය සහ ගීතයේ ප්‍රබලතාවය

**කාලච්ඡේද** : 01

**ඉගෙනුම් පල** :
- ජන මාධ්‍ය මගින් හා ශ්‍රව්‍ය පට මගින් ඇසෙන ළමා ගීතවලට සවන් දෙයි.
- නිර්දේශිත ළමා ගීතය ගායනය කරයි.
- එම ගීතයෙන් ප්‍රකාශ වන අදහස පිළිබඳව සාකච්ඡා කරයි.
- ගීතයේ අදහසට ගැලපෙන නාද මාලාව සහ රිද්මයෙහි සරල බව අගය කරයි.
- එවැනි වෙනත් ළමා ගීත සෙවීමට පෙළඹේ.

**ගුණාත්මක යෙදවුම්:**
- ගීතය ඇතුළත් ශ්‍රව්‍ය පටය
- ස්වර වාද්‍ය භාණ්ඩයක්
- ගීතය ලියන ලද දෘශ්‍ය ආධාරකය

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

විද්‍යුත් මාධ්‍ය මගින් ප්‍රචාරය වන ළමා ගීත අතුරින් තෝරා ගත් ''කටු අකුලේ මල් ඇහැරේ'' නම් ගීතය ගායනයට පුහුණු කරවීම මෙම ක්‍රියාකාරකමෙන් අපේක්ෂා කෙරේ.

**පියවර 01**
- ගීතය ලියන ලද දෘශ්‍ය ආධාරකය ප්‍රදර්ශනය කරන්න.
- ගීතය ඇතුළත් ශ්‍රව්‍ය පටයට සවන් දීමට සලස්වන්න.
- එම ගීතය නැවත නැවත ශ්‍රවණයට යොමු කරවමින් සිසු අදහස් විමසන්න. (මිනිත්තු 05)

**පියවර 02**
- ගීතයෙහි නාද මාලාව, පද මාලාව (අදහස) රිද්මය පිළිබඳව සිසුන් සමග සාකච්ඡා කරන්න.
- ස්වර වාද්‍ය භාණ්ඩය උපයෝගි කර ගනිමින්, සිසුන් සමග ගීතය ගායනය කරන්න.
- කණ්ඩායම් වශයෙන් ගායනයට යොමු කරවමින් අතින් තාල් තබමින් ප්‍රසංගාත්මකව ගීතය ඉදිරිපත් කිරීමට අවස්ථාව සලස්වන්න. (මිනිත්තු 20)

**පියවර 03**
- වාදනය ද සමග සිසුන්ගේ අභිමතය පරිදි සාමූහිකව ගායනයට යොමු කරන්න. (මිනිත්තු 10)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

ඒකලව හෝ කණ්ඩායම් වශයෙන් ගීතය ගායනයට සලසා ඇගයීමක් කිරීමට මග පෙන්වන්න. (මිනිත්තු 05)

**පසුවැඩ :** විද්‍යුත් මාධ්‍යයෙන් ප්‍රචාරය වන ළමා ගීත රැස් කිරීමටත්, පොත් පිංචක් සකස් කිරීමටත් මග පෙන්වන්න.
පාසලේ උත්සව අවස්ථාවන්හි දී ප්‍රාසංගිකව ඉදිරිපත් කිරීමට තනි ව පුහුණු වීමට උපදෙස් දෙන්න.

# දරු නැළවිලි ගී ගායනය

**නිපුණතාව 4.0** : දේශීය ජන සංගීතාංග පිළිබඳ ප්‍රායෝගික හැකියා වර්ධනය කර ගනිමින්, සංස්කෘතික උරුමයන් රැක ගනියි.

**නිපුණතා මට්ටම 4.1** : ගැමි ගී පිළිබඳ සංස්කෘතික තොරතුරු විමසා ගායනය කරයි.

**ක්‍රියාකාරකම** : දරු නැළවිලි ගී ගායනය

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල** :
- දරු නැළවිලි ගීත හඳුනා ගනිමින් ගායනය කරයි.
- සාම්ප්‍රදායික නාදමාලාවන්ට අනුව ගීත ගායනය කරයි.

**ගුණාත්මක යෙදවුම්** :
- ගීත ලියූ දෘශ්‍යාධාරක
- සර්පිනාව, උඩැක්කිය, රබාන, තාලම්පට

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස්** :

දරුවන් නැළවීම සඳහා ගයන ගීත සෑම සමාජයකම පවතින බව සිසුන්ට පහදා දෙන්න. ශ්‍රී ලාංකේය නැළවිලි ගී තුළ දරුවන් නිදි කරවීමට සමත් නාද රටා ඇතුළත් වීම සුවිශේෂීතාවයක් බව සිසුන්ට පහදා දෙන්න. ගැමි බස් වහර, සරල නාද රටා, සීමිත ස්වර පරාසය වැනි ලක්ෂණවලින් යුක්ත වන බව සාකච්ඡා කරන්න.

- උඩු නියරෙන් වැටී ගෙනේ
- දෝයි අම්මා දෝයි දොයි දොයියෝ

සාම්ප්‍රදායික නාදමාලාවන් රැකෙන සේ, ගීත හා ස්වර ප්‍රස්තාර ද ගායනය කිරීමට කටයුතු සලසා ගන්න.

පාඩම සංවර්ධනය :

**පියවර 01**
- ''අතට වෙරළු ඇහිඳ ගෙනේ'' නම් දරු නැළවිලි ගීතයේ, පාද දෙකක වචන කාඩ්පත්වල ලියා පන්තියට ඉදිරිපත් කරන්න. අහඹු ලෙස සිසුන් කිහිප දෙනෙක් කැඳවා කාඩ්පත් නිරීක්ෂණය කර, ගී පාද අනුපිළිවෙලට සකස් කිරීමට උපදෙස් දෙන්න.
- අනුපිළිවෙලට සකස් කළ ගී පාද දෙක සිසුවෙක් හෝ සිසුවියක් කැඳවා ගායනය කිරීමට අවස්ථාව ලබා දෙන්න.

(මිනිත්තු 10)

**පියවර 02**
- දෘශ්‍යාධාරය මගින් ප්‍රදර්ශනය කරන පළමු ගීතය සිසුන්ට ශ්‍රවණය සඳහා ගායනය කර පෙන්වන්න.
- පාදයෙන් පාදය කිහිපවරක් නාදමාලාව තහවුරු කිරීම සඳහා ගායනය කරවන්න.
- ස්වර ප්‍රස්තාරය ද පාදයෙන් පාදය ගායනය කරවන්න.
- නියමිත ලයට නිවැරදි ව ගායනය කරවන්න.

(මිනිත්තු 30)

**පියවර 03**
- තෝරාගත් දෙවන ගීතය ගායනය කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- ස්වර ප්‍රස්තාරය ද ගායනය කිරීමට උපදෙස් දෙන්න.
- එක් කණ්ඩායමක් ගීත ගායනය කරන විට, සෙසු කණ්ඩායම්වලට ස්වර ප්‍රස්තාර ගායනය කිරීමට උපදෙස් දෙන්න.

(මිනිත්තු 30)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

දරු නැළවිලි ගීතය නිවැරදි ශ්‍රැතියට නිවැරදි නාද මාලාවට කේවලව හා කණ්ඩායම් වශයෙන් ඉදිරිපත් කළ සිසුන් කැඳවා අගය කරන්න.

(මිනිත්තු 10)

**පසුවැඩ** : දරු නැළවිලි ගීත ඇතුළත් ග්‍රන්ථ කියවීමට යොමු කරන්න.

**අතිරේක උදව්** :

හෙළ ගී මග - පිටු අංක 142 (ඉ)
හෙළ ගී මග - පිටු අංක 145 (අ)
වරම් ගී - 7 ශ්‍රේණිය ගුරු මාර්ගෝපදේශය - 2008

# රබන් ගී ගායනය

**නිපුණතාව 4.0** : දේශීය ජන සංගීතාංග පිළිබඳ ප්‍රායෝගික හැකියා වර්ධනය කර ගනිමින් සංස්කෘතික උරුමයන් රැක ගනියි.

**නිපුණතා මට්ටම 4.1** : ගැමි ගී පිළිබඳ සංස්කෘතික තොරතුරු විමසා ගායනය කරයි.

**ක්‍රියාකාරකම** : රබන් ගී ගායනය

**කාලච්ඡේද** : 02

**ඉගෙනුම් පල** :
- රබන් ගී හඳුනා ගනිමින් ගායනය කරයි.
- සාම්ප්‍රදායික නාදමාලාවන්ට අනුව ගීත ගායනය කරයි.
- රබන් ගී පිළිබඳ විශේෂතා වෙන් කර දක්වයි.
- රබන් ගීත අගයයි.

**ගුණාත්මක යෙදවුම්**:
- ගීත ලියූ දෘශ්‍යාධාරක
- සර්පිනාව, රබාන, තාලම්පට

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

අත් රබන් වාදනය කරමින්, ගයන ගීත, විශේෂයක් ලෙස රබන් ගී හැඳින්විය හැකි ය. මෙම කවි ගායනයත් සමග නර්තනයේ යෙදෙන බව සිසුන්ට පහදා දෙන්න. පහත සඳහන් ගීත දෙක ගායනය සඳහා යොදා ගන්න.

- අතකට ගෙන රබන් පොඩිය ගසති දිසි රුවින්
- සඳුන් කොකුම් මොර සුගාන
- උරතල කැල ඔඩිය ලෙන්ද

සාම්ප්‍රදායික නාදමලාවන් රැකෙන සේ, ගීත හා ස්වර ප්‍රස්තාරයද ගායනය කිරීමට කටයුතු සලසා ගන්න.

**පාඩම සංවර්ධනය** :

**පියවර 01**

රබන් කවියක් ගයමින් භූමිකා රංගනයක යෙදෙන්න. ඉදිරිපත් කළ රංගනය පිළිබඳ ව සිසුන් සමග සාකච්ඡාවක් මෙහෙයවන්න.

(මිනිත්තු 05)

**පියවර 02**

- දෘශ්‍යාධාරය මගින් ප්‍රදර්ශනය කරන පළමු ගීතය සිසුන්ට ශ්‍රවණය සඳහා ගායනය කර පෙන්වන්න.
- පාදයෙන් පාදය කිහිපවරක් ගීතයේ නාදමාලාව තහවුරු කිරීම සඳහා ගායනය කරවන්න.
- ස්වර ප්‍රස්තාරය ද පාදයෙන් පාදය ගායනය කරවන්න.
- නියමිත ලයට නිවැරදි ව ගායනය කරවන්න.
- දෙවැනි ගීතයේ දෘශ්‍යාධාරය ප්‍රදර්ශනය කර, පළමු ගීතය ඉගැන් වූ පිළිවෙලම මේ සඳහා අනුගමනය කරන්න.

(මිනිත්තු 35)

**පියවර 03**

- කණ්ඩායම් වශයෙන් ගීත 2 ක් ගායනය කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- සපයා ගත් රබාන සරලව වාදනයට යොමු කරන්න.
- ස්වර ප්‍රස්තාරය ද කණ්ඩායම් වශයෙන් ගායනය කිරීමට උපදෙස් දෙන්න.
- එක් කණ්ඩායමක් ගීතය ගයන විට අනෙක් කණ්ඩායමට ස්වර ප්‍රස්තාරය ගායනය කිරීමට උපදෙස් දෙන්න.

(මිනිත්තු 35)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

රබන් ගීත නිවැරදි ශ්‍රැතියට හා නිවැරදි නාදමාලාවට, කේවලව හා කණ්ඩායම් වශයෙන් ගායනය කළ සිසුන් කැඳවා අගය කරන්න.

(මිනිත්තු 05)

**පැවරුම:** රබන් ගීත එකතු කර බිත්ති පුවත්පතක් සකස් කිරීමට උපදෙස් දෙන්න.

**අතිරේක උදව්:** හෙළ ගී මග, වරම් ගී, 2008 - 7 ශ්‍රේණියේ ගුරුමාර්ගෝපදේශය

# දරු නැළවිලි ගී හා රබන් ගී පිළිබඳ තොරතුරු

**නිපුණතාව 4.0** : දේශීය ජන සංගීතාංග පිළිබඳ ප්‍රායෝගික හැකියා වර්ධනය කර ගනිමින්, සංස්කෘතික උරුමයන් රැක ගනියි.

**නිපුණතා මට්ටම 4.1** : ගැමි ගී පිළිබඳ සංස්කෘතික තොරතුරු විමසා ගායනය කරයි.

**ක්‍රියාකාරකම** : දරු නැළවිලි ගී හා රබන් ගී පිළිබඳ තොරතුරු

**කාලච්ඡේද සංඛ්‍යාව** : 01

**ඉගෙනුම් පල** :
- රබන් ගී හා දරු නැළවිලි ගී හඳුනා ගනිමින් විස්තර කරයි.
- දරු නැළවිලි ගී හා රබන් ගීවල සංස්කෘතික අගයන් විස්තර කරයි.

**ගුණාත්මක යෙදවුම්:** A4 කඩදාසි, පෑන්, සර්පිනාව, තාලම්පට, රබාන

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

දරු නැළවිලි ගී, රබන් ගී පිළිබඳව පහත දැක්වෙන ශීර්ෂ ඔස්සේ සාකච්ඡාවක් මෙහෙයවීම සැලසුම් කර ගන්න.

- දරු නැළවිලි ගී හා රබන් ගී නිර්වචනය කර කෙටි විස්තරයක් කිරීම
- නාද මාලා, පද මාලා, භාෂාව සහ රිද්මය පිළිබඳ විස්තර කිරීම
- දරු නැළවිලි ගී, රබන් ගී පිළිබඳව සුවිශේෂ ලක්ෂණ

මෙම සාකච්ඡාවට භාජනය කරගත් කරුණුවලින් ගී වර්ග දෙකම පිළිබඳ තොරතුරු ඇතුළත් කියවීම් පත්‍රිකාවක්, ගුරුවරයා සිසුන්ට සකස් කර දෙන්න. එම කියවීම් පත්‍රිකාව සිසුන්ට අධ්‍යයනය කිරීමට අවස්ථාව ලබා දී ඒ ඇසුරින් දැනුම මිනුම තරගයක් පැවැත්වීමට සූදානම් කරවන්න.

**පාඩම සංවර්ධනය** :

**පියවර 01**
- පෙර උගත් දරු නැළවිලි ගීතය හා රබන් ගීතය ගායනය කිරීමට සිසුන්ට උපදෙස් දෙන්න.
- ඒ පිළිබඳව කෙටි සාකච්ඡාවක් කරන්න.

(මිනිත්තු 05)

**පියවර 02**
- ගුරුවරයා සකස් කළ ගී වර්ග දෙකම විස්තර ඇතුළත් කියවීම් පත්‍රිකාව සිසුන්ට බෙදා දෙන්න.
- A හා B වශයෙන් කණ්ඩායම් දෙකකට බෙදා එක් කණ්ඩායමකට දරු නැළවිලි ගී පිළිබඳවත්, අනෙක් කණ්ඩායමකට රබන් ගී පිළිබඳවත් ප්‍රශ්න සකස් කරවීමට උපදෙස් දෙන්න. එක් කණ්ඩායමක් ප්‍රශ්න 10 ක් සකස් කිරීම ප්‍රමාණවත්ය. (A හා B කණ්ඩායම් දෙක සකස් කළ ප්‍රශ්න මාරු කරන්න.)
- කණ්ඩායම් දෙක සකස් කරගත්, ප්‍රශ්න මාලාව ඉදිරිපත් කර තරගය ආරම්භ කරන්න.
- ලකුණු සටහන් කිරීම ඔබ විසින් කරන්න.

(මිනිත්තු 25)

**පියවර 03**
- රබන් ගී හා දරු නැළවිලි ගී පිළිබඳ සටහනක් සිසුන් සමග ගොඩ නගන්න.

(මිනිත්තු 05)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- රබන් ගී හා දරු නැළවිලි ගී පිළිබඳ ව සකස් කළ ප්‍රශ්න අගයන්න.
- ජයග්‍රහණය කළ කණ්ඩායමට ඇගයීමක් කරන්න.

(මිනිත්තු 05)

**පසු වැඩ :** A හා B යන කණ්ඩායම් දෙකේ සිසුන් සකස් කළ ප්‍රශ්න සියල්ලම සිසු අභ්‍යාස පොතේ ලියා පිළිතුරු ලියා ගෙන ඒමට උපදෙස් දෙන්න.

**අතිරේක උදව් :**

නැළවිලි ගී - ආනන්ද ජයසිංහ
වරම් ගී - ආනන්ද ජයසිංහ
හෙළ ගී මග - ඩබ්ලිව්.බී. මකුලොලුව

# පද නිර්මාණය

**නිපුණතාව 7.0** : සංගීත නිර්මාණ කාර්යයේ අත්හදා බැලීම් කරයි.

**නිපුණතා මට්ටම 7.1 :** ගීයක සංගීත නිර්මාණයේ දී පද මාලාවේ වැදගත්කම වටහා ගනියි.

**ක්‍රියාකාරකම** : පද නිර්මාණය

**කාලච්ඡේද සංඛ්‍යාව :** 02

**ඉගෙනුම් පල** :
- පද බැඳීම් සඳහා සුදුසු විවිධ සංකල්පනා නම් කරයි.
- තම චින්තන හැකියාව යොදමින් එම සංකල්පනා ගී පද ලෙස නිර්මාණය කරයි.
- ගීතයකට උචිත ලෙස එම පදවැල් රිද්මයකට පෙළ ගසයි.
- එම පද වැලෙන් කියැවෙන අරුත වටහා ගනී.
- ගී පද නිර්මාණ රස විඳියි.

**ගුණාත්මක යෙදවුම්:**
- ගී පදමාලා ප්‍රදර්ශනය සඳහා අවශ්‍ය ලිපි ද්‍රව්‍ය
- ස්වර පුවරු සංගීත භාණ්ඩයක්
- ගීත සංකල්පනාවක් ගොඩ නැගිය හැකි ආකාරයේ චිත්‍රයක්
- 2008 වර්ෂයේ ක්‍රියාත්මක 7 වන ශ්‍රේණිය ගුරුමාර්ගෝපදේශ සංග්‍රහය පිටු අංක 141 හි කාර්ය පත්‍රිකාවේ පිටපත් අවශ්‍ය පරිදි

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

සංගීතය ඉගෙන ගන්නා සිසු/සිසුවියන් බොහෝ විට භාෂා ඇල්මෙන් යුතුව කටයුතු කරන, රසවින්දනයට කැමැත්තක් දක්වන පිරිසකි. ඔවුන්ගේ නිසග හැකියා මතු කරගෙන ඒවායින් අනාගතයේ දී තම බසට මෙන් ම සංගීතයටත් ප්‍රයෝජනවත් නිර්මාණ බිහි කර ගැනීමට මග සැලසුම් කිරීමට ඉතා සුදුසු පාඩමක් ලෙසට මේ පාඩම හඳුන්වා දිය හැකිය. ගී පද නිර්මාණය කර ගැනීමට පෙර සිසු ශ්‍රවණය සඳහා උචිත ගීත සමුච්ඡයක් නම් කර ඒවා භාවිතය සඳහා සූදානම් කරගත යුතුවේ. මෙහි දී 7 ශ්‍රේණියට ගැළපෙන ගීත කිහිපයක් පන්තියට ප්‍රදර්ශනය කළ හැකි පරිදි සූදානම් කරගත යුතුය. මෙහි දී සිසුන් නම් කරන ගීත අතරින් එක් ගීයක්වත් ඉදිරිපත් කිරීමට ගුරුවරයා වග බලා ගත යුතුය. මෙහි දී අත්වැලක් ලෙස 2008 වර්ෂයේ ක්‍රියාත්මක 7 වන ශ්‍රේණිය ගුරුමාර්ගෝපදේශ සංග්‍රහය පිටු අංක 141 හි කාර්ය පත්‍රිකාව යොදා ගන්න.

**පාඩම සංවර්ධනය :**

**පියවර 01**
- උචිත ගී පද මාලා පිළිබඳව සිසුන්ගේ අදහස් විමසන්න.
- එක් පද මාලාවක කොටසක් පන්තියට පෙනෙන පරිදි ප්‍රදර්ශනය කරන්න
- එහි පද කැටි ගැසී ඇති ආකාරය සිසුන් හා සාකච්ඡා කරන්න.
- එම ප්‍රචලිත පද වැළට සුදුසු තවත් පද කොටසක් සිසුන් හා එක්ව ඔබ ගොඩ නගන්න.
  - නිදසුන් ලෙස ''...හා හා හරි හාවා - කැලේ මැදින් ආවා - සිට ගෙන ගඟ ගාවා...'' මෙහි අවසන් පද පෙළට සිසුන්ගේ නිර්මාණාත්මක පද පේළි කිහිපයක් එක් කරන්න.
- ඒවා අගය කරන්න.

(මිනිත්තු 15)

**පියවර 02**

- පද මාලා සඳහා සුදුසු සංකල්පනා කිහිපයක් සිසුන් සමගින් තෝරා ගන්න.
- ඉන් එක් සංකල්පනාවක් සඳහා පළමු පදවැල නිර්මාණය කර ඉදිරිපත් කරන්න.
- ඉතිරි පදවැල් නිර්මාණය සඳහා සිසුන් පොළඹවන්න.
- ඒවා පන්තියට පෙනෙන පරිදි ප්‍රදර්ශනය කරන්න.

(මිනිත්තු 25)

**පියවර 03**

- කාර්ය පත්‍රිකා අංක 01 පන්තිය අතර බෙදා දී එම කාර්යයේ යොදවන්න.

(මිනිත්තු 35)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

නිර්මාණශීලීව ගී පද නිර්මාණය කළ සිසුන් තෝරා ඇගයීමක් කරන්න.

(මිනිත්තු 05)

**පැවරුම :** සිසුන් කැමති විවිධ තේමා අනුව, පදමාලා නිර්මාණය කර පොත් පිංචක් සකස් කිරීමට උපදෙස් දෙන්න.

**අතිරේක උදව් :** කාර්ය පත්‍රිකා අංක 1

- 2008 ගුරු මාර්ගෝදේශ සංග්‍රහය - 7 වන ශ්‍රේණිය පිටු අංක 141

# ළමා ගීත අගය සහ ගීතයේ ප්‍රබලතාවය

**නිපුණතාව 4.0** : සරල සංගීතය හා බැඳි සංගීතාංග පිළිබඳ අත්දැකීම් ලබයි.

**නිපුණතා මට්ටම 4.1 :** විද්‍යුත් මාධ්‍යයන්හි ප්‍රචලිත ළමා ගීත ගායන / වාදන

**ක්‍රියාකාරකම** : ළමා ගීත අගය සහ ගීතයේ ප්‍රබලතාවය

**කාලච්ඡේද** : 01

**ඉගෙනුම් පල** :
- ජන මාධ්‍ය මගින් හා ශ්‍රව්‍ය පට මගින් ඇසෙන ළමා ගීතවලට සවන් දෙයි.
- නිර්දේශිත ළමා ගීතය ගායනය කරයි.
- එම ගීතයෙන් ප්‍රකාශ වන අදහස පිළිබඳ ව සාකච්ඡා කරයි.
- ගීතයේ අදහසට ගැලපෙන නාද මාලාව සහ රිද්මයෙහි සරල බව අගය කරයි.
- එවැනි වෙනත් ළමා ගීත සෙවීමට පෙළඹේ.

**ගුණාත්මක යෙදවුම්:**
- ගීතය ඇතුළත් ශ්‍රව්‍ය පටය
- ස්වර වාද්‍ය භාණ්ඩයක්
- ගීතය ලියන ලද දෘශ්‍ය ආධාරකය

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

විද්‍යුත් මාධ්‍ය මගින් ප්‍රචාරය වන ළමා ගීත අතුරින් තෝරා ගත් ''අම්ම මාව දොයි කරන්න හදපු හැටි අගෙයි, '' නම් ගීතය ගායනයට පුහුණු කරවීම මෙම ක්‍රියාකාරකමෙන් අපේක්ෂා කෙරේ.

**පියවර 01**
- ගීතය ලියන ලද දෘශ්‍ය ආධාරකය ප්‍රදර්ශනය කරන්න.
- ගීතය ඇතුළත් ශ්‍රව්‍ය පටයට සවන් දීමට සලස්වන්න.
- එම ගීතය නැවත නැවත ශ්‍රවණයට යොමු කරවමින් සිසු අදහස් විමසන්න. (මිනිත්තු 05)

**පියවර 02**
- ගීතයෙහි නාද මාලාව, පද මාලාව (අදහස) රිද්මය පිළිබඳ ව සිසුන් සමග සාකච්ඡා කරන්න.
- ස්වර වාද්‍ය භාණ්ඩය උපයෝගි කර ගනිමින්, සිසුන් සමග ගීතය ගායනය කරන්න.
- කණ්ඩායම් වශයෙන් ගායනයට යොමු කරවමින් අතින් තාල් තබමින් ප්‍රසංගාත්මකව ගීතය ඉදිරිපත් කිරීමට අවස්ථාව සලස්වන්න. (මිනිත්තු 20)

**පියවර 03**
- වාදනය ද සමග සිසුන්ගේ අභිමතය පරිදි සාමුහික ව ගායනයට යොමු කරන්න. (මිනිත්තු 10)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

ඒකලව හෝ කණ්ඩායම් වශයෙන් ගීතය ගායනයට සලසා ඇගයීමක් කිරීමටත් මග පෙන්වන්න. (මිනිත්තු 05)

**පසුවැඩ :** මීට පෙර සකසා ඇති පොත් පිංච සංවර්ධනයට මග පෙන්වන්න. පාසලේ උත්සව අවස්ථාවන්හි දී ප්‍රාසංගික ව ඉදිරිපත් කිරීමට තනි ව පුහුණු වීමට උපදෙස් දෙන්න.

# උපදේශාත්මක ගීත රසාස්වාදය සහ ගායනය

**නිපුණතාව 1.0** : සංගීතයේ ශිල්පාංග හා සිද්ධාන්ත හඳුනා ගනිමින් ගායන / වාදන ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 1.1 :** සංගීත රසාස්වාදයේ යෙදෙමින් ජීවිතයේ සතුට හා බැඳී මානසික තත්ත්වයන් ළඟා කර ගැනීමට හුරු වෙයි.

**ක්‍රියාකාරකම** : උපදේශාත්මක ගීත රසාස්වාදය සහ ගායනය

**කාලච්ඡේද** : 02

**ඉගෙනුම් පල** :
- උපදේශාත්මක ගී පිළිබඳ ව අදහස් දක්වයි.
- උපදේශාත්මක ගීත ලැයිස්තු ගත කරයි.
- එම ගීත ගයන ගායක ගායිකාවන් නම් කරයි.
- උපදේශාත්මක ගීත ගායනයට කැමැත්තක් දක්වයි.
- එම ගීතවල පද මාලාවන් ප්‍රකාශ වන අදහස විස්තර කරයි.
- උපදේශාත්මක ගීතයක් දෙකක් ගායනය කරයි.

**ගුණාත්මක යෙදවුම් :**
- නිර්දේශිත ගීත ඇතුළත් ශ්‍රව්‍ය පට, දෘශ්‍ය ආධාරක, ස්වර වාද්‍ය භාණ්ඩයක්

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

මෙම කාලච්ඡේද 2 සඳහා පහත සඳහන් ගීත අතුරින් පළමු වාරයට තෝරා නොගත් සුදුසු ගීතයක් හෝ දෙකක් තෝරා ගෙන පළමු වාරයේ දී මෙන් ගායනයට හුරු කරන්න.
- නොමග නොයන් පුතේ
- අහන්න මගේ හොඳ පුංචි පුතේ
- දූ පුතුනේ රට අපේ ය
- කරුණාව සමග හොඳ හිත පතුරන්න සැම කෙරේ.
- දූඩි කළ මාතා පෙම්බර මාතා
- මව්පියො ආදී සොඳුරු තමාගේ
- හිතන්නකෝ අයියේ...
- සමන් වැලේ මල් ජයට පිපීලා......
- පාන්කිරිත්තා

**පාඩම සංවර්ධනය :**

**පියවර 01**
- තෝරා ගත් ගීත, ලියන ලද දෘශ්‍ය ආධාරකය ප්‍රදර්ශනය කරන්න.
- ගීත ඇතුළත් ශ්‍රව්‍ය පටය සිසුන්ට ශ්‍රවණයට යොමු කරන්න.
- ස්වර වාද්‍ය භාණ්ඩය ඇසුරෙන් ගීතය ගයා වයා දක්වන්න.

(මිනිත්තු 10)

**පියවර 02**
- දෘශ්‍ය ආධාරකය උපයෝගි කර ගනිමින් පළමු ගීතය සිසුන්ට ගායන කිරීමට අවස්ථාව සලස්වන්න.
- නැවත නැවත ගායනය කිරීමට අවස්ථාව සලසමින් ගීතයෙහි පදමාලාව පිළිබඳව සිසු අදහස් විමසන්න.

(මිනිත්තු 30)

**පියවර 03** • දෙවන ගීතය ද ඉහත සඳහන් ආකාරයට පුහුණු කරවන්න.

- නාද මාලාව තහවුරු වන තෙක් ගීතය ගායනයට පුහුණු කරවන්න.

(මිනිත්තු 30)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- උපදේශාත්මක ගීත පිළිබඳ ව අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාව දෙන්න.
- එම ගීතවල පද මාලාවෙන් ප්‍රකාශ වන අදහස් විස්තර කරන්න.
- උපදේශාත්මක ගීත නිවැරදි ව ගායනය කරන්න.
- වෙනත් උපදේශාත්මක ගීත සෙවීමට මග පෙන්වන්න.

(මිනිත්තු 10)

**පසුවැඩ** :

- පළමු වාරයේ දී සැකසූ පොත් පිංච සංවර්ධනය කරන්න.
- විවිධ ප්‍රසංග, උදෑසන රැස්වීම්, සාහිත්‍ය සමිති ආදී අවස්ථාවන්හි දී උපදේශාත්මක ගීත ප්‍රාසංගිකව ඉදිරිපත් කරන්න.

**අතිරේක උදව්** :

# නූර්ති ගීත ගායනය

**නිපුණතාව 6.0** : රංග සම්ප්‍රදායන්හි විශේෂතා අධ්‍යයනය කරමින්, සංගීතමය ලක්ෂණ පිළිබඳ ප්‍රායෝගික අත්දැකීම් ලබයි.

**නිපුණතා මට්ටම 6.2 :** නූර්ති ගීත ගායනය කරයි.

**ක්‍රියාකාරකම** : නූර්ති ගීත ගායනය

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල** :
- නූර්ති ගීත ගායනය කරයි.
- ප්‍රචලිත නූර්ති ගීත එකතු කරයි.
- නූර්ති ගීත ශ්‍රවණයට කිරීමට කැමැත්තක් දක්වයි.

**ගුණාත්මක යෙදවුම්:**
- ගීතය ලියූ දෘශ්‍යාධාරකය
- සර්පිනාව, තබ්ලාව, වයලීනය, බටනලාව

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

7 ශ්‍රේණියේ දී නූර්ති ගී තුනක් සිසුන්ට අධ්‍යයනය කිරීමට ඉඩ සැලසේ. මේ වන විට ''..අඹ දඹ නාරං, දන්න වං හුං අප...'' යන ගීත සිසුන් අධ්‍යයනය කර ඇත. මෙම පාඩමේ දී නීතිඥ චාල්ස් ඩයස් සූරීන්ගේ විදුර නූර්තියේ එන ''දම්වැසි වස්සන ලෝකේ'' ගීතය ඉගැන්වීම අපේක්ෂා කෙරේ. එම ගීතය පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න. නූර්ති ගී රාගධාරී සංගීතය ආශ්‍රයෙන් නිර්මිත ගීත විශේෂයක් නිසා පිළිබඳ සිසුන් තුළ ඇතිවන ඇල්ම එලදායී වේ.

**පාඩම සංවර්ධනය :**

**පියවර 01**
- I සහ II වන වාරවල දී ඉගෙන ගත් නූර්ති ගීත දෙක ගායනය කිරීමට අවස්ථාව ලබා දෙන්න.

(මිනිත්තු 05)

**පියවර 02**
- ''..දම්වැසි වස්සන....'' ගීතය ලියූ දෘශ්‍යාධාරකය ප්‍රදර්ශනය කරන්න.
- ගුරුවරයා ගීතය රසවත් ව ගායනය කරමින්, සිසුන්ට ශ්‍රවණය කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- ස්ථායී කොටස පාදයෙන් පාදය ගයා, නාදමාලාව තහවුරු වන තෙක් ගායනය කරවන්න.
- අන්තරා කොටස්වල නාදමාලා ද තහවුරු වන තෙක් ගායනය කරවන්න.

(මිනිත්තු 25)

**පියවර 03**
- කේවල ව හා කණ්ඩායම් කර ගීතය ගායනය කිරීමට සිසුන්ට අවස්ථාව ලබාදෙන්න.
- I වෙනි සහ II වාරවල උගත් නූර්ති ගීත දෙක ද අහඹු ලෙස ගායනය කිරීමට සිසුන්ට අවස්ථාව ලබාදෙන්න.
- සිසුන් ගීත ඉදිරිපත් කරන විට ගුරුවරයා වාදනයෙන් සහාය ලබා දෙන්න.
- නූර්ති ගීවල අගය සාකච්ඡා කරන්න. (මිනිත්තු 05)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

නිවැරදි ශ්‍රැතියට හා තාලානුකූලව මිහිරිව ගායනය කළ කණ්ඩායම හා තනි තනිව ගැයූ සිසු/සිසුවියන් තෝරා අගය කරන්න. (මිනිත්තු 05)

**පැවරුම:** වාර තුනේ දී ඔබ උගත් නූර්ති ගීත 3 ඇතුළත් කර නිර්මාණශීලීව බිත්ති පුවත්පතක් සකස් කරන්න.

**අතිරේක උදව්:** නූර්ති ගීත ශතකය (ලයනල් ගුණතිලක) / 8, 11 ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය

# ස්වර රටා වාදනය (ශුද්ධ ස්වර ස්ථාපන ගී)

**නිපුණතාව 2.0** : වාද්‍ය භාණ්ඩයන්හි ස්වරූපය වටහා ගනිමින් වාදන හැකියා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 2.1** : ස්වර පුවරු සංගීත භාණ්ඩ මගින් ක්‍රීඩාමය අත්දැකීම් ලබයි. වාදන කුසලතා වර්ධනය කර ගනී. (මෙලෝඩිකා, ග්ලොකන්ස්පිල්, විද්‍යුත් ඕගන් මවුත් ඕගන් (හාර්මෝනිකා) රෙකෝඩර් ප්ලූට්, හාර්මෝනියම් වැනි නිශ්චිත ස්වර පිහිටුවා ඇති භාණ්ඩ මගින් ස්වර රටා වාදනය)

**ක්‍රියාකාරකම** : ස්වර රටා වාදනය (ශුද්ධ ස්වර ස්ථාපන ගී)

**කාලච්ඡේද සංඛ්‍යාව** : 03

**ඉගෙනුම් පල** :
- සිසුවා විසින් සපයා ගත් භාණ්ඩය වාදනය කිරීමේ හැකියාව වර්ධනය කර ගනියි.
- නිවැරදි ස්වර කණට හුරුවෙයි.
- විවිධ රිද්ම රටා හඳුනා ගනියි.
- කණ්ඩායම් ක්‍රියාකාරකම්හි යෙදෙයි.
- ශුද්ධ ස්වර ස්ථාපන ගී වාදනය කරයි.

**ගුණාත්මක යෙදවුම්:**
- සිසුන් විසින් සපයා ගත් භාණ්ඩ
- ඔබ විසින් සැකසූ ශුද්ධ ස්වර ස්ථාපන ගී ඇතුළත් දෘශ්‍යාධාර

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

ස්වර රටා වාදනය කර ඇති සිසුන්ගේ හසුරු කුසලතාවන් වර්ධන වන ලෙස ශුද්ධ ස්වර ස්ථාපන ගී වාදනය කිරීම මෙම ක්‍රියාකාරකමින් අපේක්ෂිතය.

පාඩම සංවර්ධනය :

**පියවර 01**
- දෙවන වාරයේ දී වාදනය කළ ස්වර රටා නැවත වාදනය කරමින් පාඩමට පිවිසෙන්න.
- සදොස් තැන් නිදොස් කරමින් සතත අභ්‍යාසයේ වටිනාකම පහදා දෙන්න.

(මිනිත්තු 10)

**පියවර 02**
- ශුද්ධ ස්වර ස්ථාපන ඇතුළත් දෘශ්‍යාධාර සිසුන් අතට පත් කොට ක්‍රියාකාරමෙහි යොදවන්න.
- නිවැරදි ස්වර සාධනය : තාලානුකූල බව පවත්වා ගෙන යෑම හා වාද්‍ය භාණ්ඩයේ නිවැරදි ඉරියව් පවත්වා ගෙන යෑම සඳහා අවශ්‍ය උපදෙස් නිරතුරුව ලබා දෙන්න.

(මිනිත්තු 70)

**පියවර 03**
- සිසු සංඛ්‍යාව භාණ්ඩ අනුව කණ්ඩායම් කර හෝ තනි තනිව හෝ වාදනය කර පෙන්වීමට උපදෙස් දෙන්න.
- ඇගයීමට ලක් කර, සදොස් තැන් නිදොස් කරන්න.

(මිනිත්තු 30)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

ස්වර, තාල හා නිවැරදි ඉරියව් අනුව වාදනය කළ සිසුන් අගයන්න.

(මිනිත්තු 10)

පැවරුම: තාලානුකූලව ප්‍රස්තාර කළ ස්වර රටා, ශුද්ධ ස්වර ස්ථාපන ගී ලබා දී දිනපතා පුහුණු වීමට උපදෙස් දෙන්න.

අතිරේක උදව්: අභ්‍යාස හා ශුද්ධ ස්වර ස්ථාපන ගීත ප්‍රස්තාර සහිත පොත්

# තාලානුකූල ස්වර අභ්‍යාස වාදනය

**නිපුණතාව 2.0** : වාද්‍ය භාණ්ඩයන්හි ස්වරූපය වටහා ගනිමින් වාදන හැකියා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 2.1** : සම්භාව්‍ය සංගීත භාණ්ඩ වාදනයේ මූලික හැකියා වර්ධනය කර ගනියි.

**ක්‍රියාකාරකම** : තාලානුකූල ස්වර අභ්‍යාස වාදනය

**කාලච්ඡේද සංඛ්‍යාව** : 03

**ඉගෙනුම් පල** :
- ස්වර ප්‍රස්තාර කියවා වාදනය කරයි.
- නිවැරදිව ස්වර උත්පාදනය කරයි.
- තාලය පවත්වා ගනිමින් ස්වර අභ්‍යාස වාදනය කරයි.
- වාද්‍ය භාණ්ඩයේ නිවැරදි ඉරියව් පවත්වා ගෙන වාදනය කරයි.
- පාසලේ සියලු උත්සවයන් හි ඉදිරියෙන් සිටින සිසුවකු බවට පත් වෙයි.

**ගුණාත්මක යෙදවුම්**:
- තාලානුකූල ව ප්‍රස්තාර කළ කෝමළ ස්වර අභ්‍යාස ඇතුළත් දෘශ්‍යාධාර
- සිසුන් විසින් සපයා ගත් සංගීත භාණ්ඩ
- ගී අනුවාදන DVD/ CD තැටි (කෝමළ ග හා නි සහිත ගීතයක් නම් වඩාත් උචිතය.)

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

මෙම කාලච්ඡේදයට පැමිණෙන සිසුන් ශුද්ධ ස්වර වාදනයෙහි නිපුණතාවය ලබා සිටිය යුතුය. මෙම පාඩම තුළින් තාලානුකූල කෝමළ ස්වර අභ්‍යාස කිහිපයක් හා කෝමළ ස්වර සහිත ස්වර ස්ථාපන ගීතයක් වාදනය කරවීම අපේක්ෂිතය. පළමු කාලච්ඡේද දෙකෙහි ස්වර අභ්‍යාස වාදනය කරවා තෙවන කාලච්ඡේදයෙහි කෝමළ ග හා නි සහිත ස්වර ස්ථාපන ගීතයක් වාදනය කරවන පරිදි ක්‍රියාකාරකම සැලසුම් කරන්න. නිවැරදි ස්වර සාධනය; නිවැරදි ඉරියව් හා තාලානුකූලව වාදනය කිරීම යන කරුණු පිළිබඳව ඔබගේ අවධානය නිරතුරුව යොදන්න. (ගීතය සඳහා පොත පත කියවා ගීතය යොදා ගත හැක.)

**පාඩම සංවර්ධනය :**

**පියවර 01**
- ගී අනුවාදන ඇතුළත් DVD/ CD තැටි වාදනය කර නැරඹීමට සලස්වන්න. (පහසුකම් නොමැති විට ඔබ විසින් ගීතයක් වයා පෙන්වන්න.) ( කෝමළ ග හා නි සහිත ගීතයක් නම් වඩාත් උචිතය.)
- ගී අනුවාදන පිළිබඳව සිසුන් සමඟ සාකච්ඡා කරන්න.

(මිනිත්තු 10)

**පියවර 02**
- තාලානුකූලව ප්‍රස්තාර කළ කෝමළ ග හා නි සහිත ස්වර අභ්‍යාස ඇතුළත් දෘශ්‍යාධාර ලබා දී පුහුණු වීමට සලස්වන්න.
- නිවැරදි ස්වර සාධනය; තාලානුකූල බව පවත්වා ගෙන යෑම හා වාද්‍ය භාණ්ඩයේ නිවැරදි ඉරියව් පවත්වා ගෙන යෑම සඳහා අවශ්‍ය උපදෙස් නිරතුරුව ලබා දෙන්න.
- තෙවන කාලච්ඡේදයේ දී කෝමළ ග හා නි සහිත ස්වර ස්ථාපන ගීතයක් ලබා දී පුහුණු වීමට සලස්වන්න.

(මිනිත්තු 70)

**පියවර 03**
- සිසු සංඛ්‍යාව අනුව ගීත තනි තනිව හෝ කණ්ඩායම් කර වාදනය කර පෙන්වීමට උපදෙස් දෙන්න.
- අවශ්‍ය උපදෙස් සපයමින් අගයන්න.

(මිනිත්තු 30)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

ස්වර, තාල හා නිවැරදි ඉරියව් අනුව වාදනය කළ සිසුන් ඇගයීමට ලක් කරන්න.

(මිනිත්තු 10)

**පැවරුම:** තාලානුකූලව ප්‍රස්තාර කළ කෝමළ ග හා නි සහිත ස්වර අභ්‍යාස හා කෝමළ ග හා නි සහිත ස්වර ස්ථාපන ගීත ලබා දී දිනපතා පුහුණු වීමට උපදෙස් දෙන්න.

**අතිරේක උදව්:** අභ්‍යාස හා ගීත ප්‍රස්තාර සහිත පොත්

# කැමති භාණ්ඩයකින් නිර්දේශිත ගීතයක් වාදනය

**නිපුණතාව 2.0** : වාද්‍ය භාණ්ඩයන්හි ස්වරූපය වටහා ගනිමින් වාදන හැකියා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 2.1** : සම්භාව්‍ය සංගීත භාණ්ඩ වාදනයේ මූලික හැකියා වර්ධනය කර ගනියි.

**ක්‍රියාකාරකම** : කැමති භාණ්ඩයකින් නිර්දේශිත ගීතයක් වාදනය

**කාලච්ඡේද සංඛ්‍යාව** : 06

**ඉගෙනුම් පල** :
- ස්වර ප්‍රස්තාර කියවා වාදනය කරයි.
- තාලය පවත්වා ගනිමින් ගීත වාදනය කරයි.
- වාද්‍ය භාණ්ඩයේ නිවැරදි ඉරියව් පවත්වා ගනිමින් ගීත වාදනය කරයි.
- පාසලේ සියලු උත්සවයන්හි ඉදිරියෙන් සිටින සිසුවකු බවට පත් වෙයි.

**ගුණාත්මක යෙදවුම්:**
- කෝමළ ග හා නි යෙදෙන ගීතයක ප්‍රස්තාරයක් සහිත දෘශ්‍යාධාරයක්
- සිසුන් විසින් සපයා ගත් සංගීත භාණ්ඩ
- වාදනයක් ඇතුළත් DVD/ CD තැටි
- DVD plyer 1

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

නිවැරදි ස්වර සාධනය; නිවැරදි ඉරියව් හා තාලානුකූලව වාදනය කිරීම යන කරුණු පිළිබඳව සැලකිලිමත්ව කෝමළ ග හා නි සහිත ගීත වාදනය කරවීම මෙම පාඩමින් අපේක්ෂිතය. කාලච්ඡේද 06 තුළ ගීත දෙකක් වාදනය කරවන්න. එක් ගීතයක් සඳහා කාලච්ඡේද තුන බැගින් යොදා ගත හැකිවන පරිදි ක්‍රියාකාරකම සකසන්න.

**පාඩම සංවර්ධනය :**

**පියවර 01**
- වාදන ඇතුළත් DVD/ CD තැටි වාදනය කර නැරඹීමට සලස්වන්න. (පහසුකම් නොමැති නම් ඔබ විසින් ගීතයක් වයා පෙන්වන්න.)
- එම වාදනය පිළිබඳව සිසුන් සමග සාකච්ඡා කරන්න.
- වාදනය පුහුණුවීම සඳහා කැපවිය යුතු අයුරු පහදන්න.
- වාදකයකු සතු වෘත්තීය වටිනාකම පිළිබඳව ලුහුඬින් සාකච්ඡා කරන්න. (මිනිත්තු 10)

**පියවර 02**
- තෝරා ගත් පළමු ගීතය පළමු කාලච්ඡේද තුන තුළ ලබා දී වාදනයට යොමු කරන්න.
- තෝරා ගත් දෙවන ගීතය දෙවන කාලච්ඡේද තුන තුළ ලබා දී වාදනයට යොමු කරන්න.
- නිවැරදි ස්වර සාධනය; තාලානුකූල බව පවත්වා ගෙන යැම හා වාද්‍ය භාණ්ඩයේ නිවැරදි ඉරියව් පවත්වා ගෙන යැම සඳහා අවශ්‍ය උපදෙස් නිරතුරුව ලබා දෙන්න. (මිනිත්තු 150)

**පියවර 03**
- තනි තනිව හෝ භාණ්ඩ අනුව කණ්ඩායම් කර හෝ වාදනය කර පෙන්වීමට සලස්වන්න. අවශ්‍ය උපදෙස් සපයා දෙමින් අගයන්න. (මිනිත්තු 40)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

ස්වර ස්ථාන, තාල හා නිවැරදි ඉරියව් අනුව වාදනය කළ සිසුන් අගයන්න.

(මිනිත්තු 40)

**පැවරුම:** කෝමළ ග හා නි සහිත ගීත කීපයක් ලබා දී දිනපතා පුහුණු වීමට උපදෙස් දෙන්න.

**අතිරේක උදව්:** අභ්‍යාස හා ගීත ප්‍රස්තාර සහිත පොත්

# දැල් ගී ගායනය සහ දැල් ගී පිළිබඳ තොරතුරු

**නිපුණතාව 4.0** : දේශීය ජන සංගීතාංග පිළිබඳ ප්‍රායෝගික හැකියා වර්ධනය කර ගනිමින්, සංස්කෘතික උරුමයන් රැක ගනියි.

**නිපුණතා මට්ටම 4.1** : ගැමි ගී පිළිබඳ සංස්කෘතික තොරතුරු විමසා ගායනය කරයි.

**ක්‍රියාකාරකම** : දැල් ගී ගායනය සහ දැල් ගී පිළිබඳ තොරතුරු

**කාලච්ඡේද** : 02

**ඉගෙනුම් පල** :
- දැල් ගීත ගායනය කරයි.
- දැල් ගීත පිළිබඳ තොරතුරු අවබෝධ කර ගනියි.

**ගුණාත්මක යෙදවුම්**:
- ගීත ලියූ දෘශ්‍යාධාර
- සර්පිනාව, දවුලක්, තාලම්පොටක්

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස්** :

ධීවරයන් විසින් දැල් ඇදීමේ දී ගායනා කරන ගීත විශේෂයක් බවත්, ඔරුව මුහුදට තල්ලු කිරීමේ දී, දැල ගොඩට ඇදීමේ දී, සාමූහිකව ගායනා කරන ගීත විශේෂයක් බව සිසුන්ට පහදා දෙන්න.

සියලු දෙනාගේම ශක්තිය, එකවර යොදා ගැනීමට අර්ථ විරහිත පද ද යොදා ගැනේ. දැල් ගීවල භාෂාව, නාද මාලාව, රිද්මය හා විශේෂ ලක්ෂණ පිළිබඳවත් සාකච්ඡාවක් කරන්න.

පහත සඳහන් ගීත දෙක ගායනය සඳහා යොදා ගන්න.
- ඒ ආලේ හෙලෙයි ලෝ - මණ්ණඩිරාලෙ හෙලෙයිලෝ
- සන්තානම් පල්ලි යන්න - ලේලකඩි ලේලෝ

**පාඩම සංවර්ධනය** :

**පියවර 01**
- දැල් අදින අවස්ථාවක් සාමූහිකව නිරූපණය කිරීමට පන්තියේ සිසුන්ට අවස්ථාව ලබා දෙන්න. එම අවස්ථාව පිළිබඳව සාකච්ඡාවක් මෙහෙයවන්න. (මිනිත්තු 10)

**පියවර 02**
- ගීතය ලියූ දෘශ්‍ය උපකරණය ප්‍රදර්ශනය කරන්න.
- ගුරුවරයා ගීතය කිහිප වරක් ගායනා කර, සිසුන්ට ශ්‍රවණය කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- පාදයෙන් පාදය ගීතය ගායනය කරවන්න.
- නාද මාලාව ගුරුවරයා වයන විට, එයට අදාළ වචන ගායනා කිරීමට අවස්ථාව ලබා දෙන්න. (මිනිත්තු 30)

**පියවර 03**
- කණ්ඩායම් වශයෙන් ගීතය ගායනය කරවන්න.
- රංගයනයත් සමග දැල් ගී ගායනයට අවස්ථාව ලබා දෙන්න.
- සාමූහිකව ගීතය ගැයීමට අවස්ථාව ලබා දෙන්න.
- දැල් ගී පිළිබඳව සටහනක් සිසුන් ලවා පිළියෙල කරවන්න.

(මිනිත්තු 30)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්** :

නිවැරදි ශ්‍රැතියට, නිවැරදි නාදමාලාව, ගායනය හා රංගනයත් සමග ඉදිරිපත් කළ කණ්ඩායම් අගය කරන්න. (මිනිත්තු 10)

**පැවරුම**: දැල් ගී සමග එහි සංස්කෘතික පසුබිම පිළිබඳව පොත් පිංචක් සකස් කිරීමට උපදෙස් දෙන්න.

**අතිරේක උදව්**: වරම් ගී - ආනන්ද ජයසිංහ - පිටු අංක 39-42

# පදමාලා නිර්මාණය

**නිපුණතාව 7.0** : සංගීත නිර්මාණ කාර්යයේ අත්හදා බැලීම් කරයි.

**නිපුණතා මට්ටම 7.1** : ගීයක සංගීත නිර්මාණයේ දී පදමාලාවේ වැදගත්කම වටහා ගනියි

**ක්‍රියාකාරකම** : පදමාලා නිර්මාණය

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල** :
- ගීතයක් සඳහා සුදුසු රිද්ම රටා තෝරා ගනියි.
- ගැළපෙන රිද්මයකට පද නිර්මාණය කරයි.
- නිර්මාණය කරගත් පදවැල නිවැරදිව ප්‍රස්තාර කරයි.
- ගුරුවරයා සමග ගායනය කරමින් රස විඳියි.

**ගුණාත්මක යෙදවුම්:**
- දෘශ්‍ය උපකරණය අංක 01 (ළමා ගීතයක්)
- රිද්ම රටා එකතුව
- ස්වර පුවරු සංගීත භාණ්ඩයක්
- ඇමුණුමේ සඳහන් කාර්ය පත්‍රිකාවේ පිටපත් අවශ්‍ය පරිදි

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

28 වන ක්‍රියාකාරකමේ දී ද ගීපද නිර්මාණය සඳහා මග පෙන්වා ඇත. තෝරාගත් මාතෘකාවකට කිසියම් සංකල්පනාවකට ගීතාත්මක පද බැඳීම් කිරීමේ හුරුව සහ උපදෙස් ලබා දීම මේ පාඩමේ දී ද, අපේක්ෂිත වේ. සුදුසු රිද්ම රටා කිහිපයක් තෝරා ගන්න. පද නිර්මාණය සඳහා සිසුන්ට මග පෙන්වීම සහ උපදෙස් දීම සඳහා ගුරුවරයා සූදානම් වන්න. මේ පාඩම සඳහා ඇමුණුමේ සඳහන් කාර්ය පත්‍රිකාව ප්‍රයෝජනයට ගැනීම සුදුසු වේ.

පාඩම සංවර්ධනය :

පියවර 01
- දෘශ්‍ය උපකරණය අංක 1 අනුව සිසුන් සමග සාකච්ඡාවක් මෙහෙයවන්න. (මිනිත්තු 10)

පියවර 02
- පන්තියේ සිසුන් සඳහා අවශ්‍ය ප්‍රමාණයට කාර්ය පත්‍රිකාවේ පිටපත් ලබා දෙන්න.
- දී ඇති පියවර ක්‍රමය ක්‍රියාත්මක කරන්න.
- කාර්ය පත්‍රිකාවේ සඳහන් ''ල'' අක්ෂරය සහිත කොටසට ගැළපෙන පද සිසුන් ලවා නිර්මාණය කරවන්න.
- කාර්ය පත්‍රිකා අංක 2 හි සඳහන් ක්‍රියාකාරකමෙහි යෙදෙන්න.
- සිසුන් සමග ගායනයේ යෙදෙන්න. (මිනිත්තු 30)

පියවර 03
- නිර්මාණය කළ ගීත කණ්ඩායම් වශයෙන් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- වඩාත් සුදුසු ගීතයක් හෝ දෙකක් තෝරා ගෙන ගුරුවරයා විසින් සුදුසු තනුවක් යොදා ගායනය කරන්න.
- සිසුන් සමග ද ගායනයේ යෙදෙන්න. (මිනිත්තු 30)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**
- වඩාත් රසවත් ගීත නිර්මාණය කළ කණ්ඩායම සිසුන් සමග එක්ව අගයන්න.
- එය පන්තියේ ප්‍රදර්ශනය කළ හැකි පරිදි දෘශ්‍යාධාරකයක් ලෙසට පිළියෙළ කරන්න. (මිනිත්තු 10)

පැවරුම : තමන් කැමති මාතෘකාවක ගී පද මාලා රචනයේ යෙදීමට සිසුන් පොළඹවන්න.

**දෘශ්‍ය උපකරණය අංක 01**

ගුරුවරයාගේ අභිමතය පරිදි
තෝරාගත් ළමා ගීතයක පදමාලාව

**කාර්ය පත්‍රිකාව 01**

පහත දැක්වෙන රිද්ම රටා ගුරුතුමා සමග තාලානුකූලව කියන්න. (මාත්‍රා 2, 3 හෝ 4 රිද්ම රටා මතුවන ආකාරයෙන් සුදුසු රිද්ම රටා යොදා ගනිමින් කියන්න)

(අ) ලලලල ලාලල ලාලල ලා.......
ලල්ලල ලාලල ලලලල් ලා.......
ලාලල ලාලා ලාලල ලාලල
ලලල ලල්ලල ලා.......

(ආ) ලල්ල ලලල ලාල ලා - ලල්ල ලලල ලා.......
ලාල ලාල ලල්ල ලාල - ලලල ලාල ලා.......

**කාර්ය පත්‍රිකාව 02**

**1 පියවර**

පහත දැක්වෙන මාතෘකා අතරින් එකක් ඔබ කණ්ඩායමට තෝරා ගන්න. (ඔබ කණ්ඩායමට අයත් මාතෘකාව ගුරුතුමා විසින් ලබා දෙනවා ඇත)

වැස්ස
සුළඟ
මුහුද
අහස
හඳ
තරු

සුදුසු රිද්ම රටාවක් මත ගී පද රචනයක් නිර්මාණය කරන්න.

**2 පියවර**

කණ්ඩායම් විසින් නිර්මාණය කළ ගී අතරින් වඩාත් සාර්ථක ගීතය හෝ දෙක තෝරා ගෙන ගුරුතුමා සමග තනුවක් නිර්මාණය කරන්න. මුළු පන්තියම එක්ව ඒවා ගායනය කරන්න.

# වාර්ෂික විවිධ ප්‍රසංගය

**නිපුණතාව 3.0** : සංගීතයේ මූලිකාංග, ශිල්පාංග සහ සිද්ධාන්ත හඳුනා ගනිමින් ගායන වාදන හා ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 3.1** : සංගීත නිර්මාණ කාර්යයේ අත්හදා බැලීම් කරයි.

**ක්‍රියාකාරකම** : වාර්ෂික විවිධ ප්‍රසංගය

**කාලච්ඡේද සංඛ්‍යාව** : 06

**ගුණාත්මක යෙදවුම්:**

- එක් එක් ප්‍රසංග අංකයට ගැළපෙන ලෙස සකස් කර ගත් ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ
- වාද්‍ය භාණ්ඩ

**ඉගෙනුම් පල** :

- ප්‍රාසංගික අත්දැකීම් ලබමින් සතුටු වෙයි.
- සංගීතය විෂය ඉගෙනීමෙන් තෘප්තිමත් වෙයි.
- වේදිකාව පරිහරණය පිළිබඳ අත්දැකීම් ලබයි.
- විවිධ පෞරුෂ ගුණාංග වර්ධනය කර ගනියි.
- ගායන වාදන තනිව ඉදිරිපත් කිරීමට පෙළඹෙයි.

**ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස් :**

පාසල් වේදිකාවේ ප්‍රාසංගික අවස්ථාවකට සහභාගි වීමට සිසුහු කැමැත්තක් දක්වති. එයින් ඔවුන් තුළ පෞරුෂ ගුණාංග රාශියක් වර්ධනය වනු ඇත එබැවින් සෑම විටම විශේෂ තෝරා ගැනීමක් නොකර සියලු ම සිසුන්ට ද සහභාගි වීමට අවස්ථාව ලැබෙන පරිදි පාසල් විවිධ ප්‍රසංගය සැලසුම් කර ගැනීම ගුරුවරයාගේ වගකීමකි. පාසල පදනම් කරගත් ඇගයීම් වැඩසටහනට ගැළපෙන ලෙස කණ්ඩායම් ක්‍රියාකාරකමක් ලෙස ලකුණු පිරිනැමීමක් ද කළ හැකිය. මෙහි දී මහා පරිමාණයේ විවිධ ප්‍රසංගයක් පැවැත්වීමම අරමුණු කර නැත. එබැවින් පහත දැක්වෙන කරුණු ඔබට මේ සඳහා උපකාර වනු ඇත.

- ශ්‍රේණි මට්ටමින් වෙන වෙනම විවිධ ප්‍රසංගය පැවැත්වීම හෝ සියලු පන්ති සහභාගි කරගනිමින් එක් විවිධ ප්‍රසංගයක් පාසල තුළ පැවැත්වීම.
- වේදිකාවේ ප්‍රාසංගික අත්දැකීම් ලැබෙන පරිදි අවම වශයෙන් පාසල් නිල ඇඳුමින් හෝ ගායන, වාදන, රංගන අයිතමවලට සිසුන්ට ඉදිරිපත් වීමට අවස්ථාව ලබාදීම.
- කාලය, ඉඩකඩ, පහසුකම් ප්‍රමාණවත් පරිදි වර්ෂය තුළ ලබාගත නොහැකි වූයේ නම් පාසල තුළ ඉඩකඩ ඇති ස්ථානයක අනෙක් ගුරු භවතුන් සහ දෙමාපියන් ඉදිරියේ කේවල සහ සාමූහික ප්‍රසංග ලෙස කෙටි සංදර්ශනයක් පවත්වා සිසුන් අගය කිරීම සහ ධෛර්යමත් කිරීම කළ හැකිය. සුදුසු පරිදි ළමුන් ප්‍රාසංගික අත්දැකීම් ලැබෙන අයුරින් මෙම විවිධ ප්‍රසංගය සැලසුම් කිරීමට උත්සාහ කරන්න.
- කාලච්ඡේද 6ක් යනු සති දෙකක කාලයකි. 6 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා කාලච්ඡේද 6 බැගින් වෙන් කර ඇත. සිසුන් පන්ති කාමරයේ දී උගත් සංගීතමය ප්‍රායෝගික අංග ඇසුරින් කිසියම් තේමාවකට ගැළපෙන ලෙස කණ්ඩායම් වශයෙන් හෝ ඒකල ව වේදිකාවේ රඟ දැක්වීමට සුදුසු

ගායන, වාදන, නාට්‍ය අංග කණ්ඩායම වශයෙන් පුහුණු කරගැනීමටත්, විවිධ ප්‍රසංගය සැලසුම් කිරීමටත් මෙම කාලච්ඡේද 06 යොදා ගැනේ. වැඩි පිරිසක් යොදා ගැනීම වඩාත් සුදුසුය. පහත දක්වෙන කරුණු පිළිබඳ ගුරුවරයා සැලකිලිමත් විය යුතු වේ.

- උපරි ම අන්දමින් පැය දෙකහමාරක පමණ කාලයකට ගැළපෙන ලෙස ප්‍රසංගය සඳහා තෝරා ගන්නා අයිතම ලැයිස්තුවක් පිළියෙළ කිරීම.
- පන්ති කාමරයේ අධ්‍යයනය කළ ප්‍රායෝගික ක්‍රියාකාරකම්වලට මුල් තැනක් ලබා දීම.
- බාහිර සම්පත් පුද්ගලයන් සහභාගි කර නොගෙන පාසලේ සිසු - ගුරු සම්පත්වලින් පමණක් සරලව ප්‍රසංගය පැවැත්වීම.
- සරල අයිතමවලින් ආරම්භ කිරීම.
- පාසල් වේදිකාව භාවිත කරන්නේ නම් ඒ සඳහා සුදුසු සැලසුමක් පිළියෙළ කර කණ්ඩායම් සඳහා වැඩ බෙදීම.
- ප්‍රේක්ෂක පිරිස පිළිබඳ අවධානය යොමු කිරීම.

එක් එක් ශ්‍රේණියට ගැළපෙන ලෙස පන්ති කාමරයේ අධ්‍යයනය කළ කොටස් ඇසුරින් ප්‍රසංග අංක සැකසීම යන කාරණය පිළිබඳ වැටහීමක් ලබා ගැනීමට පහත දැක්වෙන ක්‍රියාකාරකම් ඔබට මග පෙන්වනු ඇත.

**තාලානුකූල ස්වර අභ්‍යාස ඇසුරින් ප්‍රසංගාත්මක අයිතමයක්**

ලය සහ තාලය පිළිබඳ සැලකිලිමත් වෙමින් පහත දක්වෙන ස්වර බණ්ඩය අධ්‍යයනය කර සිසුන් ලවා ගායනය කරවන්න.

ස + + + / + + + + /ස + + + / + + + + /

ස + + + / ස + + + / ස + + + / ස + + + /

ස + ස + / ස + ස + / ස ස ස ස /සස සස සස සස /

ස ස ස ස /ස රි ග -/ රි රි රි රි /රි ග ම -/

ග ග ග ග /ග ම ප - / ප ම ග රි / ස - - - /

පස් - ප ස් -/- - - - / පස් - ප ස් - / - - - - /

ස+ ස+ ස+ සග / ස+ සග ස+ සග / රි+ රි+ රි+ රිම / රි+ රිම රි+ රිම/

ග+ ග+ ග+ ගප / ග+ ගප ග+ ගප/ පප පප ස් - / - - - - /

ග ග ග රි / ස - ස රි / ග ග ග රි / ස - - - /

ප ප ප ම / ග - ග ම / ප ප ප ම / ස - - - /

ග - ම - / ප - ධ - / නි - - - / ස් - - - /

ග - ම - / ප - - - / නි - - - / ස් - - - /

පස - ප ස - / - - - - / පස - ප ස - / - - - - /

මෙවැනි ස්වර බණ්ඩ තවදුරටත් ඔබට නිර්මාණය කර ගත හැකි වේ. ස්වර අභ්‍යාස වුවත් මෙහි රිද්මය දුම්රියක ගති ලක්ෂණ මතු කරන බව ඔබට පෙනෙනු ඇත. මේ ආකාරයෙන් පන්ති කාමරයේ අධ්‍යයනය කළ

ක්‍රියාකාරකම් තවදුරටත් දීර්ඝ වන ලෙස නිර්මාණාත්මකව ඉදිරිපත් කිරීම විවිධ ප්‍රසංගය යන පාඩමින් අපේක්ෂිතය. එක් එක් පන්තියේ ක්‍රියාකාරකම් වෙනත් අයුරකින් ඉදිරිපත් කිරීමට ගුරුවරයා වශයෙන් ඔබගේ නිර්මාණශීලී බව හේතු වේ. මෙසේ නොවූව ද පන්තියේ ඉගෙන ගත් ප්‍රායෝගික කොටසක් වුව ද ප්‍රසංගාත්මකව ඉදිරිපත් කළ හැකිය.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය :**

**පියවර 1**
- විවිධ ප්‍රසංගයකට ඉදිරිපත් වීමෙන් ශිෂ්‍යයාට ලැබෙන වාසි පිළිබඳව සාකච්ඡා කරන්න. (මිනිත්තු 10)

**පියවර 2**
- තෝරාගත් අයිතම පුහුණු කරන්න. (මිනිත්තු 30)
- තෝරාගත් අයිතම පුහුණු කරන්න. (මිනිත්තු 40)

**පියවර 3**
- කණ්ඩායම් වශයෙන් හෝ කේවලව වේදිකාවේ හෝ පන්ති කාමරයේ සලස්වන්න. (මිනිත්තු 40)
- ස්වර නියමිත නාදස්ථාන අනුව ගායනයට යොමු කරන්න. (මිනිත්තු 40)
- මෙම පන්තියට යෝජිත කොටසේ සමස්ත නිමාව ඉදිරිපත් කර අගයන්න. (මිනිත්තු 30)

**ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

කණ්ඩායම් ලෙස හෝ කේවලව අගය කර ලකුණු ප්‍රදානය කරන්න. (මිනිත්තු 10)

**පසු වැඩ :**
- විවිධ ප්‍රසංගයක දී ඉටු කළ යුතු වැඩ කොටස් ලැයිස්තුවක් සිසුන් ලවා පිළියෙළ කරවන්න.
- මෙවැනි ප්‍රසංගයක් සාර්ථකව ඉදිරිපත් කිරීමට තවදුරටත් කළ යුතු සංවිධානාත්මක වැඩ කණ්ඩායම් වශයෙන් සාකච්ඡා කරන්න.

**අතිරේක උදව් :** 2007 - 6 ශ්‍රේණිය ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය